# ලොවුතුරු
# බුද්ධ වන්දනා

**ධර්ම දානය පිණිසයි!**

# ලොවුතුරු
# බුද්ධ වන්දනා

**එවඤ්ච බො, තථාගතා වන්දිතබ්බා**
**තථාගතයන් වහන්සේට වන්දනා කළයුත්තේ මෙසේ ය.**

සම්පාදනය

**මාපලගම සුසිලවංශ හිමි**

ලොවුතුරු බුද්ධ වන්දනා

© මාපලගම සුසීලවංශ හිමි


| | |
|---|---|
| 01 මුද්‍රණය : **2021 පෙබරවාරි** | 21 මුද්‍රණය : **2021 අප්‍රේල්** |
| 02 මුද්‍රණය : **2021 මාර්තු** | 22 මුද්‍රණය : **2021 අප්‍රේල්** |
| 03 මුද්‍රණය : **2021 මාර්තු** | 23 මුද්‍රණය : **2021 අප්‍රේල්** |
| 04 මුද්‍රණය : **2021 මාර්තු** | 24 මුද්‍රණය : **2021 අප්‍රේල්** |
| 05 මුද්‍රණය : **2021 මාර්තු** | 25 මුද්‍රණය : **2021 අප්‍රේල්** |
| 06 මුද්‍රණය : **2021 මාර්තු** | 26 මුද්‍රණය : **2021 අප්‍රේල්** |
| 07 මුද්‍රණය : **2021 මාර්තු** | 27 මුද්‍රණය : **2021 අප්‍රේල්** |
| 08 මුද්‍රණය : **2021 මාර්තු** | 28 මුද්‍රණය : **2021 අප්‍රේල්** |
| 09 මුද්‍රණය : **2021 මාර්තු** | 29 මුද්‍රණය : **2021 අප්‍රේල්** |
| 10 මුද්‍රණය : **2021 මාර්තු** | 30 මුද්‍රණය : **2021 අප්‍රේල්** |
| 11 මුද්‍රණය : **2021 මාර්තු** | 31 මුද්‍රණය : **2021 අප්‍රේල්** |
| 12 මුද්‍රණය : **2021 මාර්තු** | 32 මුද්‍රණය : **2021 අප්‍රේල්** |
| 13 මුද්‍රණය : **2021 මාර්තු** | 33 මුද්‍රණය : **2021 අප්‍රේල්** |
| 14 මුද්‍රණය : **2021 මාර්තු** | 34 මුද්‍රණය : **2021 අප්‍රේල්** |
| 15 මුද්‍රණය : **2021 මාර්තු** | 35 මුද්‍රණය : **2021 අප්‍රේල්** |
| 16 මුද්‍රණය : **2021 මාර්තු** | 36 මුද්‍රණය : **2021 අප්‍රේල්** |
| 17 මුද්‍රණය : **2021 මාර්තු** | 37 මුද්‍රණය : **2021 අප්‍රේල්** |
| 18 මුද්‍රණය : **2021 මාර්තු** | 38 මුද්‍රණය : **2021 අප්‍රේල්** |
| 19 මුද්‍රණය : **2021 මාර්තු** | 39 මුද්‍රණය : **2021 අප්‍රේල්** |
| 20 මුද්‍රණය : **2021 මාර්තු** | 40 මුද්‍රණය : **2021 අප්‍රේල්** |

**සංශෝධිත නව මුද්‍රණය**

41 මුද්‍රණය : 2021 මැයි

**ISBN: 978-624-204-012-7**

පිටු සැකසුම

**ෆාස්ට් ඇඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

කවර නිර්මාණය

**ප්‍රේම් දිසානායක**

මුද්‍රණය

**ෆාස්ට් ප්‍රින්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්**

165, දේවානම්පියතිස්ස මාවත, කොළඹ 10

# සද්ධර්මය පිළිපැදීම සැබෑ බුද්ධ පූජාව වන්නේ ය

"සබ්බඵාලිඵුල්ලා බො, ආනන්ද, යමකසාලා අකාලපුප්ඵෙහි. තෙ තථාගතස්ස සරීරං ඔකිරන්ති අජ්ඣොකිරන්ති අභිප්පකිරන්ති තථාගතස්ස පූජාය. දිබ්බානිපි මන්දාරවපුප්ඵානි අන්තලික්ඛා පපතන්ති, තානි තථාගතස්ස සරීරං ඔකිරන්ති අජ්ඣොකිරන්ති අභිප්පකිරන්ති තථාගතස්ස පූජාය. දිබ්බානිපි චන්දනචුණ්ණානි අන්තලික්ඛා පපතන්ති, තානි තථාගතස්ස සරීරං ඔකිරන්ති අජ්ඣොකිරන්ති අභිප්පකිරන්ති තථාගතස්ස පූජාය. දිබ්බානිපි තුරියානි අන්තලික්ඛෙ වජ්ජන්ති තථාගතස්ස පූජාය. දිබ්බානිපි සඞ්ගීතානි අන්තලික්ඛෙ වත්තන්ති තථාගතස්ස පූජාය. න බො, ආනන්ද, එත්තාවතා තථාගතො සක්කතො වා හොති ගරුකතො වා මානිතො වා පූජිතො වා අපචිතො වා. යො බො, ආනන්ද, භික්ඛු වා භික්ඛුනී වා උපාසකො වා උපාසිකා වා ධම්මානුධම්මපටිපන්නෝ විහරති සාමීචිපටිපන්නො අනුධම්මචාරී, සො තථාගතං සක්කරොති ගරුකරොති මානෙති පූජෙති අපචියති පරමාය පූජාය. තස්මාතිහානන්ද, ධම්මානුධම්මපටිපන්නා විහරිස්සාම සාමීචිපටිපන්නා අනුධම්මචාරිනොති. එවඤ්හි වො, ආනන්ද, සික්ඛිතබ්බන්ති.

"ආනන්දය, සල්ගස් දෙදෙන අකාලයට පිපුන මල්වලින් ගැවසී ගත්හ. ඒ ගස් තථාගතයන් වහන්සේට පූජා පිණිස තථාගතයන් වහන්සේගේ ශරීරය මත මල් වගුරුවන්නාහුය. බොහෝ සෙයින්ම මල් අතුළාක් මෙන් වගුරුවන්නාහුය. දිව්‍යමය පරසතු මදාරා මල්ද අහසින් වැටෙන්නාහුය. තථාගතයන් වහන්සේගේ ශරීරය මත විසුරුවන්නාහුය. බොහෝ සෙයින් මල් අතුළාක් මෙන් වගුරුවන්නාහුය. නිරන්තරයෙන් නැවත නැවත වගුරු වන්නාහුය. තථාගතයන් වහන්සේට පූජා පිණිස දිව්‍යමය වූ සඳුන් කුඩුද අහසින් වැටෙන්නාහුය. ඒ දිව්‍ය සඳුන් කුඩුද තථාගතයන් වහන්සේගේ

ශරීරය මත වැගිරෙන්නාහුය. බොහෝ සෙයින්ම සඳුන් සුණු අතුළාක් මෙන් වගුරුවන්නාහුය. නිරන්තරයෙන්ම නැවත නැවත වගුරුවන්නාහුය. තථාගතයන් වහන්සේට පූජා පිණිස දිව්‍යමය ගීතිකාද අහසෙහි පවත්නාහුය. ආනන්දය, මෙතෙක් වූ පූජාවෙන් තථාගත තෙම සත්කාර කරන ලද්දේ නම් නොවන්නේය. ගරු කරන ලද්දේද නොවන්නේය. සිතින් බුහුමන් කරන ලද්දේත් නොවන්නේය. පූජා කරන ලද්දේත් නොවන්නේය. උපස්ථාන කිරීම් වශයෙන් පුදන ලද්දේත් නොවන්නේය. ආනන්දය, යම්කිසි භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ උපාසකයෙක් හෝ උපාසිකාවක් හෝ නව විධ වූ ලෝකෝත්තර ධර්මයට අනුව පිළිපදිමින් වාසය කරන්නේ වේද, සුදුසු මාර්ගයෙහි ධර්මයට අනුකූලව හැසිරෙන්නේ වේද, ඒ පුද්ගල තෙම තථාගතයන් වහන්සේට සත්කාර කරන්නේ වෙයි, ගරු කරන්නේද වෙයි, සිතින් බුහුමන් කරන්නේද වෙයි. පූජා කරන්නේද වෙයි, උතුම් වූ පූජාවෙන්ද පුදන්නේ වෙයි. ආනන්දය, එහෙයින් ධර්මානුධර්ම හැසිරීමෙන් යුක්තව වාසය කරම්හ, නිවනට සුදුසු ප්‍රතිපත්තියෙහි යෙදී අනුධර්මචාරීව වාසය කරම්හයි කියා ආනන්දය, තොප විසින් මෙසේ හික්මිය යුතු වන්නේ ය.

ගෞරවනීය මාපලගම සුසිලවංශ හිමියන් විසින් සිදුකරනු ලබන ශ්‍රී සද්ධර්ම දේශනා සහ සතිපතා පැවැත්වෙන ධර්ම සාකච්ඡා ශ්‍රවණය කිරීම සඳහා ඔබට පහත දැක්වෙන දිගුව හෝ QR කේතය හරහා ‘ලොව්තුරු අරණ’ YouTube නාලිකාවට පිවිසෙන්නට හැකියි.

තෙරුවන් සරණයි!

**www.Youtube.com/c/LowthuruArana**

# ත්‍රිවිධ රත්නය කෙරෙහි පැහැදීම අග්‍ර සැපතම හිමිකර දෙයි

(ඛුද්දකනිකාය / ඉතිවුත්තකපාළි / තිකනිපාතො / පංචමවග්ගො / අග්ගප්පසාදසුත්තං)

**යාවතා, භික්ඛවෙ, සත්තා අපදා වා, ද්විපදා වා, චතුප්පදා වා, බහුප්පදා වා, රූපිනො වා, අරූපිනො වා, සඤ්ඤිනො වා, අසඤ්ඤිනො වා, නෙවසඤ්ඤිනාසඤ්ඤිනො වා, තථාගතො තෙසං අග්ගමක්ඛායති අරහං සම්මාසම්බුද්ධො. යෙ, භික්ඛවෙ, බුද්ධෙ පසන්නා, අග්ගෙ තෙ පසන්නා. අග්ගෙ ඛො පන පසන්නානං, අග්ගො විපාකො හොති.**

මහණෙනි, පා නැත්තා වූද, දෙපා ඇත්තා වූද, සිවුපා ඇත්තා වූද, බොහෝ පා ඇත්තා වූද, රූප ඇත්තා වූද, රූප නැත්තා වූද, සංඥා ඇත්තා වූද, සංඥා නැත්තා වූද, භවාග්‍රයට ඇතුළත් වූද යම් පමණ සත්වයෝ වෙද්ද, ඒ සියල්ලන්ට තථාගත නම් වූ අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේම අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, යම් කෙනෙක් ඒ සම්බුදුරජාණන් වහන්සේ කෙරෙහි ප්‍රසන්න වූවාහුද, ඔහු තුමූ විශ්වයේ අග්‍ර උතුමාණන් වහන්සේ කෙරෙහිම පැහැදුණෝ වෙත්. අග්‍ර වූ පරම ශ්‍රේෂ්ඨ වූ බුදුරුවනෙහි ප්‍රසන්න වූවන්ට, අග්‍ර වූ විපාකයම හිමිවෙයි.

**යාවතා, භික්ඛවෙ, ධම්මා සඞ්ඛතා වා අසඞ්ඛතා වා, විරාගො තෙසං අග්ගමක්ඛායති, යදිදං මදනිම්මදනො, පිපාසවිනයො, ආලයසමුග්ඝාතො, වට්ටුපච්ඡෙදො, තණ්හක්ඛයො, විරාගො, නිරොධො නිබ්බානං. යෙ භික්ඛවෙ, විරාගෙ ධම්මෙ පසන්නා, අග්ගෙ තෙ පසන්නා. අග්ගෙ ඛො පන පසන්නානං, අග්ගො විපාකො හොති.**

මහණෙනි, හේතු ප්‍රත්‍යයන් විසින් සකස් කරන ලද්දා වූද, හේතු ප්‍රත්‍යයන් විසින් සකස් නොකරන ලද්දා වූද යම් පමණ ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයන් අතුරින්, රාග මදය මර්දනය කිරීමටද, කාම පිපාසය දුරු කිරීමටද, ආශාවන් සහමුලින්ම නැසීමටද, සංසාර චක්‍රය සිඳ දැමීමටද, තණ්හාව ක්ෂය කිරීමටද, ලෝකයෙන් එතෙර වීමටද, සියලු රාග, ද්වේෂ, මෝහ සහමුලින් නිරෝධ කිරීමටද හේතුවන විරාග ධර්මයම, අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, යම් කෙනෙක් ඒ නිර්වාණ ධර්මයෙහි ප්‍රසන්න වූවාහුද, ඔහු තුමූ විශ්වයේ අග්‍ර ධර්මයෙහිම පැහැදුණෝ වෙත්. අග්‍ර වූ පරම ශ්‍රේෂ්ඨ වූ දම්රුවනෙහි ප්‍රසන්න වූවන්ට, අග්‍ර වූ විපාකයම හිමිවෙයි.

**යාවතා, භික්ඛවෙ, සඞ්ඝා වා, ගණා වා, තථාගතසාවකසඞ්ඝො තෙසං අග්ගමක්ඛායති, යදිදං චත්තාරි පුරිසයුගානි, අට්ඨ පුරිසපුග්ගලා, එස භගවතො සාවකසඞ්ඝො, ආහුනෙය්‍යො, පාහුනෙය්‍යො, දක්ඛිණෙය්‍යො, අඤ්ජලිකරණීයො, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. යෙ, භික්ඛවෙ, සඞ්ඝෙ පසන්නා, අග්ගෙ තෙ පසන්නා. අග්ගෙ ඛො පන පසන්නානං, අග්ගො විපාකො හොති.**

මහණෙනි, යම් පමණ ජන සමූහයෝ වෙද්ද, පිරිස් වෙද්ද, ඔවුන් අතුරින්, තථාගතයන් වහන්සේගේ ශ්‍රාවක සමූහ තෙමේම අග්‍ර යයි කියනු ලැබේ. යම් මේ පුද්ගල යුගල සතරක් නොහොත් පුද්ගලයන් අට දෙනෙක් වූ **(සෝවාන් මාර්ග අනුගාමික - සෝවාන් ඵලලාභී - සකදාගාමී මාර්ග අනුගාමික - සකදාගාමී ඵලලාභී - අනාගාමි මාර්ග අනුගාමික - අනාගාමි ඵලලාභී - අරිහත් මාර්ග අනුගාමික - අරිහත් ඵලලාභී)** භාග්‍යවතුන් වහන්සේගේ එම ශ්‍රාවක සංඝ තෙමේ, දුර සිට ගෙන අවුත් දන් පිළිගැන්වීමට සුදුසුය, පැමිණි විට ආගන්තුක සත්කාරය සැලසීමට සුදුසුය, පරලොව අදහා දෙන වෙසෙස් දක්ෂිණාව පිළිගැනීමට සුදුසුය, ඇඟිලි බැඳ සිදු කළයුතු වන්දනාවට සුදුසුය, සියලු ලෝ වැසියන්ගේ අනුත්තර වූ පින් කෙත ය. මහණෙනි, යම් කෙනෙක්

එබඳු බුද්ධ ශ්‍රාවක සංඝයා කෙරෙහි ප්‍රසන්න වූවාහුද, ඔහු තුමූ විශ්වයේ අග්‍ර ගුණවත් පිරිස කෙරෙහි ප්‍රසන්න වූවාහු ය. අග්‍ර වූ පරම ශ්‍රේෂ්ඨ වූ සඟරුවනෙහි ප්‍රසන්න වූවන්ට, අග්‍ර වූ විපාකයම හිමිවෙයි.

**භාග්‍යවතුන් වහන්සේ හා සම කෙනෙක් නැත**
**(නිතර සිහි කළ යුතු මාහැඟි ගාථා රත්නයක්)**

**අත්ථි සක්‍යකුලෙ ජාතො - බුද්ධො අප්පටිපුග්ගලො**
**සබ්බාභිභූ මාරනුදො - සබ්බත්ථමපරාජිතො**
**සබ්බත්ථ මුත්තො අසිතො - සබ්බං පස්සති චක්ඛුමා**
**සබ්බකම්මක්ඛයං පත්තො - විමුත්තො උපධිසඞ්ඛයෙ**
**සො මයිහං භගවා සත්ථා - තස්ස රොචෙමි සාසන'න්ති**

ශාක්‍ය කුලයෙහි උපන්, තමහට සම අනෙකෙක් නැති, සියල්ල මැඩගෙන සිටි, සියලු මරහු දුරු කළ, සෑම තන්හිම දිනූ, අපරාජිත සම්මා සම්බුදුවරයාණන් වහන්සේ නමක් ඇත. උන්වහන්සේ සෑම අයුරින්ම නිදහස් වූ සේක. තෘෂ්ණා දෘෂ්ටීන් ඇසුරු නොකළ සේක. පසැස් ඇති උන්වහන්සේ සියල්ල දන්නා සේක, දක්නා සේක. සියලු කර්මයන්ගේ ක්ෂය බවට පැමිණි සේක. සියලු කෙළෙස් උපධීන්ගෙන් මිදුණු සේක. ඒ අසමසම භාග්‍යවතුන් වහන්සේ, මගේ පරම උත්තරීතර ශාස්තෘවරයාණෝ ය. මම උන්වහන්සේගේ සාසනය කැමැත්තෙමි.

**සාධු! සාධු! සාධු!**

# මහා පින් ගංගා කුසල ගංගා අට හෙවත් තිසරණය සහිත පන්සිල් සමාදානය

(අඞ්ගුත්තරනිකාය / අට්ඨකාදිනිපාතපාළි / දානවග්ගො / අභිසන්දසුත්තං)

අට්ඨිමෙ භික්ඛවෙ, පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරා සොවග්ගිකා සුඛවිපාකා සග්ගසංවත්තනිකා, ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තන්ති. කතමෙ අට්ඨ ?

මහණෙනි, ඉෂ්ට වූ, කමණීය වූ, මන වඩන්නා වූ, හිත පිණිස, සැප පිණිස පවත්නා වූ, සැප ගෙන දෙන්නා වූ, සුව ගෙන දෙන්නා වූ, සැප විපාක ඇත්තා වූ, ස්වර්ග මොක්ෂ සම්පත්තිය පිණිස හේතු වන්නා වූ, මහා පින් ගංගා කුසල ගංගා අටක් වෙත්. ඒ අට කවරේද යත් ?

ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධං සරණං ගතො හොති. අයං භික්ඛවෙ, පඨමො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො, ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

මහණෙනි, මේ සස්නෙහි අරිය සාවක තෙම බුදුන් සරණ ගියේ වෙයි. මහණෙනි, මේ ඉෂ්ට වූ, කමණීය වූ, මන වඩන්නා වූ, හිත පිණිස, සැප පිණිස පවත්නා වූ, සැප ගෙන දෙන්නා වූ, සුව ගෙන දෙන්නා වූ, සැප විපාක ඇත්තා වූ, ස්වර්ග මොක්ෂ සම්පත්තිය පිණිස හේතු වන්නා වූ, පළමුවන පින් ගංගාව කුසල ගංගාව වෙයි.

පුන චපරං භික්ඛවෙ, අරියසාවකො ධම්මං සරණං ගතො හොති. අයං භික්ඛවෙ, දුතියො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො, ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

තවද මහණෙනි, මේ සස්නෙහි අරිය සාවක තෙම ධර්මය සරණ ගියේ වෙයි. මේ ඉෂ්ට වූ, කමණීය වූ, මන වඩන්නා වූ, හිත

පිණිස, සැප පිණිස පවත්නා වූ, සැප ගෙන දෙන්නා වූ, සුව ගෙන දෙන්නා වූ, සැප විපාක ඇත්තා වූ, ස්වර්ග මොක්ෂ සම්පත්තිය පිණිස හේතු වන්නා වූ, දෙවන පින් ගංගාව කුසල ගංගාව වෙයි.

පුන චපරං භික්ඛවෙ, අරියසාවකො සඞ්ඝං සරණං ගතො හොති. අයං, භික්ඛවෙ, තතියො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො, ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

තවද මහණෙනි, මේ සස්නෙහි අරිය සාවක තෙම සංඝයා සරණ ගියේ වෙයි. මේ ඉෂ්ට වූ, කමණීය වූ, මන වඩන්නා වූ, හිත පිණිස, සැප පිණිස පවත්නා වූ, සැප ගෙන දෙන්නා වූ, සුව ගෙන දෙන්නා වූ, සැප විපාක ඇත්තා වූ, ස්වර්ග මොක්ෂ සම්පත්තිය පිණිස හේතු වන්නා වූ, තුන්වන පින් ගංගාව කුසල ගංගාව වෙයි.

පඤ්චිමානි භික්ඛවෙ, දානානි මහාදානානි, අග්ගඤ්ඤානි, රත්තඤ්ඤානි, වංසඤ්ඤානි, පොරාණානි, අසංකිණ්ණානි, අසංකිණ්ණපුබ්බානි, න සංකියන්ති, න සංකියිස්සන්ති, අප්පටිකුට්ඨානි, සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි. කතමානි පඤ්ච?

මහණෙනි, ප්‍රාරම්භයෙහි සිට පවත්නා වූ, චිර කාලයක සිට දැන සිටින්නා වූ, පාරම්පරිකව දැනගනු ලබන්නා වූ, පුරාණයේ සිටම පැවත එන්නා වූ, පාරිශුද්ධ වන්නා වූ, පාරිශුද්ධ බවට මුල් වන්නා වූ, ශ්‍රමණ බ්‍රාහ්මණයින් විසින් නුවණැත්තන් විසින් සැක කරනු නොලබන්නා වූ, සැක කළයුතුයයි නොසිතන්නා වූ, පිළිකුල් කරනු නොලබන්නා වූ, මහත්ඵල මහානිසංස සහිත වූ දානයෝ මහා දානයෝ පසෙක් වෙත්. ඒ කවර පසෙක්ද යත්?

ඉධ, භික්ඛවෙ, අරියසාවකො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති. පාණාතිපාතා පටිවිරතො භික්ඛවෙ, අරියසාවකො අපරිමාණානං සත්තානං අභයං දෙති, අවෙරං දෙති, අබ්‍යාබජ්ඣං දෙති. අපරිමාණානං සත්තානං අභයං දත්වා,

අවෙරං දත්වා, අබ්‍යාබජ්ඣං දත්වා, අපරිමාණස්ස අභයස්ස අවෙරස්ස අබ්‍යාබජ්ඣස්ස භාගී හොති. ඉදං, භික්ඛවෙ, පඨමං දානං මහාදානං අග්ගඤ්ඤං රත්තඤ්ඤං වංසඤ්ඤං පොරාණං අසංකිණ්ණං අසංකිණ්ණපුබ්බං, න සංකියති න සංකියිස්සති, අප්පටිකුට්ඨං සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි. අයං භික්ඛවෙ, චතුත්ථො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො, ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

මහණෙනි, මේ සස්නෙහි අරිය සාවක තෙම ප්‍රාණඝාතය හැර, ප්‍රාණඝාතයෙන් වෙන්වූයේ වෙයි. මහණෙනි, ප්‍රාණඝාතයෙන් වෙන් වූ අරිය සාවක තෙම, අප්‍රමාණ වූ සත්වයන්ට අභය දෙයි. අවෛරය දෙයි. මෛත්‍රිය දෙයි. අප්‍රමාණ වූ සත්වයන්ට අභය දී, අවෛරය දී, මෛත්‍රිය දී, අප්‍රමාණ වූ අභයේ, අවෛරයේ, මෛත්‍රියේ උරුමකරුවෙක් වෙයි. මහණෙනි මෙය, ප්‍රාරම්භයෙහි සිට පවත්නා වූ, චිර කාලයක සිට දැන සිටින්නා වූ, පාරම්පරිකව දැනගනු ලබන්නා වූ, පුරාණයේ සිටම පැවත එන්නා වූ, පාරිශුද්ධ වන්නා වූ, පාරිශුද්ධ බවට මුල් වන්නා වූ, ශ්‍රමණ බ්‍රාහ්මණයින් විසින් නුවණැත්තන් විසින් සැක කරනු නොලබන්නා වූ, සැක කළයුතුයයි නොසිතන්නා වූ, පිළිකුල් කරනු නොලබන්නා වූ, මහත්ඵල මහානිසංස සහිත වූ, පළමුවැනි දානයයි මහා දානයයි. මේ ඉෂ්ට වූ, කමණීය වූ, මන වඩන්නා වූ, හිත පිණිස, සැප පිණිස පවත්නා වූ, සැප ගෙන දෙන්නා වූ, සුව ගෙන දෙන්නා වූ, සැප විපාක ඇත්තා වූ, ස්වර්ග මොක්ෂ සම්පත්තිය පිණිස හේතු වන්නා වූ, සිව්වන පින් ගංගාව කුසල ගංගාව වෙයි.

පුන චපරං භික්ඛවෙ, අරියසාවකො අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති. අදින්නාදානා පටිවිරතො භික්ඛවෙ, අරියසාවකො අපරිමාණානං සත්තානං අභයං දෙති, අවෙරං දෙති, අබ්‍යාබජ්ඣං දෙති. අපරිමාණානං සත්තානං අභයං දත්වා, අවෙරං දත්වා, අබ්‍යාබජ්ඣං දත්වා, අපරිමාණස්ස අභයස්ස අවෙරස්ස අබ්‍යාබජ්ඣස්ස භාගී හොති. ඉදං, භික්ඛවෙ,

දුතියං දානං මහාදානං අග්ගඤ්ඤං රත්තඤ්ඤං වංසඤ්ඤං පොරාණං අසංකිණ්ණං අසංකිණ්ණපුබ්බං, න සංකියති න සංකියිස්සති, අප්පටිකුට්ඨං සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි. අයං භික්ඛවෙ, පංචමො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො, ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

තවද මහණෙනි, මේ සස්නෙහි අරිය සාවක තෙම සොරකම හැර, සොරකමෙන් වෙන්වූයේ වෙයි. මහණෙනි, සොරකමෙන් වෙන් වූ අරිය සාවක තෙම, අප්‍රමාණ වූ සත්වයන්ට අභය දෙයි. අවෛරය දෙයි. මෛත්‍රිය දෙයි. අප්‍රමාණ වූ සත්වයන්ට අභය දී, අවෛරය දී, මෛත්‍රිය දී, අප්‍රමාණ වූ අභයේ, අවෛරයේ, මෛත්‍රියේ උරුමකරුවෙක් වෙයි. මහණෙනි මෙය, ප්‍රාරම්භයෙහි සිට පවත්නා වූ, චිර කාලයක සිට දැන සිටින්නා වූ, පාරම්පරිකව දැනගනු ලබන්නා වූ, පුරාණයේ සිටම පැවත එන්නා වූ, පාරිශුද්ධ වන්නා වූ, පාරිශුද්ධ බවට මුල් වන්නා වූ, ශ්‍රමණ බ්‍රාහ්මණයින් විසින් නුවණැත්තන් විසින් සැක කරනු නොලබන්නා වූ, සැක කළයුතුයයි නොසිතන්නා වූ, පිළිකුල් කරනු නොලබන්නා වූ, මහත්ඵල මහානිසංස සහිත වූ, දෙවැනි දානයයි මහා දානයයි. මේ ඉෂ්ට වූ, කමණීය වූ, මන වඩන්නා වූ, හිත පිණිස, සැප පිණිස පවත්නා වූ, සැප ගෙන දෙන්නා වූ, සුව ගෙන දෙන්නා වූ, සැප විපාක ඇත්තා වූ, ස්වර්ග මොක්ෂ සම්පත්තිය පිණිස හේතු වන්නා වූ, පස්වන පින් ගංගාව කුසල ගංගාව වෙයි.

පුන චපරං භික්ඛවෙ, කාමෙසුමිච්ඡාචාරං පහාය කාමෙසුමිච්ඡාචාරා පටිවිරතො හොති. කාමෙසුමිච්ඡාචාරා පටිවිරතො භික්ඛවෙ, අරියසාවකො අපරිමාණානං සත්තානං අභයං දෙති, අවෙරං දෙති, අබ්‍යාබජ්ඣං දෙති. අපරිමාණානං සත්තානං අභයං දත්වා, අවෙරං දත්වා, අබ්‍යාබජ්ඣං දත්වා, අපරිමාණස්ස අභයස්ස අවෙරස්ස අබ්‍යාබජ්ඣස්ස භාගී හොති. ඉදං, භික්ඛවෙ, තතියං දානං මහාදානං අග්ගඤ්ඤං රත්තඤ්ඤං වංසඤ්ඤං පොරාණං අසංකිණ්ණං අසංකිණ්ණපුබ්බං, න සංකියති න සංකියිස්සති,

අප්පටිකුට්ඨං සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි. අයං භික්ඛවෙ, ඡට්ඨමො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො, ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

තවද මහණෙනි, මේ සස්නෙහි අරිය සාවක තෙම කාම විසමාචාරය හැර, කාම විසමාචාරයෙන් වෙන්වූයේ වෙයි. මහණෙනි, කාම විසමාචාරයෙන් වෙන් වූ අරිය සාවක තෙම, අප්‍රමාණ වූ සත්වයන්ට අභය දෙයි. අවෛරය දෙයි. මෛත්‍රිය දෙයි. අප්‍රමාණ වූ සත්වයන්ට අභය දී, අවෛරය දී, මෛත්‍රිය දී, අප්‍රමාණ වූ අභයේ, අවෛරයේ, මෛත්‍රියේ උරුමකරුවෙක් වෙයි. මහණෙනි මෙය, ප්‍රාරම්භයෙහි සිට පවත්නා වූ, චිර කාලයක සිට දැන සිටින්නා වූ, පාරම්පරිකව දැනගනු ලබන්නා වූ, පුරාණයේ සිටම පැවත එන්නා වූ, පාරිශුද්ධ වන්නා වූ, පාරිශුද්ධ බවට මුල් වන්නා වූ, ශ්‍රමණ බ්‍රාහ්මණයින් විසින් නුවණැත්තන් විසින් සැක කරනු නොලබන්නා වූ, සැක කළයුතුයයි නොසිතන්නා වූ, පිළිකුල් කරනු නොලබන්නා වූ, මහත්ඵල මහානිසංස සහිත වූ, තුන්වන දානයයි මහා දානයයි. මේ ඉෂ්ට වූ, කමණීය වූ, මන වඩන්නා වූ, හිත පිණිස, සැප පිණිස පවත්නා වූ, සැප ගෙන දෙන්නා වූ, සුව ගෙන දෙන්නා වූ, සැප විපාක ඇත්තා වූ, ස්වර්ග මොක්ෂ සම්පත්තිය පිණිස හේතු වන්නා වූ, සයවන පින් ගංගාව කුසල ගංගාව වෙයි.

පුන චපරං භික්ඛවෙ, මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති. මුසාවාදා පටිවිරතො භික්ඛවෙ, අරියසාවකො අපරිමාණානං සත්තානං අභයං දෙති, අවෙරං දෙති, අබ්‍යාබජ්ඣං දෙති. අපරිමාණානං සත්තානං අභයං දත්වා, අවෙරං දත්වා, අබ්‍යාබජ්ඣං දත්වා, අපරිමාණස්ස අභයස්ස අවෙරස්ස අබ්‍යාබජ්ඣස්ස භාගී හොති. ඉදං, භික්ඛවෙ, චතුත්ථං දානං මහාදානං අග්ගඤ්ඤං රත්තඤ්ඤං වංසඤ්ඤං පොරාණං අසංකිණ්ණං අසංකිණ්ණපුබ්බං, න සංකියති න සංකියිස්සති, අප්පටිකුට්ඨං සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි. අයං භික්ඛවෙ,

සත්තමො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො, ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

තවද මහණෙනි, මේ සස්නෙහි අරිය සාවක තෙම බොරුකීම හැර, බොරුකීමෙන් වෙන්වූයේ වෙයි. මහණෙනි, බොරුකීමෙන් වෙන් වූ අරිය සාවක තෙම, අප්‍රමාණ වූ සත්වයන්ට අභය දෙයි. අවෛරය දෙයි. මෛත්‍රිය දෙයි. අප්‍රමාණ වූ සත්වයන්ට අභය දී, අවෛරය දී, මෛත්‍රිය දී, අප්‍රමාණ වූ අභයේ, අවෛරයේ, මෛත්‍රියේ උරුමකරුවෙක් වෙයි. මහණෙනි මෙය, ප්‍රාරම්භයෙහි සිට පවත්නා වූ, චිර කාලයක සිට දැන සිටින්නා වූ, පාරම්පරිකව දැනගනු ලබන්නා වූ, පුරාණයේ සිටම පැවත එන්නා වූ, පාරිශුද්ධ වන්නා වූ, පාරිශුද්ධ බවට මුල් වන්නා වූ, ශ්‍රමණ බ්‍රාහ්මණයින් විසින් නුවණැත්තන් විසින් සැක කරනු නොලබන්නා වූ, සැක කළයුතුයයි නොසිතන්නා වූ, පිළිකුල් කරනු නොලබන්නා වූ, මහත්ඵල මහානිසංස සහිත වූ, සිව්වන දානයයි මහා දානයයි. මේ ඉෂ්ට වූ, කමණීය වූ, මන වඩන්නා වූ, හිත පිණිස, සැප පිණිස පවත්නා වූ, සැප ගෙන දෙන්නා වූ, සුව ගෙන දෙන්නා වූ, සැප විපාක ඇත්තා වූ, ස්වර්ග මොක්ෂ සම්පත්තිය පිණිස හේතු වන්නා වූ, සත්වන පින් ගංගාව කුසල ගංගාව වෙයි.

පුන චපරං භික්ඛවෙ, සුරාමෙරය මජ්ජපමා දට්ඨානං පහාය සුරාමෙර මජ්ජපමා දට්ඨානා පටිවිරතො හොති. සුරාමෙරය මජ්ජපමා දට්ඨානා පටිවිරතො භික්ඛවෙ, අරියසාවකො අපරිමාණානං සත්තානං අභයං දෙති, අවෙරං දෙති, අබ්‍යාබජ්ඣං දෙති. අපරිමාණානං සත්තානං අභයං දත්වා, අවෙරං දත්වා, අබ්‍යාබජ්ඣං දත්වා, අපරිමාණස්ස අභයස්ස අවෙරස්ස අබ්‍යාබජ්ඣස්ස භාගී හොති. ඉදං, භික්ඛවෙ, පංචමං දානං මහාදානං අග්ගඤ්ඤං රත්තඤ්ඤං වංසඤ්ඤං පොරාණං අසංකිණ්ණං අසංකිණ්ණපුබ්බං, න සංකියති න සංකියිස්සති, අප්පටිකුට්ඨං සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි. අයං භික්ඛවෙ, අට්ඨමො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො

සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො, ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

තවද මහණෙනි, මේ සස්නෙහි අරිය සාවක තෙම මදයට සහ ප්‍රමාදයට හේතුවන රහමෙර පානය හැර, රහමෙර පානයෙන් වෙන්වූයේ වෙයි. මහණෙනි, රහමෙර පානයෙන් වෙන් වූ අරිය සාවක තෙම, අප්‍රමාණ වූ සත්වයන්ට අභය දෙයි. අවෛරය දෙයි. මෛත්‍රිය දෙයි. අප්‍රමාණ වූ සත්වයන්ට අභය දී, අවෛරය දී, මෛත්‍රිය දී, අප්‍රමාණ වූ අභයේ, අවෛරයේ, මෛත්‍රියේ උරුමකරුවෙක් වෙයි. මහණෙනි මෙය, ප්‍රාරම්භයෙහි සිට පවත්නා වූ, චිර කාලයක සිට දැන සිටින්නා වූ, පාරම්පරිකව දැනගනු ලබන්නා වූ, පුරාණයේ සිටම පැවත එන්නා වූ, පාරිශුද්ධ වන්නා වූ, පාරිශුද්ධ බවට මුල් වන්නා වූ, ශ්‍රමණ බ්‍රාහ්මණයින් විසින් නුවණැත්තන් විසින් සැක කරනු නොලබන්නා වූ, සැක කළයුතුයයි නොසිතන්නා වූ, පිළිකුල් කරනු නොලබන්නා වූ, මහත්ඵල මහානිසංස සහිත වූ, පස්වන දානයයි මහා දානයයි. මේ ඉෂ්ට වූ, කමණීය වූ, මන වඩන්නා වූ, හිත පිණිස, සැප පිණිස පවත්නා වූ, සැප ගෙන දෙන්නා වූ, සුව ගෙන දෙන්නා වූ, සැප විපාක ඇත්තා වූ, ස්වර්ග මොක්ෂ සම්පත්තිය පිණිස හේතු වන්නා වූ, අටවන පින් ගංගාව කුසල ගංගාව වෙයි.

**යෙසං සද්ධා ච සීලඤ්ච, පසාදො ධම්මදස්සනං**
**තෙ වෙ කාලෙන පච්චෙන්ති, බ්‍රහ්මචරියොගධං සුඛීන්ති.**

යමෙක් හට බුදුරජාණන් වහන්සේ කෙරෙහි ප්‍රසාදයද, ධර්මය කෙරෙහි ප්‍රසාදයද, සංඝයා කෙරෙහි ප්‍රසාදයද, ආර්යයන් කැමති වූ සීලයද ඇත්තාහුද, ඔවුහු ශාසන බ්‍රහ්මචර්යාවෙහි යෙදී, මතු අරි අටඟි මඟ හා යෙදුණු පරම සැපයට සුදුසු කාලයෙහිදි පැමිණෙත්.

# තෙවරක් සාධුකාර දීමේ අර්ථය

## සාධු! සාධු! සාධු!

**කායෙන සංවරො සාධු**
**කාය සුචරිතයේ පිහිටම් - සාධු!**
**සාධු වාචාය සංවරො**
**වචී සුචරිතයේ පිහිටම් - සාධු!**
**මනසා සංවරො සාධු**
**මනෝ සුචරිතයේ පිහිටම් - සාධු!**

**කාය සුචරිතය**

ප්‍රාණඝාතයෙන් (පරපණ නැසීම) වැළකීම
අදත්තාදානයෙන් (අන්සතු දේ සොරකම් කිරීම) වැළකීම
කාම මිථ්‍යාචාරයෙන් (කාම විසමාචාරය) වැළකීම

**වචී සුචරිතය**

මුසාවාදයෙන් (අනුන් රවටන වංචාසහගත අසත්‍ය වචන) වැළකීම
පිසුණාවාචයෙන් (කේළාම් හෙවත් අනුන් භේද කරන වචන) වැළකීම
පරුෂාවාචයෙන් (අනුන් සැඩ බවට පත් කරන වචන) වැළකීම
සම්පප්‍රලාපයෙන් (යහපත පිණිස නොපවතින හිස් නිසරු වචන) වැළකීම

**මනෝ සුචරිතය**

අභිධ්‍යාවෙන් (දැඩි ලෝභය) වෙන් වීම
ව්‍යාපාදයෙන් (අනුන් නැසීමේ වෛරී චේතනාව) වෙන් වීම
මිථ්‍යා දෘෂ්ටියෙන් (කර්මය - කර්ම ඵල පිළි නොගැනීම) වෙන් වීම

කායෙන සංවරො සාධු - සාධු වාචාය සංවරො
මනසා සංවරො සාධු - සාධු සබ්බත්ථ සංවරො
සබ්බත්ථ සංවුතො භික්ඛු - සබ්බ දුක්ඛා පමුච්චතු

කාය (කායද්වාරය) සංවරය යහපති. වචී (වාග්ද්වාරය) සංවරය යහපති. මානසික (මනෝද්වාරය) සංවරය යහපති. සියල්ලෙහි සංවරය යහපති. එසේ තිදොරෙහිම සංවර වූ සංවෘත වූ භික්ෂු තෙම, සියලු සංසාර දුකින් අතමිදේ.

# තෙරුවන් නමස්කාරය

ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේට
මාගේ අනන්ත වූ අග්‍ර වූ නමස්කාරය වේවා!!!

**නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස!**
**නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස!**
**නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස!**

**බුද්ධං සරණං ගච්ඡාමි**
**ධම්මං සරණං ගච්ඡාමි**
**සංඝං සරණං ගච්ඡාමි**

**දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි**
**දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි**
**දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි**

**තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි**
**තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි**
**තතියම්පි සංඝං සරණං ගච්ඡාමි**

- පළමුවත්, දෙවනුවත්, තෙවනුවත් භව දුක නිවීම පිණිස, බුදු රජුන් අනුව යමි.
- පළමුවත්, දෙවනුවත්, තෙවනුවත් භව දුක නිවීම පිණිස, නිර්වාණ ධර්මය අනුව යමි.
- පළමුවත්, දෙවනුවත්, තෙවනුවත් භව දුක නිවීම පිණිස, සංඝ ප්‍රතිපදාව අනුව යමි.

# පන්සිල් සමාදන් වීම

**පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි**
**අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි**
**කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි**
**මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි**
**සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි**

**ප්‍රාණඝාත අකුසලය සිදු වන අයුරු (පරපණ නැසීම)**

1. පණ ඇති සතෙකු වීම
2. පණ ඇති සතෙකු බව දැනීම
3. මරණ චේතනාව
4. මරණ උපක්‍රමය
5. එම උපක්‍රමයෙන් මරණය සිදුවීම
   ප්‍රාණඝාත අකුසලය සිදුවීමට මෙම කරුණු 5 සම්පූර්ණ විය යුතුය.

**අදත්තාදාන අකුසලය සිදු වන අයුරු (සොරකම)**

1. අන්සතු වස්තුවක් වීම
2. අන්සතු වස්තුවක් බව දැනීම
3. සොරා ගැනීමේ චේතනාව
4. සොරකම් කිරීමේ උපක්‍රමය
5. තිබූ තැනින් වෙනස් කිරීම හෙවත් ගැනීම
   අදත්තාදාන අකුසලය සිදුවීමට මෙම කරුණු 5 සම්පූර්ණ විය යුතු ය.

**කාම මිථ්‍යාචාර අකුසලය සිදුවන අයුරු (කාමයන්හි වරදවා හැසිරීම)**

1. සේවනය නො කළ යුතු ස්ත්‍රියක වීම
2. වරදවා හැසිරීමේ චේතනාව

3. වරදවා හැසිරීමේ උත්සාහය
4. ආස්වාදය ඉවසීම හෙවත් සේවනය
   කාම මිථ්‍යාචාර අකුසලය සිදුවීමට මෙම කරුණු 4 සම්පූර්ණ විය යුතු ය.

කාමෙසුමිච්ඡාචාරී ඛො පන හොති. යා තා මාතුරක්ඛිතා පිතුරක්ඛිතා මාතාපිතුරක්ඛිතා භාතුරක්ඛිතා භගිනිරක්ඛිතා ඤාතිරක්ඛිතා ගොත්තරක්ඛිතා ධම්මරක්ඛිතා සස්සාමිකා සපරිදණ්ඩා අන්තමසො මාලාගුණපරික්ඛිත්තාපි, තථාරූපාසු චාරිත්තං ආපජ්ජිතා හොති.

සාලෙය්‍යක සූත්‍රයේ ඇතුළත් උතුම් වූ බුද්ධ දේශනාවට අනුව, කාම මිථ්‍යාචාරයට හේතුවන, වරදවා සේවනය නොකළ යුතු ස්ත්‍රීන් එකොළොස් දෙනෙකි.

1. මාතු රක්ඛිතා - මව විසින් රක්නා ස්ත්‍රිය
2. පිතු රක්ඛිතා - පියා විසින් රක්නා ස්ත්‍රිය
3. මාතා පිතු රක්ඛිතා - මව්පිය දෙදෙනා විසින් රක්නා ස්ත්‍රිය
4. භාතු රක්ඛිතා - සොහොයුරකු විසින් රක්නා ස්ත්‍රිය
5. භගිනි රක්ඛිතා - සොහොයුරියක විසින් රක්නා ස්ත්‍රිය
6. ඤාති රක්ඛිතා - නෑයකු විසින් රක්නා ස්ත්‍රිය
7. ගොත්ත රක්ඛිතා - කුලය විසින් රක්නා ස්ත්‍රිය
8. ධම්ම රක්ඛිතා - කුල චාරිත්‍ර හා ධර්මය රක්නා ස්ත්‍රිය
9. සස්සාමිකා - ස්වාමි පුරුෂයෙකු විසින් රක්නා ස්ත්‍රිය
10. සපරිදණ්ඩා - දඬුවම් ලැබූ / සිරගත වූ ස්ත්‍රිය
11. අන්තමසෝ මාලාගුණපරික්ඛිත්තාපි - ස්වකීය භාර්යාව වන්නේ යැයි යමෙකු විසින් මල්මාලා පළඳා වෙන් කරන ලද (විවාහ ගිවිසුම්ගත වූ) ස්ත්‍රිය

**මුසාවාද අකුසලය සිදුවන අයුරු (බොරු කීම)**

1. කියන කරුණු අසත්‍යය වීම
2. අන්‍යයන් රැවටීමේ චේතනාව
3. එය ඇඟවීම, පැවසීම
4. එයින් අසන්නා මුළාවීම

   මුසාවාද අකුසලය සිදුවීමට මෙම කරුණු 4 සම්පූර්ණ විය යුතු ය.

**සුරාපාන අකුසලය සිදුවන අයුරු (සුරාවෙන් මත්වී ප්‍රමාදවීම)**

1. සුරාපැන්, මත්ද්‍රව්‍ය ආදී මතට, මදයට, ප්‍රමාදයට හේතුවන ද්‍රව්‍යයක් වීම
2. මත් වීමේ චේතනාව
3. ඒ සඳහා උත්සාහ කිරීම
4. ඒ අනුව සුරාපැන්, මත්ද්‍රව්‍ය ආදියෙන් මත් වී ප්‍රමාදයට පත්වීම

   සුරාමේර අකුසලය සිදුවීමට මෙම කරුණු 4 සම්පූර්ණ විය යුතු ය.

# බුද්ධ නමස්කාරය

**යේ බ්‍රාහ්මණා වේදගු සබ්බ ධම්මේ**
**තේ මේ නමෝ තේ ච මං පාලයන්තු**
**නමත්ථු බුද්ධානං නමත්ථු බෝධියා**
**නමෝ විමුත්තානං නමෝ විමුත්තියා**

ක්ෂීණාශ්‍රව ඇති යම් බ්‍රාහ්මණයෙක් සියලු දත යුතු ධර්මයන් දැන සම්බුද්ධත්වයට පැමිණියේද, උන් වහන්සේලාට මාගේ නමස්කාරය වේවා! උන් වහන්සේලා මා ආරක්ෂා කරන සේක්වා! අසමසම සම්මා සම්බුද්ධ පදවියට මාගේ නමස්කාරය වේවා! නව ලොව්තුරා බෝධි ගුණයට මාගේ නමස්කාරය වේවා! සියලු කෙළෙසුන් කෙරෙන් මිදුණා වූ ඒ සම්බුදුවරයන් වහන්සේලාට මාගේ නමස්කාරය වේවා! ඒ අජරාමර නිවන් ශාන්තිය සලසන උත්තරීතර විමුක්තියට මාගේ නමස්කාරය වේවා!

## තෙරුවන් ගුණ සජ්ඣායනය

**ඉතිපි සො භගවා අරහං, සම්මා සම්බුද්ධො,**
**විජ්ජාචරණසම්පන්නො, සුගතො, ලොකවිදූ, අනුත්තරො**
**පුරිසදම්මසාරථී, සත්ථා දෙවමනුස්සානං, බුද්ධො, භගවා'ති.**

ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ, සියලු කෙළෙසුන් දුරු කළ හෙයින්ද, සියලු පාපයන්ගෙන් මිදුණු හෙයින්ද, රහසින්වත් පව් නොකළ හෙයින්ද, සියලු ලෝ වැසියන්ගේ උතුම් ආමිස, ප්‍රතිපත්ති පූජා සියල්ලටම සුදුසු වන හෙයින්ද, "අරහං" නම් වන සේක. මධ්‍යම ප්‍රතිපදාව නමැති, චතුරාර්ය සත්‍යය ධර්මය, කිසිවෙකුගේ උපකාරයකින් තොරව, තමන් වහන්සේ විසින්ම, අවබෝධ කළ හෙයින්ද, සෙසු ජනයාට අවබෝධ කරවීමේ හැකියාව ඇති හෙයින්ද "සම්මා සම්බුද්ධ" නම් වන සේක. අෂ්ට විද්‍යාවන්ගෙන් හා පසළොස්චරණ ධර්මයන්ගෙන්ද යුක්ත වූ

හෙයින් "**විජ්ජාචරණසම්පන්න**" නම් වන සේක. ඉතා යහපත් වූ මැදුම් පිළිවෙත මඟින් නිවන් සුවයට මනාකොට සපැමිණි හෙයින්ද, සෝභන ගමන් ඇති හෙයින්ද, මධුර වූ වදන් ඇති හෙයින්ද, "**සුගත**" නම් වන සේක. සියලු ලෝකයන්හි සියලු දේ පිළිබඳ ලෞකික වශයෙන්ද, ලෝකෝත්තර වශයෙන්ද, සම්මුතික වශයෙන්ද, පරමාර්ථ වශයෙන්ද සියල්ල දන්නා නුවණින් සමන්විත වන හෙයින්ද, ලෝකයේ උදාව සහ නිරෝධය මනාව දත් හෙයින්ද, "**ලොකවිදූ**" නම් වනසේක. සත්වයින් මනා සේ හික්මවා, ධර්මයෙහි පිහිටුවා යහමගට ගැනීමෙහි දක්ෂ වූ බැවින්ද, නොහික්මුණු විසම වූ පුද්ගලයන් මැනවින් දමනය කළ හෙයින්ද "**අනුත්තරො පුරිසදම්මසාරථී**" නම් වන සේක. සියලු දෙව් මිනිසුන්ට ජාති, ජරා, ව්‍යාධි, මරණ සසර දුකින් මිදී, නිවන් අවබෝධ කර ගැනීම පිණිස, අවවාද අනුශාසනා කරන එකම ශාස්තෘවරයාණන් වහන්සේ වන හෙයින් "**සත්ථා දෙවමනුස්සානං**" නම් වන සේක. මධ්‍යම ප්‍රතිපදාව තුළින්, අවිජ්ජා, තෘෂ්ණා නසා, රාග, දෝස, මෝහ ක්ෂය කර, භවය නිරෝධ කළ හෙයින්ද, නැවත නූපදින හෙයින්ද "**බුද්ධො**" නම් වන සේක. අප්‍රමාණ වූ සම්‍යක් ශීලයකින්ද, අප්‍රමාණ වූ සම්‍යක් සමාධියකින්ද, අප්‍රමාණ වූ සම්‍යක් ප්‍රඥාවකින්ද, ඥාණ මහත්වයෙන්ද, ගුණ මහත්වයෙන්ද, ඍද්ධි මහත්වයෙන්ද අගතැන්පත්ව, සියලු ලෝ වැසියන් විසින්ම, ගරු කිරීමට සුදුසු වන හෙයින් "**භගවා**" නම් වන සේක.

**බුද්ධං ජීවිතං යාව නිබ්බානං සරණං ගච්ඡාමි**
**යෙ ච බුද්ධා අතීතාච - යෙ ච බුද්ධා අනාගතා**
**පච්චුප්පන්නාච යෙ බුද්ධා - අහං වන්දාමි සබ්බදා**
**නත්ථි මෙ සරණං අඤ්ඤං - බුද්ධො මෙ සරණං වරං**
**එතෙන සච්ච වජ්ජෙන - හොතු මෙ ජය මංගලං**
**උත්තමංගෙන වන්දෙහං - පාදපංසු වරුත්තමං**
**බුද්ධෙ යො ඛලිතො දොසො - බුද්ධො ඛමතු තං මමං**

උතුම් නිවන උදෙසාම මම බුදුන් සරණ යමි. අතීතයේ වැඩසිටි යම්තාක් සම්මා සම්බුදුවරුන් වේද, අනාගතයේ පහළවන

යම්තාක් සම්මා සම්බුදුවරුන් වේද, මේ කාලයට අයත් යම්තාක් සම්මා සම්බුදුවරුන් වේද, තුන් කාලයටම අයත් ඒ සියලු සම්මා සම්බුදු රජාණන් වහන්සේලා, මම හැම කල්හි වන්දනා කරමි.

මට බුද්ධ රත්නය හැර අන් පිහිටක් නැත. බුදුරජාණන් වහන්සේ මාගේ උත්තම පිළිසරණ ය. මේ සත්‍යය වූ වචනයේ බලයෙන් මට ජය මංගල්‍යයක්ම වේවා!

ඒ බුදුරජාණන් වහන්සේගේ උතුම් පා දූහුවිල්ලද, පය තිබූ තැන වූ පසද, හිස නමා වඳිමි. (සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සිරිපතුළෙහි තැවරුණු දූහුවිල්ලත් මා හට උතුම් චෛත්‍යයකි).

බුදු රජාණන් වහන්සේගේ නාමයට මගෙන් සිදු වූ යම් වරදක් දෝෂයක් වේ නම්, බුදු රජාණන් වහන්සේ මා හට කමා කරන සේක්වා!

**නමාමි බුද්ධං ගුණ සාගරන්තං -**
**සත්තා සදා හොන්තු සුඛී අවේරා**
**කායෝ ජිගුච්ඡෝ සකලෝ දුගන්ධෝ -**
**ගච්ඡන්ති සබ්බේ මරණං අහංච**

ගුණ සාගරයක් වූ බුදු පියාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා! සියලු සත්වයෝ සදාතනික සැපයට පත්වේවා! වෛර නැත්තෝ වෙත්වා! දුකම ගෙන දෙන්නා වූ පිළිකුල් කටයුතු වූ සියලු කායෝ, දුර්ගන්ධයම ඇත්තාහ. ලොව සියල්ලෝ මරණය කරාම ගමන් කරන්නෝ ය.

## චතුරාරක්ෂක භාවනා (සමථ භාවනා)

නමාමි බුද්ධං ගුණ සාගරන්තං - **බුද්ධානුස්සතිය**
සත්තා සදා හොන්තු සුඛී අවේරා - **මෙත්තානුස්සතිය**
කායෝ ජිගුච්ඡෝ සකලෝ දුගන්ධෝ - **අසුභානුස්සතිය**
ගච්ඡන්ති සබ්බේ මරණං අහංච - **මරණානුස්සතිය**

**ස්වාක්ඛාතො භගවතා ධම්මො, සන්දිට්ඨිකො, අකාලිකො, එහිපස්සිකො, ඔපනයිකො, පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී'ති**

භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ධර්මය මුල - මැද - අග යහපත් කොට දේශනා කරන ලද්දේය. මේ ධර්මය තමා තුළින්ම දැකිය යුත්තේ ය, කල් නොයවා විපාක දෙන්නේ ය, මේ ධර්මය 'එව බලව' යි කීමට, අවබෝධයෙන් පරික්ෂා කිරීමට සුදුසු ය, භාවනා වශයෙන් තම සිත්හි පැමිණවීමට - දරා ගැනීමට සුදුසු ය, නුවණැත්තන් විසින් තම තම නැණ පමණින් ප්‍රත්‍යක්ෂයෙන් දත යුත්තේ ය.

**ධම්මං ජීවිතං යාව නිබ්බානං සරණං ගච්ඡාමි**
**යෙ ච ධම්මා අතීතාච - යෙ ච ධම්මා අනාගතා**
**පච්චුප්පන්නාච යෙ ධම්මා - අහං වන්දාමි සබ්බදා**
**නත්ථි මෙ සරණං අඤ්ඤං - ධම්මො මෙ සරණං වරං.**
**එතෙන සච්ච වජ්ජෙන - හොතු මෙ ජය මංගලං**
**උත්තමංගෙන වන්දෙහං - ධම්මංච තිවිධං වරං**
**ධම්මෙ යො ඛලිතො දොසො - ධම්මො ඛමතු තං මමං**

මම උතුම් නිවන උදෙසාම දහම් සරණ යමි. අතීතයේ පැවති ශ්‍රී සද්ධර්මය වේද, අනාගතයේ පවත්නා ශ්‍රී සද්ධර්මය වේද, මේ කාලයේ පවතින ශ්‍රී සද්ධර්මය වේද, තුන් කාලයේම පවතින අකාලික වූ ඒ උතුම් ශ්‍රී සද්ධර්මය මම හැම කල්හි වන්දනා කරමි.

මට ධර්ම රත්නය හැර අන් පිහිටක් නැත. නිර්මල ශ්‍රී සද්ධර්මය මාගේ උත්තම පිළිසරණ ය. මේ සත්‍යය වූ වචනයේ බලයෙන් මට ජය මංගල්‍යයක්ම වේවා!

පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේද, යන ත්‍රිවිධ වූ අසමසම බුද්ධ භාෂිතයෙන් යුත් උත්තරීතර ශ්‍රී සද්ධර්මය හිස නමා වදිමි. ශ්‍රී සද්ධර්මයේ නාමයට මගෙන් සිදු වූ යම් වරදක් දෝෂයක් වේ නම්, ශ්‍රී සද්ධර්මය මා හට කමා කරන සේක්වා!

**නමාමි ධම්මං සුගතෙන දේසිතං -**
**සත්තා සදා හොන්තු සුඛී අවේරා**
**කායෝ ජිගුච්ඡෝ සකලෝ දුගන්ධෝ -**
**ගච්ඡන්ති සබ්බේ මරණං අහංච**

සැපයටම මඟ සලසන සුගතයන් වහන්සේගේ උතුම් දේශනාවට (ශ්‍රී සද්ධර්මයට) මාගේ නමස්කාරය වේවා! සියලු සත්වයෝ සදාතනික සැපයට පත්වේවා! වෛර නැත්තෝ වෙත්වා! දුකම ගෙන දෙන්නා වූ පිළිකුල් කටයුතු වූ සියලු කායෝ, දුර්ගන්ධයම ඇත්තාහ. ලොව සියල්ලෝ මරණය කරාම ගමන් කරන්නෝ ය.

**සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො**
**උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො**
**ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො**
**සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො,**
**යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා**
**එස භගවතො සාවකසඞ්ඝො, ආහුනෙය්‍යයො**
**පාහුනෙය්‍යයො දක්ඛිණෙය්‍යයො අඤ්ජලිකරණීයො**
**අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා'ති**

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම සැපය උදා කරන මනා පිළිවෙතෙහි පිළිපන්නේ ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ඍජු පිළිවෙතෙහි පිළිපන්නේ ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ඤාණ මාර්ගයෙහි පිළිපන්නේ ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ලෝකෝත්තර ආර්ය මාර්ගයෙහි පිළිපන්නේ ය. යම් මේ පුරිස යුගල සතරක් ඇද්ද, ආර්ය පුද්ගලයෝ අට දෙනෙක් ඇද්ද, භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවක සංඝයා, ආහුනෙය්‍යය - දුර සිට ගෙනෙන සිවුපසයෙන් පූජා ලැබීමට සුදුසු ය, පාහුනෙය්‍යය - ආගන්තුක සත්කාර පිළිගැන්වීමට සුදුසු ය, දක්ඛිණෙය්‍යය - විපාක අදහා දෙන දානය පිළිගැනීමට සුදුසු ය, අඤ්ජලිකරණීය - දෑත් එක්කර වන්දනා කිරීමට සුදුසු ය, සියලු ලෝකයාගේ අනුත්තර වූ පින් කෙත ය.

**සංඝං ජීවිතං යාව නිබ්බානං සරණං ගච්ඡාමි**

**යෙ ච සංඝා අතීතාච - යෙ ච සංඝා අනාගතා**

**පච්චුප්පන්නාච යෙ සංඝා - අහං වන්දාමි සබ්බදා**

**නත්ථි මෙ සරණං අඤ්ඤං - සංඝො මෙ සරණං වරං**

**එතෙන සච්ච වජ්ජෙන - හොතු මෙ ජය මංගලං**

**උත්තමංගෙන වන්දෙහං - සංඝං ච තිවිධොත්තමං**

**සංඝෙ යො ඛලිතො දොසො - සංඝො ඛමතු තං මමං**

මම උතුම් නිවන උදෙසාම සඟුන් සරණ යමි. අතීතයේ පහළ වූ යම්තාක් ශ්‍රාවක සංඝයා වේද, අනාගතයේ පහළ වන යම්තාක් ශ්‍රාවක සංඝයා වේද, මේ කාලයේ වැඩ සිටින යම්තාක් ශ්‍රාවක සංඝයා වේද, තුන් කාලයටම අයත් ඒ උතුම් ආර්ය ශ්‍රාවක සංඝයා වහන්සේ මම හැම කල්හි වන්දනා කරමි.

මට සංඝ රත්නය හැර අන් පිහිටක් නැත. ආර්ය සංඝයා වහන්සේ මාගේ උත්තම පිළිසරණ ය. මේ සත්‍යය වූ වචනයේ බලයෙන් මට ජය මංගල්‍යයක්ම වේවා!

සම්මුතික පුහුදුන් සංඝයා වහන්සේද, නිවන් මග වඩන ආර්ය සංඝයා වහන්සේද, නිවන් මග පූර්ණ කළ අරිහත් සංඝයා වහන්සේද යන තුන් කොටසින් යුත් ආර්ය මහා සංඝ රත්නය හිස නමා වඳිමි. ආර්ය මහා සංඝ රත්නය නමට මගෙන් සිදු වූ යම් වරදක් දෝෂයක් වේ නම්, ආර්ය මහා සංඝයා වහන්සේ මා හට කමා කරන සේක්වා!

# අග්‍රශ්‍රාවක උතුමන් නැමදීම

## අග්‍රශ්‍රාවක සාරිපුත්ත මහරහතන් වහන්සේට වන්දනා කිරීම

**යෝ ධම්මසේනාපතී සුපූජිතෝ - පඤ්ඤාය පාරමිං ගතෝ**
**ගම්භීරපඤ්ඤෝ මේධාවී - මග්ගාමග්ගස්ස කෝවිදෝ**
**තං වීතරාගං සුසමාහිතින්ද්‍රියං - වන්දාමි පරිනිබ්බුත සාරිපුත්තං**

මහා අගසව් රහත් උතුමෙක් - සුපූජිත වූ දහම් සෙනෙවිව
මුදුන්පත් වී මහා ප්‍රඥාවෙන් - ගැඹුරු නුවණින් මහා නුවණින්
මග නොමග නිසි ලෙස දකින්නට - මහා දස්කම් පෑවේද
ඒ වීතරාගී සමාහිත ඉඳුරන් ඇති - අමා නිවනට වැඩිය අපගේ
උතුම් සැරියුත් රහත් මුණිඳුට - වඳිමි මම සාදරයෙන්

## දුතියශ්‍රාවක මහාමොග්ගල්ලාන මහරහතන් වහන්සේට වන්දනා කිරීම

**යෝ මහානුභාවෝ ඡළභිඤ්ඤෝ - ඉද්ධියා පාරමිං ගතෝ**
**සෝ විකුබ්බනාසු කුසලෝ - වසීභූතෝ මහිද්ධියා**
**තං වීතරාගං සුසමාහිතින්ද්‍රියං - වන්දාමි පරිනිබ්බුත**
**මොග්ගල්ලානං**

මහා අගසව් රහත් උතුමන් - සයක් වූ මහ අභිඥා ලැබ
මුදුන්පත් වී ඉර්ධි බලයෙන් - මහා අනුහස් පෑවේද
දක්ෂ වී මහා පෙළහරෙහි - ඉර්ධි බල තම වසඟයට ගත්
ඒ වීතරාගී සමාහිත ඉඳුරන් ඇති - අමා නිවනට වැඩිය අපගේ
මහා මුගලන් රහත් මුණිඳුට - වඳිමි මම සාදරයෙන්

**නමාමි සංඝං මුණිරාජ සාවකං -**
**සත්තා සදා හොන්තු සුඛී අවේරා**
**කායෝ ජිගුච්ඡෝ සකලෝ දුගන්ධෝ -**
**ගච්ඡන්ති සබ්බේ මරණං අහංච**

මහා මුණින්ද්‍රයාණන් වහන්සේගේ උතුම් වූ ශ්‍රාවක සංඝ රත්නයට මාගේ නමස්කාරය වේවා! සියලු සත්වයෝ සදාතනික සැපයට පත්වේවා! වෛර නැත්තෝ වෙත්වා! දුකම ගෙන දෙන්නා වූ පිළිකුල් කටයුතු වූ සියලු කායෝ, දුර්ගන්ධයම ඇත්තාහ. ලොව සියල්ලෝ මරණය කරාම ගමන් කරන්නෝ ය.

**සාධු! සාධු!! සාධු!!!**

## ත්‍රිවිධ චෛත්‍ය වන්දනාව

**වන්දාමි චේතියං සබ්බං**
**සබ්බඨානේ සුපතිට්ඨිතං**
**සාරීරික ධාතු මහා බෝධිං**
**බුද්ධ රූපං සකලංසදා**

ඒ අසමසම සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ අති පාරිශුද්ධ ශාරීරික ධාතූන් වහන්සේලාගෙන් යුක්ත වූ සැම තැන්හි පිහිටියා වූ සියලු චෛත්‍ය රාජයාණන් වහන්සේලාද, පාරිභෝගික ධාතූන් වහන්සේ වන මහ බෝ සමිඳුන්ද, උද්දේසික ධාතූන් වහන්සේ වන සියලු බුද්ධ රූප ප්‍රතිමා සංකේතද, යනාදීයෙන් සමන්විත උත්තරීතර වූ ත්‍රිවිධ චෛත්‍යය වන්දනා කරමි!

## සොළොස්මස්ථාන වන්දනා කිරීම

**මහියංගනං නාගදීපං - කළ්‍යාණං පදලාංඡනං**
**දිවාගුහං දීඝවාපී - චේතියංච මුතිංගනං**
**තිස්සමහා විහාරංච - බෝධිං මරිච වට්ටියං**
**සුවණ්ණමාලී මහා චේතිං - ථූපාරාම භයාගිරිං**
**ජේතවනං සේල චේතිං - තථා කාචර ගාමකං**
**ඒතේ සෝළස ඨානානි - අහං වන්දාමි සබ්බදා**

මහියංගණය, නාගදීපය, කැලණිය, ශ්‍රී පාදය, දිවා ගුහාව, දීඝවාපිය, මුතියංගණය, තිස්සමහවෙහෙර, ශ්‍රී මහා බෝධිය, මිරිසවැටිය, රුවන්වැලි මහසෑය, ථූපාරාමය, අභයගිරිය, ජේතවනය, සේල චෛත්‍යය, කිරි වෙහෙරය යන සොළොස්මස්ථානයන් හැම කල්හී මම වන්දනා කරමි.

## මහ සෑ රදුන් වහන්සේ වන්දනා කිරීම

**සයිංසු යස්මිං සුගතස්ස ධාතු - නිම්මාය රංසුජ්ජල බුද්ධරූපං**
**සුවණ්ණමාලීති පතීත නාමං - වන්දාමහං ථූපවරං මහග්ඝං**

ද්‍රෝණයක් පමණ වූ ශ්‍රී සර්වඥ ධාතූන් වහන්සේලා ෂඩ්වර්ණ රශ්මි විහිදුවන නිර්මිත බුදුරුවක් තුළ යම් දාගැබක සැතපෙන සේක්ද, ස්වර්ණමාලී නමින් පතළ වූ ඒ මහාර්ඝ වූ සියලු ස්ථූපයන්ට අග්‍ර වූ මහා ස්ථූප රාජයාණන් වහන්සේට, දොහොත් මුදුන් තබා සාදර ගෞරව භක්තියෙන් මම නමස්කාර කරමි!!! නමස්කාර වේවා!!!

## සියලු චෛත්‍ය බෝධි වන්දනා කිරීම

**බුද්ධං ධම්මංච සංඝං**
**සුගත තනුභවා ධාතුයෝ ධාතු ගබ්භේ**
**ලංකායං ජම්බුදීපේ තිදස පුරවරේ නාග ලෝකේ ච ථූපේ**
**සබ්බේ බුද්ධස්ස බිම්බේ සකල දසදිසේ කේස ලෝමාදි ධාතුං**
**වන්දේ සබ්බේපි බුද්ධං දස බල තනුජං බෝධි චේතිං නමාමි!!!**

බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නයද, බුදුරජාණන් වහන්සේගේ පරම පාරිශුද්ධ ශාරීරික ධාතූන් වහන්සේලා (සර්වඥ ධාතූන් වහන්සේලා) තැන්පත් කොට නිමවන ලද ලක්දිව, දඹදිව, තව්තිසා දෙව් පුරය හා නා ලොව යන ස්ථානයන්හී පිහිටි සියලු ස්ථූපද, බුදුරජාණන් වහන්සේ උදෙසා ඉදි කළ සියලුම ප්‍රතිමා වහන්සේලාද, පූජනීය සංකේතද, සියලු දස දිසාවන්හී වැඩවසන කේස ධාතු, ලෝම ධාතු ආදී ධාතූන් වහන්සේලාද, යන සියල්ල මම වන්දනා කරමි. දසබලධාරී බුදු පියාණන් වහන්සේ නමින් පහළ වූ එම සියලු චෛත්‍ය වහන්සේලාටද, බෝධීන් වහන්සේලාටද, මම නමස්කාර කරමි.

**සාධු! සාධු!! සාධු!!!**

## ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේ වන්දනා කිරීම

**යස්ස මූලේ නිසින්නෝවා සබ්බාරි විජයං අකා**
**පත්තෝ සබ්බඤ්ඤුතං සත්ථා වන්දේතං බෝධි පාදපං**

බුදුරජාණන් වහන්සේ යම් බෝධි මූලයක වැඩ හුන් සේක්ද, සකල ක්ලේශ ප්‍රහීණ කොට සර්වඥතා ඥාණයට පැමිණි සේක්ද, ඒ බෝධි රාජයාණන් වහන්සේ මම වන්දනා කරමි!

**ඉමේ ඒතේ මහා බෝධි ලෝක නාථේන පූජිතා**
**අහම්පිතේ නමස්සාමි බෝධිරාජා නමත්ථුතේ**

බුදුරජාණන් වහන්සේ විසින්ද පුදන ලද්දා වූද, ඒ ජය ශ්‍රී මහා බෝධි රාජයාණන් වහන්සේට මම ද නමස්කාර කරමි. නමස්කාර වේවා!

**ඉන්දනීල වණ්ණපත්ත සේත ඛන්ද භාසුරං**
**සත්ථු නෙත්ත පංකජාභි පූජිතග්ග සාතදං**
**අග්ගබෝධි නාම වාම දේව රුක්ඛ සණ්ණිභං**
**තං විසාල බෝධිපාදපං නමාමි සබ්බදා**

ඉඳුනිල් මිණි වැනි පත් වලින්ද, සුදු පැහැති කඳින් ද බබළන්නා වූ, බුදුරජාණන් වහන්සේගේ නෙත් පියුම්වලින් පුදන ලද්දා වූද, උතුම් සැප ගෙන දෙන දිව්‍ය වෘක්ෂයකට සමාන වූ, අග්‍රබෝධි නම් වූ, සකල තලයෙහි පැතිරුණු උත්තම බෝධි රාජයාණන් වහන්සේට සැම කල්හිම නමස්කාර කරමි!

**පඨමං බෝධි පල්ලංකං - දුතියංච අනිම්මිසං**
**තතියං චංකමනං සෙට්ඨං - චතුත්ථං රතනාඝරං**
**පඤ්චමං අජපාලංච - මුචලින්දේන ඡට්ඨමං**
**සත්තමං රාජායතනං - වන්දේ තං මුණි සේවිතං**

අප මහා මුණින්ද්‍රයාණන් වහන්සේ සම්බුද්ධත්වයේ සිට ඇරඹි සත් සතිය තුළ, පළමුව ජයසිරිමහ බෝධි මූලයද, දෙවනුව අනිමිස ලෝචනයද, තෙවනුව රුවන් සක්මනද, සිව්වනුව රුවන් ගෙයද, පස්වනුව අජපල් රුක මුලද, සයවනුව මුචලින්ද නාග දරණයද, සත්වනුව රාජායතනයද යනාදි වශයෙන් පිළිවෙළින් ඇසුරු කළා වූ සියලු තැන් මම වන්දනා කරමි!

**සුපතිට්ඨිත රට්ඨනුරාධපුරේ - සමදිට්ඨිත දක්ඛිණ සාඛ භවං**
**සුභ මේඝවනම්බර මේඝනිභං - ජය බෝධි මහං පණමාමි වරං**

බුදුරජාණන් වහන්සේ අදිටන් කළ පරිදිම, අනුරාධපුර මහමෙව්නා උයනේ මනාව පිහිටියා වූ උතුම් මව් බෝධියේ දක්ෂිණ ශාඛාව වන, ජය ශ්‍රී මහා බෝධි රාජයාණන් වහන්සේට මම නමස්කාර කරමි!!!

**සාධු! සාධු!! සාධු!!!**

## ආරක්ෂක ගාථාව

**ජයෝ මුණින්දස්ස සුබෝධි මූලේ -**
**අහෝසි මාරස්ස පරාජයෝහී**
**උග්ඝෝසයුං දේව ගණා පසන්නා -**
**ඒතේන සච්චෙන සුවත්ථි හොතු**

ඒ අසමසම වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ, පස් මරුන් පරදවා මාර පරාජය කොට උත්තරීතර වූ ශ්‍රී මහා බෝධි මූලයේදී විජයග්‍රහණය ලබා අති උතුම් වූ සම්මා සම්බුද්ධත්වයට පත් වූ සේක. එයින් ප්‍රීතියට පත් සියලු දෙවියෝ මහත් සේ ප්‍රීති ඝෝෂා පැවැත්වූහ. ඒ සත්‍යයේ මහානුභාව බලයෙන් මා හට කායික මානසික සුවයම අත්වේවා!

## මහා බලගතු ආරක්ෂක තෙරුවන් ගාථා

**බුද්ධෝ තිලෝක සරණෝ - බුද්ධෝ සුරියෝ තමෝනුදෝ**
**ඒවං තං සරණං ඛෙමං - බුද්ධෝ මේ සරණං වරං**
**ගච්ඡාමි සරණං බුද්ධං - නත්ථි මයිහං භයං සදා**

බුදුරජාණන් වහන්සේ තුන් ලොවටම එකම පිළිසරණ වන සේක. ඒ අපගේ බුදුරජාණන් වහන්සේ ලෝකයාගේ මෝහාන්ධකාරය දුරලන සූර්යයා වන සේක. මෙසේ ඒ බුදුරජාණන් වහන්සේගේ සරණ, බිය රහිත වූ උතුම් ශ්‍රේෂ්ඨ සරණම වන සේක. මම ඒ බුදුරජාණන් වහන්සේ සරණ යමි. එහෙයින් මා හට සදා භය නැත්තේ ම ය.

**ධම්මෝ තිලෝක සරණෝ - ධම්මෝ සුරියෝ තමෝනුදෝ**
**ඒවං තං සරණං ඛෙමං - ධම්මෝ මේ සරණං වරං**
**ගච්ඡාමි සරණං ධම්මං - නත්ථි මයිහං භයං සදා**

ඒ උතුම් ශ්‍රී සද්ධර්මය තුන් ලොවටම එකම පිළිසරණ වන සේක. ඒ උතුම් ශ්‍රී සද්ධර්මය ලෝකයාගේ මෝහාන්ධකාරය දුරලන සූර්යයා වන සේක. මෙසේ ඒ උතුම් ශ්‍රී සද්ධර්මයේ සරණ, බිය රහිත වූ උතුම් ශ්‍රේෂ්ඨ සරණම වන සේක. මම ඒ උතුම් ශ්‍රී සද්ධර්මය සරණ යමි. එහෙයින් මා හට සදා භය නැත්තේ ම ය.

**සංඝෝ තිලෝක සරණෝ - සංඝෝ සුරියෝ තමෝනුදෝ**
**ඒවං තං සරණං ඛෙමං - සංඝෝ මේ සරණං වරං**
**ගච්ඡාමි සරණං සංඝං - නත්ථි මයිහං භයං සදා**

ඒ උතුම් ආර්ය මහා සංඝ රත්නය තුන් ලොවටම එකම පිළිසරණ වන සේක. ඒ උතුම් ආර්ය මහා සංඝ රත්නය ලෝකයාගේ මෝහාන්ධකාරය දුරලන සූර්යයා වන සේක. මෙසේ ඒ උතුම් ආර්ය මහා සංඝ රත්නයේ සරණ, බිය රහිත වූ උතුම් ශ්‍රේෂ්ඨ

සරණම වන සේක. මම ඒ උතුම් ආර්ය මහා සංඝ රත්නය සරණ යමි. එහෙයින් මා හට සදා භය නැත්තේ ම ය.

## මහා බලගතු විශ්ව බුද්ධ මන්ත්‍රය

**සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා**
**සචිත්ත පරියො දපනං - ඒතං බුද්ධාන සාසනං**

සැම පවින් වැළකුම - අවිදු තණ්හා දුරුලුම
සිත දමනය කැරුම - එයයි අණ සැම බුදුවරුන්ගෙම

## සාධු! සාධු!! සාධු!!!

## බුද්ධ පූජා පිළිගැන්වීම

**යාවතා භගවා ලෝකේ - තිට්ඨෙය්‍යය තව සාසනං**
**තාවතා පතිගණ්හාතු - පූජා ලෝකානුකම්පයා**

භාග්‍යවතුන් වහන්ස, යම්තාක් කල් ලෝකයෙහි ඔබ වහන්සේගේ සසුන පවතින්නේද, ඒතාක් කල් ලෝකයාට අනුකම්පා පිණිස මේ සියලු පූජාවන් පිළිගන්නා සේක්වා!

## පහන් පූජාව

**ගන්ධ තේලප්ප දිත්තේන - දීපෙන තමධංසිනා**
**තිලෝක දීපං සම්බුද්ධං - පූජයාමී තමෝනුදං**

සංසාරයේ අවිදු අඳුර දුරු කළ, තුන් ලොවටම මහා ආලෝකය වූ, තුන් ලොව ප්‍රඥාවේ මහා පහන්ටැඹ වූ, පරම පූජනීය සම්මා සම්බුදුරජාණන් වහන්සේට, මේ උතුම් වූ සුගන්ධයෙන් යුත් තෙල් පහන් ආලෝකය පුද දෙමි!

## සුවඳ දුම් පූජාව

**සුගන්ධි කාය වදනං - අනන්ත ගුණ ගන්ධිනා**
**සුගන්ධිනාහං ගන්ධේන - පූජයාමි තථාගතං**

තුන් දොර කෙළෙස් දුගඳ සහමුලින් දුරලූ, කුසල් සුගන්ධයෙන් යුත් මහා කාරුණික ලොව්තුරු බුද්ධ වචනයෙන් අනන්තය තෙක් සුවඳ කළ, අසමසම තථාගතයන් වහන්සේගේ ඒ මහා කරුණා ගුණ සුවඳට, මේ උතුම් වූ සුවඳින්, සුවඳ දුමින් පූජා පවත්වමි!

## මල් පූජාව

**පූජේමි බුද්ධං කුසුමේන නේන**
**පුඤ්ඤේන මේතේන ලභාමි මොක්ඛං**
**පුප්ඵං මිලායාති යථා ඉදං මේ**
**කායෝ තථායාති විනාස භාවං**

මම මේ මලින් බුදුරජාණන් වහන්සේ පුදන්නෙමි. මේ පිනෙන් නිර්වාණ මොක්ෂයම ලබම්වා! මේ මල් මැලවී යන්නා සේ, මාගේ සිරුරද විනාශයට පත්වන බව සිහි කරමි!

**වණ්ණ ගන්ධ ගුණෝපේතං - ඒතං කුසුම සන්තතිං**
**පූජයාමි මුණින්දස්ස - සිරිපාද සරෝරුහේ**

මනා වර්ණයෙන් හා සුගන්ධයෙන් යුත් මේ මල් සමූහය, පරම පූජනීය මහා මුණීන්ද්‍රයන් වහන්සේගේ ශ්‍රී පාද පද්මයෙහි පූජා කරමි!

## සිසිල් පැන් පූජාව

**සුගන්ධං සීතලං කප්පං - පසන්න මධුරං සුභං**
**පානීය මේතං භගවා - පතිගණ්හාතු මුත්තමං**

උතුම් වූ භාග්‍යවතුන් වහන්ස, කැප වූ සුවඳ ඇති, සිසිල් වූ, පිරිසිදු වූ, මිහිරි වූ, පැහැපත් වූ මේ පැන් පිළිගන්නා සේක්වා!

## උණු පැන් පූජාව

**අධිවාසේතු නෝ භන්තේ - උණ්හෝදකං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං**

ස්වාමීනි අප කෙරෙහි ඉවසවා. මනාව පිළියෙල කරන ලද මේ උණු පැන් අප කෙරෙහි අනුකම්පාවෙන් යුතුව පිළිගන්නා සේක්වා!

## ගිලන්පස පූජාව

**අධිවාසේතු නෝ භන්තේ - ගිලානපච්චයං ඉමං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං**

ස්වාමීනි අප කෙරෙහි ඉවසවා. මනාව පිළියෙල කරන ලද මේ ගිලන්පස අප කෙරෙහි අනුකම්පාවෙන් යුතුව පිළිගන්නා සේක්වා!

## අෂ්ඨපාන පූජාව

**අධිවාසේතු නෝ භන්තේ - අෂ්ඨපානං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං**

ස්වාමීනි, අප කෙරෙහි ඉවසවා. මනාව පිළියෙල කරන ලද මේ අෂ්ඨපාන අප කෙරෙහි අනුකම්පාවෙන් යුතුව පිළිගන්නා සේක්වා!

## භෝජන පූජාව

**අධිවාසේතු නෝ භන්තේ - භෝජනං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං**

ස්වාමීනි, අප කෙරෙහි ඉවසවා. මනාව පිළියෙල කරන ලද මේ භෝජනය අප කෙරෙහි අනුකම්පාවෙන් යුතුව පිළිගන්නා සේක්වා!

## ව්‍යඤ්ජන පූජාව

**අධිවාසේතු නෝ භන්තේ - ව්‍යඤ්ජනං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං**

ස්වාමීනි, අප කෙරෙහි ඉවසවා. මනාව පිළියෙල කරන ලද මේ ව්‍යඤ්ජනය, අප කෙරෙහි අනුකම්පාවෙන් යුතුව පිළිගන්නා සේක්වා!

## කැවිලි පූජාව

**අධිවාසේතු නෝ භන්තේ - කජ්ජකං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං**

ස්වාමීනි, අප කෙරෙහි ඉවසවා. මනාව පිළියෙල කරන ලද මේ රසකැවිලි, අප කෙරෙහි අනුකම්පාවෙන් යුතුව පිළිගන්නා සේක්වා!

## පළතුරු පූජාව

**අධිවාසේතු නෝ භන්තේ - රසවන්තං ඵලාඵලං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං**

ස්වාමීනි, අප කෙරෙහි ඉවසවා. මනාව පිළියෙල කරන ලද මේ රසවත් පළතුරු, අප කෙරෙහි අනුකම්පාවෙන් යුතුව පිළිගන්නා සේක්වා!

## කිරි ආහාර පූජාව

**අධිවාසේතු නෝ භන්තේ - පායාසං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං**

ස්වාමීනි, අප කෙරෙහි ඉවසවා. මනාව පිළියෙල කරන ලද මේ කිරි ආහාර, අප කෙරෙහි අනුකම්පාවෙන් යුතුව පිළිගන්නා සේක්වා!

## කිරි පැණි පූජාව

**අධිවාසේතු නෝ භන්තේ - දධි ඵාණිතං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං**

ස්වාමීනි, අප කෙරෙහි ඉවසවා. මනාව පිළියෙල කරන ලද මේ කිරිපැණි, අප කෙරෙහි අනුකම්පාවෙන් යුතුව පිළිගන්නා සේක්වා!

## දැහැත් පූජාව

**නාගවල්ලී දලූ පේතං - චුන්න පූග සමායුතං**
**තාම්බූලං පතිගණ්හාතු - සකප්පූරමිදං ජිනෝ**

ජින නම් වන බුදුරජාණන් වහන්ස, බුලත්, සුණු, පුවක් වලින් යුක්ත වූ මෙම උතුම් දැහැත් පූජා කරමි, පිළිගන්නා සේක්වා!

## බෙහෙත් ඖෂධ පූජාව

**අධිවාසේතු නෝ භන්තේ - භේසජ්ජං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං**

ස්වාමීනි, අප කෙරෙහි ඉවසවා. මනාව පිළියෙල කරන ලද මේ බෙහෙත් ඖෂධ අප කෙරෙහි අනුකම්පාවෙන් යුතුව පිළිගන්නා සේක්වා!

## සියල්ල එකවර පූජා කිරීම

**අධිවාසේතු නෝ භන්තේ - සබ්බං සද්ධාය පූජිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං**

ස්වාමීනි, අප කෙරෙහි ඉවසවා. මනාව පිළියෙල කර ශ්‍රද්ධාවෙන් යුක්තව පූජා කරනු ලබන මේ සියලු පූජාවන්, අප කෙරෙහි අනුකම්පාවෙන් යුතුව පිළිගන්නා සේක්වා!

## ආරාධනා කිරීම

**නිවේදයාමි සම්බුද්ධං - වීතරාගං මහාමුණිං**
**නිමන්තයාමි සුගතං - ලෝක ජෙට්ඨං නරාසභං**

සම්මා සම්බුදුරජාණන් වහන්සේට දන්වා සිටිමි. මේ සියලු පූජාවන් පිළිගන්නා ලෙස, ලෝකනායක වූ, මිනිසුන් අතර ශ්‍රේෂ්ඨ වූ, ජ්‍යේෂ්ඨ වූ, වීතරාගී වූ, සුගත වූ මහා මුණීන්ද්‍රයන් වහන්සේට ගෞරවයෙන් ආරාධනා කරමි!

**සාධු! සාධු!! සාධු!!!**

## අති උත්තරීතර ත්‍රිවිධ බුද්ධ වචනය සිහිපත් කිරීම

**නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස!**
**නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස!**
**නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස!**

## උතුම් වූ පළමු බුද්ධ වචනය

**අනේක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං**
**ගහකාරකං ගවේසන්තෝ - දුක්ඛා ජාති පුනප්පුනං**
**ගහකාරක දිට්ඨෝසි - පුනගෙහං න කාහසි**
**සබ්බා තේ ඵාසුකා භග්ගා - ගහකූටං විසංඛිතං**
**විසංඛාර ගතං චිත්තං - තණ්හානං ඛය මජ්ඣගා**

මේ සසර නොයෙක් වර, මැරි මැරී ඉපදෙමින් භවය නම් ගෙය හදන වඩුවා සෙවුයෙමි. වඩුව මම ඔබ දිටිමි. හොඳින් හඳුනා ගතිමි. නැවත තට මා නමින් ගෙයක් සැදිය නොහේ. ගේ හදන උපකරණ සියල්ලම නැසූයෙමි. ගෙයි කැණිමඬල සුන් කළෙමි. සියලු සංඛාර දුරු කළ සිතින් සහ කයින් යුක්තව තණ්හාව සහමුලින්ම ක්ෂය කළෙමි.

## උතුම් වූ මධ්‍යම බුද්ධ වචනය

**සබ්බේ සංඛාරා අනිච්චාති - යදා පඤ්ඤාය පස්සති**
**අථ නිබ්බින්දති දුක්ඛේ - ඒස මග්ගෝ විසුද්ධියා**

සියලු සංස්කාර අනිච්ච ය. එය ප්‍රඥාවෙන් දැකිය යුතුය. එවිට සියලු දුකින් අත මිදෙයි. එය විසුද්ධියේ (විමුක්තියේ) මාර්ගයයි.

**සබ්බේ සංඛාරා දුක්ඛාති - යදා පඤ්ඤාය පස්සති**
**අථ නිබ්බින්දති දුක්ඛේ - ඒස මග්ගෝ විසුද්ධියා**

සියලු සංස්කාර දුක ය. එය ප්‍රඥාවෙන් දැකිය යුතුය. එවිට සියලු දුකින් අත මිදෙයි. එය විසුද්ධියේ (විමුක්තියේ) මාර්ගයයි.

**සබ්බේ ධම්මා අනත්තාති - යදා පඤ්ඤාය පස්සති**
**අථ නිබ්බින්දති දුක්ඛෙ - ඒස මග්ගෝ විසුද්ධියා**

සියලු ධර්ම අනත්ත ය (අසාරය). එය ප්‍රඥාවෙන් දැකිය යුතුය. එවිට සියලු දුකින් අත මිදෙයි. එය විසුද්ධියේ (විමුක්තියේ) මාර්ග යයි.

**අනිච්චාවත සංඛාරා - උප්පාද වය ධම්මිනෝ**
**උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති - තේසං වූපසමෝ සුඛෝ**

සියලු සංස්කාර ඒකාන්තයෙන් දුක ගෙන දෙන්නේ ය. සංස්කාර යනු හටගැනීම අවසන් කළයුතු - දුරු කළයුතු ධර්මයකි. හටගත් සියලු සංස්කාර නිරුද්ධ වී යයි. එහි සංසිඳීමක් - නූපදීමක් ඇද්ද එය පරම සැපයයි.

**ඒතං සන්තං ඒතං පණීතං - යදිදං සබ්බ සංඛාර සමථෝ**
**සබ්බූපධි පටිනිස්සග්ගො - තණ්හාක්ඛයෝ - විරාගො**
**නිරොධො - නිබ්බානන්ති**

එයම ශාන්ත වේ. එයම ප්‍රණීත වේ. එය සියලු සංස්කාරයන්ගේ සමථයයි. එය සියලු අල්ලාගැනීම් - උපද්‍රවයන් - ක්ලේශයන්ගේ අත්හැරීමයි. එය තණ්හාවේ අවසානයයි. එය සියලු ආස්වාදයන් ඇසුරු කිරීමෙන් වෙන්වීමයි. එය රාග, ද්වේෂ, මෝහ නිරෝධය හෙවත් නූපදීමයි. එය පරම සුවය වන නිර්වාණයයි.

**යං කිඤ්චි දුක්ඛං සම්භෝති - සබ්බං සංඛාර පච්චයා**
**සංඛාරානං නිරෝධෙන - නත්ථි දුක්ඛස්ස සම්භවෝ**

යම්කිසි දුකක් උපදින්නේද, ඒ සියල්ලට හේතුව සංස්කාර හටගැනීමයි. සංස්කාරයන්ගේ හට නොගැන්මක් - නිරෝධයක් ඇද්ද, එවිට දුකෙහි හට ගැනීමක් නොමැත.

## උතුම් වූ අවසන් බුද්ධ වචනය

**වය ධම්මා සංඛාරා - අප්පමාදෙන සම්පාදේත**

සංඛාර අවසන් කළ යුතු - දුරු කළ යුතු - නිමා කළ යුතු ධර්මයකි, අප්‍රමාදීව එය සිදු කරව්!

**සාධු! සාධු!! සාධු!!!**

## දස දිසාවට මෙත් වැඩීම

**පෙරදිග වසන සත්වයෝද - පෙර අනුදිග වසන සත්වයෝද**
**දකුණු දිග වසන සත්වයෝද - දකුණු අනුදිග වසන සත්වයෝද**
**පසු දිග වසන සත්වයෝද - පසු අනුදිග වසන සත්වයෝද**
**උතුරු දිග වසන සත්වයෝද - උතුරු අනුදිග වසන සත්වයෝද**
**උඩ දිග වසන සත්වයෝද - යට දිග වසන සත්වයෝද**
**පෙනෙන සත්වයෝද - නොපෙනෙන සත්වයෝද**
**ළඟ වසන සත්වයෝද - දුර වසන සත්වයෝද**

**මමද සියලු ලෝක සියලු සත්වයෝ**
**සියලු රාග බන්ධනයෙන් මිදෙත්වා!**
**සියලු ද්වේෂ බන්ධනයෙන් මිදෙත්වා!**
**සියලු මෝහ බන්ධනයෙන් මිදෙත්වා!**
**සියලු පාප බන්ධනයෙන් මිදෙත්වා!**
**සියලු නීච බන්ධනයෙන් මිදෙත්වා!**
**සියලු භූත බන්ධනයෙන් මිදෙත්වා!**
**සියලු ලෝක බන්ධනයෙන් මිදෙත්වා!**
**සියලු මාර බන්ධනයෙන් මිදෙත්වා!**

**මමද සියලු ලෝක සියලු සත්වයෝ**
**සියලු රෝගයෙන් මිදෙත්වා! - සියලු ශෝකයෙන් මිදෙත්වා!**
**සියලු භයෙන් මිදෙත්වා! - සියලු දුකෙන් මිදෙත්වා !**

**මමද සියලු ලෝක සියලු සත්වයෝ**
**අවෛරී සිත් ඇත්තෝ වෙත්වා!**
**මෛත්‍රී සිත් ඇත්තෝ වෙත්වා!**
**සුවපත් සිත් ඇත්තෝ වෙත්වා!**
**නිකෙළෙස් සිත් ඇත්තෝ වෙත්වා!**

**මමද සියලු ලෝක සියලු සත්වයෝ**
**නිබ්බාන පරම සුවයෙන් සුඛිතතර වෙත්වා!**
**නිබ්බාන පරම සුවයෙන් සුඛිතතර වෙත්වා!**
**නිබ්බාන පරම සුවයෙන් සුඛිතතර වෙත්වා!**

**සාධු! සාධු!! සාධු!!!**

## පින් අනුමෝදන් කිරීම

උතුම් වූ ත්‍රිවිධ රත්නයේ අනන්ත අප්‍රමාණ වූ මහා ගුණස්කන්ධයන් සිහි කරමින් ද, උතුම් වූ සීල, සමාධි, ප්‍රඥා ගුණ වඩමින්ද සිදු කළා වූ මේ වන්දනාමාන පුද පූජාවන් හේතු කොට ගෙන උදාවුණා වූ මහා පුණ්‍යස්කන්ධය සතර වරිගයක ඥාතීන් ද, දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍ය අමනුෂ්‍ය කියන්නා වූ සියලු ලෝක සත්ත්වයෝ ද සතුටු සිතින් අනුමෝදන් වෙත්වා!

මේ කරනු ලබන්නා වූ ශාසන ආශිර්වාදයන් ඒ අය වෙත විහිදී, පැතිරී, පිහිටා සුඛිත මුදිත වෙත්වා! කිසි කලෙකත් දුගතියක්

නොවෙත්වා! යහපතක් අභිවෘද්ධියක්ම වෙත්වා! නිවන් සාක්ෂාත් කරගැනීමට මේ පින් හේතු වාසනා වෙත්වා!

**එත්තාවතාච අම්හේහි**
**සම්භතං පුඤ්ඤසම්පදං**
**සබ්බේ දේවා අනුමෝදන්තු**
**සබ්බ සම්පත්ති සිද්ධියා!**

අද දින අප විසින් මෙසේ රැස් කරගන්නා ලද මේ පුණ්‍ය සම්භාරය, සියලුම දෙවි දේවතාවුන් වහන්සේලාද සතුටු සිතින් අනුමෝදන් වෙත්වා! මේ පින් බෙලෙන් සියලු සැපතින් වැඩේවා!

**එත්තාවතාච අම්හේහි**
**සම්භතං පුඤ්ඤසම්පදං**
**සබ්බේ භූතා අනුමෝදන්තු**
**සබ්බ සම්පත්ති සිද්ධියා!**

අද දින අප විසින් මෙසේ රැස් කරගන්නා ලද මේ පුණ්‍ය සම්භාරය, සියලුම අමනුෂ්‍ය කොටස්ද සතුටු සිතින් අනුමෝදන් වෙත්වා ! මේ පින් බෙලෙන් සියලු සැපතින් වැඩේවා!

**එත්තාවතාච අම්හේහි**
**සම්භතං පුඤ්ඤසම්පදං**
**සබ්බේ සත්තා අනුමෝදන්තු**
**සබ්බ සම්පත්ති සිද්ධියා!**

අද දින අප විසින් මෙසේ රැස් කරගන්නා ලද මේ පුණ්‍ය සම්භාරය, සියලුම සත්වයෝද සතුටු සිතින් අනුමෝදන් වෙත්වා! මේ පින් බෙලෙන් සියලු සැපතින් වැඩේවා!

**එත්තාවතාව අම්හේහි**
**සම්භතං පුඤ්ඤසම්පදං**
**සබ්බේ ඤාති පේතා අනුමෝදන්තු**
**සබ්බේ ඤාති මිත්තා අනුමෝදන්තු**
**සබ්බ සම්පත්ති සිද්ධියා!**

අද දින අප විසින් මෙසේ රැස් කරගන්නා ලද මේ පුණ්‍ය සම්භාරය, සියලුම ඤාති හිත මිත්‍රාදීන්ද සතුටු සිතින් අනුමෝදන් වෙත්වා! මේ පින් බෙලෙන් සියලු සැපතින් වැඩේවා!

**ආකාසට්ඨා ච භුම්මට්ඨා දේවා නාගා මහිද්ධිකා**
**පුඤ්ඤං තං අනුමෝදිත්වා චිරං රක්ඛන්තු සාසනං**

අහසෙහි පොළොවෙහි වාසය කරන මහා සෘර්ධි ඇති දෙවියන් හා නාගයන් මේ පින අනුමෝදන් වී බුද්ධ ශාසනය නිරතුරු ආරක්ෂා කරත්වා!

**ආකාසට්ඨා ච භුම්මට්ඨා දේවා නාගා මහිද්ධිකා**
**පුඤ්ඤං තං අනුමෝදිත්වා චිරං රක්ඛන්තු දේසනං**

අහසෙහි පොළොවෙහි වාසය කරන මහා සෘර්ධි ඇති දෙවියන් හා නාගයන් මේ පින අනුමෝදන් වී බුද්ධ දේශනාව නිරතුරු ආරක්ෂා කරත්වා!

**ආකාසට්ඨා ච භුම්මට්ඨා දේවා නාගා මහිද්ධිකා**
**පුඤ්ඤං තං අනුමෝදිත්වා චිරං රක්ඛන්තු මං පරංති**

අහසෙහි පොළොවෙහි වාසය කරන මහා සෘර්ධි ඇති දෙවියන් හා නාගයන් මේ පින අනුමෝදන් වී මාද, අන්‍යයන්ද නිරතුරු ආරක්ෂා කරත්වා!

**සාධු! සාධු!! සාධු!!!**

## මියගිය ඥාති හිතමිත්‍රාදීන්ට පින් දීම

**කතං අම්හේහි'මං පුඤ්ඤං - සබ්බ සම්පත්ති සාධකං**
**සබ්බේ ඥාති මිත්තා අනුමෝදන්තු - පරලෝකමිතෝ ගතා!**

අප විසින් මෙසේ රැස් කරගන්නා ලද මේ පින්, මිය පරලොව ගියා වූ, සියලු ඥාතී මිත්‍රාදීන් නමට අනුමෝදන් කරමු, අනුමෝදන් වෙත්වා! මේ පින් බෙලෙන් ඔවුහු සැපයට පත්වේවා!

**ඉදං මේ ඥාතීනං හෝතු**
**සුඛිතා හොන්තු ඥාතයෝ!**
**ඉදං මේ ඥාතීනං හෝතු**
**සුඛිතා හොන්තු ඥාතයෝ!**
**ඉදං මේ ඥාතීනං හෝතු**
**සුඛිතා හොන්තු ඥාතයෝ!**

මේ පින් ඥාතීන්ට අත් වේවා! මේ පින් බෙලෙන් ඥාතීහු සැපයට පැමිණෙත්වා!!!

**සාධු! සාධු!! සාධු!!!**

## ප්‍රාර්ථනා ගාථා

**ඉමිනා පුඤ්ඤ කම්මේන - මා මේ බාල සමාගමෝ**
**සතං සමාගමෝ හෝතු - යාව නිබ්බාන පත්තියා!!!**

මේ සියලු පුණ්‍යකර්මයන්ගේ බෙලෙන්, මා පාපකාරී අසත්පුරුෂයන්ගේ ඇසුරෙන් වෙන් වේවා! නිවන තෙක්ම, ප්‍රඥාවන්ත සත්පුරුෂයන්ගේ ඇසුරම හිමි වේවා!

**සාධු! සාධු!! සාධු!!!**

# නිවන් ප්‍රාර්ථනාව

**ඉදං මේ පුඤ්ඤං - ආසවක්ඛයා වහං හොතු**
**සබ්බ දුක්ඛා පමුච්චතු!!!**

මේ පින්, සියලු ආශ්‍රව (ආස්වාදය පිළිබඳ ආශාවන්) දුරු වීම පිණිසම හේතු වේවා! සියලු සසර දුකින් අත මිදීමටම හේතු වේවා!

**සාධු! සාධු!! සාධු!!!**

# ත්‍රිවිධ රත්නය කමා කර ගැනීම

**කායේන වාචා චිත්තේන - පමාදේන මයා කතං**
**අච්චයං ඛම මෙ භන්තේ - භූරිපඤ්ඤ තථාගත!**
**කායේන වාචා චිත්තේන - පමාදේන මයා කතං**
**අච්චයං ඛම මෙ ධම්ම - සංදිට්ඨික අකාලික!**
**කායේන වාචා චිත්තේන - පමාදේන මයා කතං**
**අච්චයං ඛම මෙ සංඝ - සුපටිපන්න අනුත්තර!**

මාගේ සිතින්, කයින්, වචනයෙන් නොදැනුවත්කමින් හෝ උතුම් ත්‍රිවිධ රත්නය නමට, යම් වරදක්, ප්‍රමාද දෝෂයක් සිදු වී ඇත්නම්, උතුම් බුද්ධ රත්නයෙන් මට සමාව ලැබේවා! උතුම් ධර්ම රත්නයෙන් මට සමාව ලැබේවා! උතුම් අෂ්ඨාර්ය පුද්ගල මහා සංඝ රත්නයෙන් මට සමාව ලැබේවා!

**සාධු! සාධු!! සාධු!!!**

## සියලු ලෝ සතුන්ට නිවන් සුවය ප්‍රර්ථනා කිරීම

**භවග්ගුපාදය අවීචි හෙට්ඨතො**
**එත්ථන්තරෙ සත්ත කායූපපන්නා**
**රූපී අරූපී ච අසඤ්ඤී සඤ්ඤිනො**
**දුක්ඛා පමුච්චන්තු ඵුසන්තු නිබ්බුතිං!**

ඉහළින් අරූපාවචර බ්‍රහ්ම තලයේ සිට (භවාග්‍රය) පහළින් අවීචි මහ නිරය දක්වා වන සක්වල අන්තරයේ පවතින සියලු ලෝකයන්හි, සියලු සත්ව තලයන්හි උපදින, රූප ඇත්තා වූද, රූප නැත්තා වූද, සංඥා ඇත්තා වූද, සංඥා නැත්තා වූද සියලු සතුන්, සියලු සංසාර දුකින් අතමිදී ඒ උතුම් නිවනටම පත් වේවා!

**සාධු! සාධු!! සාධු!!!**

## සිල්වත් ස්වාමීන් වහන්සේලාට වන්දනා කරන ගාථාව

**සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං**
**දුල්ලභේන මයා ලද්ධං - වන්දිතුං පස්සිතුං වරං**
**සාරිපුත්තාදි ථෙරානං - ආගතං පටිපාටියා**
**සද්ධා සීල දයාවාසං - බුද්ධ පුත්තං නමාමහං!**

සීලවන්ත වූද, ගුණවන්ත වූද, අනුත්තර වූ පුණ්‍ය ක්ෂේත්‍රය, දුර්ලභාකාරයෙන් මම ලද්දෙමි. වැඳීමටද දැකීමටද සුදුසු උතුම් වූ සාරිපුත්තාදී මහා තෙරුන් වහන්සේලාගේ පරපුරෙන් පැවතෙන්නා වූ සද්ධාවට, සීලයට, දයාවට, වාසස්ථානයක් බඳු වූ පින්වත් බුද්ධ පුත්‍රයින් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු!! සාධු!!!**

# මහානිසංස ඇති සත්බුදු වන්දනාව

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස!!!

විපස්සිස්ස නමත්ථු - චක්ඛුමන්තස්ස සිරීමතෝ
සිඛිස්සපි නමත්ථු - සබ්බභූතානුකම්පිනෝ

වෙස්සභුස්ස නමත්ථු - නහාතකස්ස තපස්සිනෝ
නමත්ථු කකුසන්ධස්ස - මාරසේනා පමද්දිනෝ

කෝණාගමනස්ස නමත්ථු - බ්‍රාහ්මණස්ස වුසීමතෝ
කස්සපස්ස නමත්ථු - විප්පමුත්තස්ස සබ්බධී

අංගීරසස්ස නමත්ථු - සක්‍යපුත්තස්ස සිරීමතෝ
යෝ ඉමං ධම්මමදේසේසී - සබ්බදුක්ඛාපනූදනං

යේ චාපි නිබ්බුතා ලෝකේ - යථාභූතං විපස්සිසුං
තේ ජනා අපිසුණා - මහන්තා වීතසාරදා

හිතං දේවමනුස්සානං - යං නමස්සන්ති ගෝතමං
විජ්ජාචරණසම්පන්නං - මහන්තං වීතසාරදං

සාධු...! සාධු...!! සාධු...!!!

## 1. විපස්සී බුදු රජුන්

ලොවේ පිරි දුක් අඳුර නසනා මහා නුවණැති මුණි රජාණෙනි
සදා සැනසිලි සුවය සදනා ලොවේ අසදිස දම් රජාණෙනි
විපස්සී යන නමින් තුන් ලොව පිදුම් ලබනා බුදු පියාණෙනි
දෑත නළලේ තබා වදිනා වැඳුම් පිළිගත මැන සුවාමිනි

නසා සියලුම කෙළෙස් සතුරන් විජය ලැබූ ලොව දම් රජාණෙනි
පළොල් රුක් සෙවණේදී බුදු රැස් විහිදුවාලූ බුදු රජාණෙනි
මල් පහන් හා සුවඳ දුම් මේ සිසිල් පැන් හා ගිලන්පස ගෙන
පුදමි සම්බුදු පියාණෙනි මම අම නිවන් සුවයම පතාගෙන

**සාධු...! සාධු...!! සාධු...!!!**

## 02. සිඛී බුදු රජුන්

ලෝ සතුන් සසරින් එතෙර කළ නිවන් මග මහ නියමුවාණෙනි
හෙළඹ රුක් සෙවණේදී බුදු රැස් විහිදුවාලූ මුණි රජාණෙනි
සිඛී යන නාමයෙන් තුන් ලොව පිදුම් ලබනා බුදු පියාණෙනි
දෑත නළලේ තබා වඳිනා වැඳුම් පිළිගත මැන සුවාමිනි

ලොවේ ඇති දුක් තැවුල් නිවනා මහා කරුණා මුණිවතාණෙනි
සසර කතරේ අඳුර නසනා මහා තෙද ඇති හිරු රජාණෙනි
මල් පහන් හා සුවඳ දුම් මේ සිසිල් පැන් හා ගිලන්පස ගෙන
පුදමි සම්බුදු පියාණෙනි මම අම නිවන් සුවයම පතාගෙන

**සාධු...! සාධු...!! සාධු...!!!**

## 03. වෙස්සභූ බුදු රජුන්

සියලු ලෝසත වෙත අමා මග විවර කර දුන් නියමුවාණෙනි
සාල රුක් සෙවණේදී බුදු රැස් විහිදුවාලූ මුණි රජාණෙනි
වෙස්සභූ යන නමින් තුන් ලොව පිදුම් ලබනා බුදු පියාණෙනි
දෑත නළලේ තබා වඳිනා වැඳුම් පිළිගත මැන සුවාමිනි

සිල් සමාහිත නුවණ දසබල බැබළ වූ සම්බුදු රජාණෙනි
උතුම් සදහම් රසය පැතිරූ ලොවේ අසදිස දම් රජාණෙනි
මල් පහන් හා සුවඳ දුම් මේ සිසිල් පැන් හා ගිලන්පස ගෙන
පුදමි සම්බුදු පියාණෙනි මම අම නිවන් සුවයම පතාගෙන

**සාධු...! සාධු...!! සාධු...!!!**

## 04. කකුසඳ බුදු රජුන්

උදා හිරු නුබ දිලෙන විලසින් ලොවට වැඩි සම්බුදු රජාණෙනි
මහරි රුක් සෙවණේදී බුදු රැස් විහිදුවාලූ දම් රජාණෙනි
නමින් කකුසඳ ලෙසින් තුන් ලොව පිදුම් ලබනා බුදු පියාණෙනි
දෑත නළලේ තබා වඳිනා වැඳුම් පිළිගත මැන සුවාමිනි

සොවින් වැලපෙන ලොවෙහි සැනසුම සදාලූ සම්බුදු රජාණෙනි
අමා සැප දෙන නිවන් මග තුන් ලොවට හෙළි කළ නියමුවාණෙනි
මල් පහන් හා සුවඳ දුම් මේ සිසිල් පැන් හා ගිලන්පස ගෙන
පුදමි සම්බුදු පියාණෙනි මම අම නිවන් සුවයම පතාගෙන

**සාධු...! සාධු...!! සාධු...!!!**

## 05. කෝණාගමන බුදු රජුන්

කෙළෙස් මල හැර නිවන් සුවඳින් හදම සැනසූ මුණි රජාණෙනි
දිඹුල් රුක් සෙවණේදී බුදු රැස් විහිදුවාලූ දම් රජාණෙනි
නමින් කෝණාගමන ලෙස ලොව පිදුම් ලබනා බුදු පියාණෙනි
දෑත නළලේ තබා වඳිනා වැඳුම් පිළිගත මැන සුවාමිනි

මහා කරුණා නෙතින් ලෝ සත නිතින් සැනසූ බුදු පියාණෙනි
අමා රැස් පිරි නිවන් අහසේ දිලෙන සඳ වැනි ගුණවතාණෙනි
මල් පහන් හා සුවඳ දුම් මේ සිසිල් පැන් හා ගිලන්පස ගෙන
පුදමි සම්බුදු පියාණෙනි මම අම නිවන් සුවයම පතාගෙන

**සාධු...! සාධු...!! සාධු...!!!**

## 06. කාශ්‍යප බුදු රජුන්

ලොවේ සැම දුක් නිවා සනහා නිවන පැතිරූ මුණි රජාණෙනි
නුග රුකක් සෙවණේදී බුදු රැස් විහිදුවාලූ දම් රජාණෙනි
නමින් කස්සප ලෙසින් තුන් ලොව පිදුම් ලබනා බුදු පියාණෙනි
දෑත නළලේ තබා වඳිනා වැඳුම් පිළිගත මැන සුවාමිනි

ලොවට සැනසුම උදා කළ දම් ඔසුව සැදූ සම්බුදු රජාණෙනි
සැමට සසරින් එතෙර වී යන මග විවර කළ නියමුවාණෙනි
මල් පහන් හා සුවඳ දුම් මේ සිසිල් පැන් හා ගිලන්පස ගෙන
පුදමි සම්බුදු පියාණෙනි මම අම නිවන් සුවයම පතාගෙන

**සාධු...! සාධු...!! සාධු...!!!**

## 07. ගෞතම බුදු රජුන්

පුරා දස පාරමී බුදු බල ලොවට වැඩි මහ ගුණවතාණෙනි
ඇසතු රුක් සෙවණේදී බුදු රැස් විහිදුවාලූ මුණි රජාණෙනි
නමින් ගෞතම ලෙසින් තුන් ලොව පිදුම් ලබනා බුදු පියාණෙනි
දෑත නළලේ තබා වඳිනා වැඳුම් පිළිගත මැන සුවාමිනි

සසර අඳුරේ වැතිර හුන් අප දෙනෙත් හෙළි කළ මුණි රජාණෙනි
සියලු දුක් නිම කරන මොක් මග විවර කර දුන් බුදු රජාණෙනි
මල් පහන් හා සුවඳ දුම් මේ සිසිල් පැන් හා ගිලන්පස ගෙන
පුදමි සම්බුදු පියාණෙනි මම අම නිවන් සුවයම පතාගෙන

**සාධු...! සාධු...!! සාධු...!!!**

සිත් සතන් කෙලෙසුන් කෙරෙන් නිති මුදා පතමින් මොක් අමාව ම
සත් බුදුන් - මුණි රජුන් සිහි කර සදා නමදිම් සිත් බැතින් ම ම
මෙත් හදින් ලෝ සතට පතුරා දුක් නිවන සදහම් ප්‍රභාව ම
සත් බුදුන් - මුණි රජුන් හෙළි කළ මගින් එතෙරට පමුණුවම් සැ ම

**සාධු...! සාධු...!! සාධු...!!!**

## මහානිසංස සහිත උතුම් අටවිසි බුද්ධ වන්දනාව

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස!!!

වන්දේ තණ්හංකරං බුද්ධං - වන්දේ මේධංකරං මුණිං
සරණංකරං මුණිං වන්දේ - දීපංකරං ජිනං නමේ

වන්දේ කොණ්ඩඤ්ඤ සත්ථාරං - වන්දේ මංගල නායකං
වන්දේ සුමන සම්බුද්ධං - වන්දේ රේවත නායකං

වන්දේ සෝභිත සම්බුද්ධං - අනොමදස්සි මුණිං නමේ
වන්දේ පදුම සම්බුද්ධං - වන්දේ නාරද නායකං

පදුමුත්තරං මුණිං වන්දේ - වන්දේ සුමේධ නායකං
වන්දේ සුජාත සම්බුද්ධං - පියදස්සිං ජිනං නමේ

අත්ථදස්සි මුණිං වන්දේ - ධම්මදස්සි ජිනං නමේ
වන්දේ සිද්ධත්ත සත්ථාරං - වන්දේ තිස්ස මහා මුණිං

වන්දේ ඵුස්ස මහාවීරං - වන්දේ විපස්සි නායකං
සිඛී මහා මුණිං වන්දේ - වන්දේ වෙස්සභූ නායකං

කකුසංධං මුණිං වන්දේ - වන්දේ කෝණගමන නායකං
කස්සපං සුගතං වන්දේ - වන්දේ ගෝතම නායකං

අට්ඨවීසතිමෙ බුද්ධා - නිබ්බාණං සුඛදායකා
අහං නමාමි සිරසා නිච්චං - තේපි මං රක්ඛන්තු සබ්බදා

**සාධු! සාධු!! සාධු!!!**

## අටවිසි බුද්ධ වන්දනා කවි

01. තණ්හා දුරු කොට නිවනම පැදූ
තණ්හංකර මුණි වඳිනෙමි සාදූ

02. පාදන් මොක් මග බුදු බව සැදූ
මේධංකර මුණි වඳිනෙමි සාදූ

03. සරණක් වී තුන් ලොව සෙත සැදූ
සරණංකර මුණි වඳිනෙමි සාදූ

04. දීපාලෝකය වී නෙත් පැදූ
දීපංකර මුණි වඳිනෙමි සාදූ

05. සුන් කර සව් කෙළෙසුන් සිත සැදූ
කොණ්ඩඤ්ඤය මුණි වඳිනෙමි සාදූ

06. මංගල අම මොක් සත හට සැදූ
මංගල මුණි රජ වඳිනෙමි සාදූ

07. සමනය කර කෙළෙසුන් සිත පැදූ
සුමන මුණිඳු මම වඳිනෙමි සාදූ

08. පා මෙත සතහට මොක් මග සැදූ
රේවත මුණි රජ වඳිනෙමි සාදූ

09. ලෝසත වෙත නිවනේ සුව පැදූ
සෝභිත මුණි රජ වඳිනෙමි සාදූ

10. දෙනෝදහක් දන හට සෙත සැදූ
අනෝමදස් මුණි වඳිනෙමි සාදූ

11. සඳුව අමා බුදු රැස් ලොව විහිදූ
පදුම මුණිඳු වඳිනෙමි නිති සාදූ

12. බෝරද මුලදී මරසෙන් පැරදූ
නාරද මුණි රජ වඳිනෙමි සාදූ

13. හදවත් මොක් සිසිලෙන් නිති සේදූ
පදුමුත්තර මුණි වඳිනෙමි සාදූ

14. විවාද දුරු කොට මොක් මග සැදූ
සුමේධ මුණි රජ වඳිනෙමි සාදූ

15. අජාත නිවනෙහි අම සුව පැදූ
සුජාත මුණි රජ වඳිනෙමි සාදූ

16. සිය සිත්හී සැම මර බල පැරදූ
පියදස්සී මුණි වඳිනෙමි සාදූ

17. අර්ථ සදන නිවනට මග පැදූ
අත්ථදස්සි මුණි වඳිනෙමි සාදූ

18. ධම්ම නදින් සතහට අම සැදූ
ධම්මදස්සි මුණි වදිනෙමි සාදූ

19. බුදුසිත් හෙළිකොට ලොව සෙත් සැදූ
සිදුහත් මුණි රජ වදිනෙමි සාදූ

20. ඇස් ඉස් මස් දී බුදු බව සැදූ
තිස්ස මුණිඳු මම වදිනෙමි සාදූ

21. රැස්ව සිටිය මර බලසෙන් පැරදූ
ඵුස්ස මුණිඳු මම වදිනෙමි සාදූ

22. තපස් ගුණය ලොව සැම තැන විහිදූ
විපස්සි මුණි රජ වදිනෙමි සාදූ

23. කිපී පැමිණි වසවත් බල පැරදූ
සිඛී මුණිඳු මම වදිනෙමි සාදූ

24. තිස්සෙම සත් ලොව මෙත් සිත පැදු
වෙස්සභූ මුණි රජ වදිනෙමි සාදූ

25. ඉර සඳ මෙන් ලොව බුදු බල විහිදූ
කකුසඳ මුණි රජ වදිනෙමි සාදූ

26. පානා අම සිසිලෙන් සෙත සැදූ
කෝණාගම මුණි වදිනෙමි සාදූ

27. විස්මිත බුදු බල ලොවටම විහිදූ
කස්සප මුණි රජ වදිනෙමි සාදූ

28. සව්සත වෙත අම මොක් මග සැදූ
ගෞතම අප මුණි වඳිනෙමි සාදූ

ලොව්තුරු ගුණ සිහි කර අම පැදූ
පව් දුරු කර මම වඳිනෙමි සාදූ

මට මෙත් සව්සත හට සුව සැදූ
අටවිසි බුදු රජ වඳිනෙමි සාදූ

අමා දියෙන් සැම පව් මල සේදූ
නිමා නොවන බුදු ගුණයට සාදූ

**සාධු! සාධු! සාධු!**

## අටවිසි බුද්ධ පූජාව

යාවතා භගවා ලෝකේ - තිට්ඨෙය්‍යය තව සාසනං
තාවතා පතිගණ්හාතු - පූජා ලෝකානුකම්පයා

## පහන් පිදීම

තණ්හංකරාදයො බුද්ධා - අට්ඨවීසති නායකා
පතිගණ්හාතු මං සබ්බං - දීපෙන සාධු පූජිතං

ගන්ධ තේලප්ප දිත්තේන - දීපේන තමධංසිනා
තිලෝක දීපං සම්බුද්ධං - පූජයාමි තමෝනුදං

## සුවඳ ධූප පිදීම

තණ්හංකරාදයො බුද්ධා - අට්ඨවීසති නායකා
පතිගණ්හාතු මං සබ්බං - සුගන්ධිකායං සාධු වරං

සුගන්ධිකාය වදනං - අනන්ත ගුණ ගන්ධිනා
සුගන්ධිනාහං ගන්ධෙන - පූජයාමි තථාගතං

## මල් පිදීම

තණ්හංකරාදයො බුද්ධා - අට්ඨවීසති නායකා
පතිගණ්හාතු මං සබ්බං - පුප්ඵානං සාධු පූජිතං

වණ්ණ ගන්ධ ගුණෝපේතං - ඒතං කුසුම සන්තතිං
පූජයාමී මුණින්දස්ස - සිරීපාද සරෝරුහේ

පූජේමි බුද්ධං කුසුමේන නේන -
පුඤ්ඤේන මේතේන ලභාමි මොක්ඛං
පුප්ඵං මිලායාති යථා ඉදම්මෙ -
කායෝ තථා යාති විනාස භාවං

## දැහැත් පිදීම

තණ්හංකරාදයො බුද්ධා - අට්ඨවීසති නායකා
පතිගණ්හාතු මං සබ්බං - තාම්බූලං සාධු වරං
නාගවල්ලි දළ පේතං - චුණ්ණ පූග සමායුතං
තාම්බුලං පතිගණ්හාතු - සකප්පුරම් දං ජිනෝ

## සිසිල් පැන් පිදීම

තණ්හංකරාදයො බුද්ධා - අට්ඨවීසති නායකා
පතිගණ්හාතු මං සබ්බං - පානීයං සාධු පූජිතං
සුගන්ධං සීතලං කප්පං - පසන්න මධුරං සුභං
පානිය මේතං භගවා - පතිගණ්හාතු මුත්තමං

## ගිලන්පස පිදීම

තණ්හංකරාදයො බුද්ධා -  අට්ඨවීසති නායකා
පතිගණ්හාතු මං සබ්බං -  ගිලාන පච්චයං වරං
අධිවාසේතු නෝ භන්තේ - ගිලාන පච්චයං ඉමං
අනුකම්පං උපාදාය  - පතිගණ්හාතු මුත්තමං

දීපෙහි ගන්ධ ධූපෙහි - ගිලාන පච්චයෙහිච
පුප්ඵාදී වත්ථු ජාතෙහි - සුද්ධෙහි කප්පියෙහිච
අට්ඨවීසතිමෙ බුද්ධා  - ලෝකග්ගා දේව පූජිතා
සුද්ධ චිත්තප්පසාදෙන -  භත්‍යාදරෙන පූජයේ

නිවේදයාමි සම්බුද්ධං - වීතරාගං මහාමුණිං
නිමන්තයාමි සුගතං - ලෝකජෙට්ඨං නරාසභං

**සාධු! සාධු! සාධු!**

# අටසිල් සමාදන් වන ආකාරය

සිල් දෙන භික්ෂූන් වහන්සේ වෙත එළඹ, පසඟ පිහිටුවා වැඳ උක්කුටියෙන් හෝ දණ බිම ගසා හෝ හිඳ දොහොත් මුදුනේ තබා වැඳගෙන, මේ වාක්‍යය කියා භික්ෂූන් වහන්සේගෙන් සිල් ඉල්ලා සිටීම කළ යුතු ය.

## සිල් ඉල්ලීමේ වාක්‍යය

**ඕකාස! අහං භන්තේ, තිසරණේන සද්ධිං අට්ඨංගුපෝසථ සීලං ධම්මං යාචාමි. අනුග්ගහං කත්වා සීලං දේථ මේ භන්තේ, අනුකම්පං උපාදාය. දුතියම්පි ඕකාස! අහං භන්තේ. තිසරණේන සද්ධිං අට්ඨංගුපෝසථ සීලං ධම්මං යාචාමි. අනුග්ගහං කත්වා සීලං දේථ මෙ භන්තේ අනුකම්පං උපාදාය. තතියම්පි ඕකාස! අහං භන්තේ. තිසරණේන සද්ධිං අට්ඨංගුපෝසථ සීලං ධම්මං යාචාමි. අනුග්ගහං කත්වා සීලං දේථ මේ භන්තේ. අනුකම්පං උපාදාය.**

සිල්දෙන භික්ෂූන් වහන්සේ විසින් "යං වදාමි තං වදේථ" යි කී කල්හි "ආම භන්තේ" යි කියා, නමස්කාරය කළ යුතු ය. ඉක්බිති භික්ෂූන් වහන්සේ කියවන පරිදි මතු දැක්වෙන සිකපද සමාදන් විය යුතු ය.

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස!!!

බුද්ධං සරණං ගච්ඡාමි
ධම්මං සරණං ගච්ඡාමි
සංඝං සරණං ගච්ඡාමි

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
තතියම්පි සංඝං සරණං ගච්ඡාමි

සිල් දෙන භික්ෂූන් වහන්සේ "තිසරණ ගමනං සම්පුණ්ණං" යි කී කල්හි "ආම භන්තේ" යි කියා උන් වහන්සේ කියවන පරිදි මේ සිකපද කියනු.

**පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි**
**අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි**
**අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි**
**මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි**
**සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි**
**විකාල භෝජනා වේරමණී සික්ඛාපදං සමාදියාමි**
**නච්ච ගීත වාදිත විසූක දස්සන මාලා ගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි**
**උච්චාසයන මහාසයනා වේරමණී සික්ඛාපදං සමාදියාමි**

මේ සිකපද අට කියවා නිම වූ පසු සිල් දෙන භික්ෂූන්වහන්සේ විසින් "**තිසරණෙන සද්ධිං අට්ඨංගුපෝසථ සීලං ධම්මං සාධුකං සුරක්ඛිතං කත්වා අප්පමාදෙන සම්පාදේථ**" යි කී කල්හි "ආම භන්තේ" කියා ප්‍රතිඥා කළ යුතුය.

සිල් දෙන කෙනෙකු නැතිව තමා ම සිල් සමාදන්වන කල්හි සිල් ඉල්ලීමේ වාක්‍යය නො කියා නමස්කාරය හා "බුද්ධං සරණං ගච්ඡාමි" යනාදි පද නවය හා "පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි" යනාදි සිකපද අට කියා සිල් සමාදන් විය හැක.

# අටසිල් රැකිය යුතු ආකාරය

## (අඞ්ගුත්තරනිකාය / අට්ඨකාදිනිපාතපාළි / උපොසථවග්ග / සඞ්ඛිත්තූපොසථසුත්තං)

අට්ඨඞ්ගසමන්නාගතො, භික්ඛවෙ, උපොසථො උපවුත්ථො මහප්ඵලො හොති මහානිසංසො මහාජුතිකො මහාවිප්ඵාර ඉධ, භික්ඛවෙ, අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති.

මහණෙනි, අංග අටකින් යුත් පෙහෙවස් සමාදන්වූයේ මහත්ඵලය, මහානිශංසය. මහත් ආලෝක ඇත්තේය. මහත් පැතිරීම් ඇත්තේය. මහණෙනි, මෙහිදී ආර්යශ්‍රාවක තෙම මෙසේ සලකා බලයි.

යාවජීවං අරහන්තො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතා නිහිතදණ්ඩා නිහිතසත්ථා ලජ්ජී දයාපන්නා, සබ්බපාණභූතහිතානුකම්පිනො විහරන්ති. අහං පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො, සබ්බපාණභූතහිතානුකම්පී විහරාමි. ඉමිනාපඞ්ගෙන අරහතං අනුකරොමි, උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතී'ති. ඉමිනා පඨමෙන අඞ්ගෙන සමන්නාගතො හොති.

ජීවිතාන්තය තෙක් රහතුන් වහන්සේ පරපණ නැසීම හැර දමා, සතුන් මැරීමෙන් වෙන්වී, බහා තැබූ දඬු ඇතිව, බහා තැබූ ආයුධ ඇතිව, ලජ්ජා ඇතිව, දයාවට පැමිණ, සියලු ප්‍රාණභූතයන්ට හිත අනුකම්පා ඇතිව වසත්. මමද අද මේ රැය, මේ දවස, පරපණ නැසීම හැර දමා, සතුන් මැරීමෙන් වෙන්ව, බහා තැබූ දඬු ඇතිව, බහා තැබූ ආයුධ ඇතිව, ලජ්ජා ඇත්තේ, දයාවට පැමිණියේ, සියලු ප්‍රාණභූතයන්ට හිත අනුකම්පා ඇත්තේ වසමි. මේ අංගයෙනුත් රහතුන් වහන්සේ අනුකරණය කරමි. මා විසින් පෙහෙවස් සමාදන්ව විසුයේද වන්නේය, යි මේ පළමුවන අංගයෙන් යුක්තවූයේ වෙයි.

යාවජීවං අරහන්තො අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතා දින්නාදායී දින්නපාටිකඞ්ඛී, අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරන්ති. අහං පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො දින්නාදායී දින්නපාටිකඞ්ඛී, අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරාමි. ඉමිනාපඞ්ගෙන අරහතං අනුකරොමි, උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතී'ති. ඉමිනා දුතියෙන අඞ්ගෙන සමන්නාගතො හොති.

ජීවිතාන්තය තෙක් රහතුන් වහන්සේ අනුන් නොදුන් දෙය ගැනීමෙන් තොරව, දුන් දෙය ගන්නේ, දුන් දෙය බලාපොරොත්තු වන්නේ, ඉක්බිති මේ පිරිසිදුවූ ආත්මයෙන් වෙසෙත්ද, මමද අද මේ රැය, මේ දවස, නුදුන් දෙය ගැන්ම හැර දමා, සොරකමෙන් වෙන්වූයේ, දුන් දෙය ගන්නේ දුන් දෙය බලාපොරොත්තුවන්නේ, ඉක්බිති මේ පිරිසිදුවූ ආත්මයෙන් වසමි. මේ අංගයෙනුත් රහතුන් වහන්සේ අනුකරණය කරමි. මා විසින් පෙහෙවස් සමාදන්ව විසුයේද වන්නේය, යි මේ දෙවන අංගයෙන් යුක්තවූයේ වෙයි.

යාවජීවං අරහන්තො අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරිනො ආරාචාරිනො විරතා මෙථුනා ගාමධම්මා. අහං පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා. ඉමිනාපඞ්ගෙන අරහතං අනුකරොමි, උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතී'ති. ඉමිනා තතියෙන අඞ්ගෙන සමන්නාගතො හොති.

ජීවිතාන්තය තෙක් රහතුන් වහන්සේ කාම සේවනය සහමුලින්ම හැර දමා බඹසර රකින්නේ, දුරුව හැසිරෙන්නේ, දෙදෙනෙකුගේ හැසිරීම වූ ග්‍රාම්‍ය ක්‍රියාවෙහි නොඇලුණේද, මමද අද මේ රැය, මේ දවාල, කාම සේවනය හැර, කාම සේවනයෙන් තොර බඹසර රකින්නේ, දුරුව හැසිරෙන්නේ, දෙදෙනෙකුගේ හැසිරීම වූ ග්‍රාම්‍ය ක්‍රියාවෙහි නොඇලුණේ වෙමි. මේ අංගයෙනුත් රහතුන් වහන්සේ

අනුකරණය කරමි. මා විසින් පෙහෙවස් සමාදන්ව විසුයේද වන්නේය, යි මේ තුන්වන අංගයෙන්ද යුක්තවූයේ වෙයි.

යාවජීවං අරහන්තො මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතා සච්චවාදිනො සච්චසන්ධා ථෙතා පච්චයිකා අවිසංවාදකො ලොකස්ස. අහං පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. ඉමිනාපඞ්ගෙන අරහතං අනුකරොමි, උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතී'ති. ඉමිනා චතුත්ථෙන අඞ්ගෙන සමන්නාගතො හොති.

ජීවිතාන්තය තෙක් රහතුන් වහන්සේ බොරුකීම හැරදමා, බොරු කීමෙන් වෙන්වූයේ, ඇත්ත කියන්නේ, ඇත්තට බැඳී ඇත්තේ, ඇදහිය යුතුවූයේ, විශ්වාස කළ හැකි වූයේ, ලෝකයාට නොගැළපෙන කියුම් නැත්තේ වෙත්. මමද අද මේ රැය, මේ දවාල, බොරුකීම හැර දමා, බොරු කීමෙන් වෙන්ව, සත්‍යය කියන්නේ, සත්‍යය බලාපොරොත්තු වන්නේ වෙමි. මේ අංගයෙනුත් රහතුන් වහන්සේ අනුකරණය කරමි. මා විසින් පෙහෙවස්ද සමාදන් වූයේ වන්නේය, යි මේ සතරවන අංගයෙන් යුක්තවූයේ වෙයි.

යාවජීවං අරහන්තො සුරාමෙරයමජ්ජපමාදට්ඨානං පහාය සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතා. අහං පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං සුරාමෙරයමජ්ජපමාදට්ඨානං පහාය සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො. ඉමිනාපඞ්ගෙන අරහතං අනුකරොමි, උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතී'ති. ඉමිනා පඤ්චමෙන අඞ්ගෙන සමන්නාගතො හොති.

ජීවිතාන්තය තෙක් රහතුන් වහන්සේ රහමෙර මත් ද්‍රව්‍යයන්හි පමාව සිටීම හැර, රහමෙර මත් ද්‍රව්‍යවල ප්‍රමාදව සිටීමෙන් වෙන්වේද, මමද අද මේ රැය, මේ දාවල, රහමෙර පානය හැර

දමා, රහමෙර පානයෙන් වෙන්ව, වසමි. මේ අංගයෙනුත් රහතුන් වහන්සේ අනුකරණය කරමි. මා විසින් පෙහෙවස් සමාදන්ව විසුයේද වන්නේය, යි මේ පස්වන අංගයෙන්ද යුක්තවූයේ වෙයි.

යාවජීවං අරහන්තො එකභත්තිකා රත්තූපරතා විරතා
විකාලභොජනා. අහං පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං
එකභත්තිකො රත්තූපරතො විරතො විකාලභොජනා.
ඉමිනාපඞ්ගෙන අරහතං අනුකරොමි, උපොසථො ච
මෙ උපවුත්ථො භවිස්සතී'ති. ඉමිනා ඡට්ඨෙන අඞ්ගෙන
සමන්නාගතො හොති.

ජීවිතාන්තය තෙක් රහතුන් වහන්සේ එකම බතක් වළඳන්නේ, විකාල (නොකල) කෑමෙන් රෑ වෙන්වූයේ, නොඇලුණේ වෙත්. මමද මේ රැය, මේ දාවල, විකාල භෝජනයෙන් වැළකෙන්නේ, විකාල භෝජනයෙන් වෙන්ව, වසමි. මේ අංගයෙනුත් රහතුන් වහන්සේ අනුකරණය කරමි. මා විසින් පෙහෙවස් සමාදන්ව විසුයේද වන්නේයයි මේ හයවන අංගයෙන්ද යුක්තවූයේ වෙයි.

යාවජීවං අරහන්තො නච්චගීතවාදිතවිසූකදස්සනමාලා
ගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානං
පහාය නච්චගීතවාදිතවිසූකදස්සනමාලා
ගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා
පටිවිරතා. අහං පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච
දිවසං නච්චගීතවාදිතවිසූකදස්සනමාලා
ගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානං
පහාය නච්චගීතවාදිතවිසූකදස්සනමාලා
ගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො.
ඉමිනාපඞ්ගෙන අරහතං අනුකරොමි, උපොසථො ච මෙ
උපවුත්ථො භවිස්සතී'ති. ඉමිනා සත්තමෙන අඞ්ගෙන
සමන්නාගතො හොති.

ජීවිතාන්තය තෙක් රහතුන් වහන්සේ නැටීම්, ගී කීම්, බෙර ගැසීම්, උසුළු විසුළු බැලීම්, මල්දම් සුවඳ විලවුන් දැරීම, පැලඳීම, සැරසීම යන කරුණු වලින් වැළකුණේ වෙයි. මමද අද මේ රැය, මේ දවස, නැටීම්, ගී කීම්, බෙර ගැසීම්, උසුළු විසුළු බැලීම්, මල්දම් සුවඳ විලවුන් දැරීම, පැලඳීම, සැරසීම යන කරුණු වලින් වැළකුණේ, නැටීම්, ගී කීම්, බෙර ගැසීම්, උසුළු විසුළු බැලීම්, මල්දම් සුවඳ විලවුන් දැරීම, පැලඳීම, සැරසීම යන කරුණු වලින් වෙන්ව, වසමි. මේ අංගයෙනුත් රහතුන් වහන්සේ අනුකරණය කරමි. මා විසින් පෙහෙවස් සමාදන්ව විසුයේද වන්නේයයි මේ සත්වන අංගයෙන් යුක්තවූයේ වෙයි.

යාවජීවං අරහන්තො උච්චාසයනමහාසයනං පහාය
උච්චාසයනමහාසයනා පටිවිරතා නීචසෙය්‍යං කප්පෙන්ති
- මඤ්චකෙ වා තිණසන්ථාරකෙ වා. අහං පජ්ජ ඉමඤ්ච
රත්තිං ඉමඤ්ච දිවසං උච්චාසයනමහාසයනං පහාය
උච්චාසයනමහාසයනා පටිවිරතො නීචසෙය්‍යං කප්පෙමි -
මඤ්චකෙ වා තිණසන්ථාරකෙ වා. ඉමිනාපඞ්ගෙන අරහතං
අනුකරොමි , උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතී'ති.
ඉමිනා අට්ඨමෙන අඞ්ගෙන සමන්නාගතො හොති.

ජීවිතාන්තය තෙක් රහතුන් වහන්සේ උස් අසුන්, මහ අසුන් හැර, උස් අසුන් මහ අසුන් වලින් වෙන්ව, මැස්සක හෝ, තණ ඇතිරියක හෝ, පැදුරෙහි නිදීම කරන්නේ වේද, මමද මේ රැය, මේ දවාල, උස් අසුන් මහ අසුන් හැර, උස් අසුන් මහ අසුන්වලින් වෙන්ව, වැළකෙන්නේ, උස් අසුන් මහ අසුන් හැර, උස් අසුන් මහ අසුන්වලින් වෙන්ව, වසමි. මේ අංගයෙනුත් රහතුන් වහන්සේ අනුකරණය කරමි. මා විසින් පෙහෙවස් සමාදන්ව විසුයේද වන්නේයයි මේ අටවැනි අංගයෙන්ද යුක්තවූයේ වෙයි.

පාණං න හඤ්ඤෙ න චදින්නමාදියෙ -
මුසා න භාසෙ න ච මජ්ජපො සියා
අබ්‍රහ්මචරියා විරමෙය්‍ය මෙථුනා -
රත්තිං න භුඤ්ජෙය්‍ය විකාලභොජනං

මාලං න ධාරෙ න ච ගන්ධමාචරෙ -
මඤ්චෙ ඡමායං ව සයෙථ සන්ථතෙ
එතඤ්හි අට්ඨඞ්ගිකමාහුපොසථං -
බුද්ධෙන දුක්ඛන්තගුනා පකාසිතං

චන්දො ච සුරියො ච උභො සුදස්සනා -
ඕභාසයං අනුපරියන්ති යාවතා
තමොනුදා තෙ පන අන්තලික්ඛගා -
නභෙ පභාසන්ති දිසාවිරොචනා

එතස්මිං යං විජ්ජති අන්තරෙ ධනං -
මුත්තා මණි වෙළුරියඤ්ච භද්දකං
සිඞ්ගීසුවණ්ණං අථ වාපි කඤ්චනං -
යං ජාතරූපං හටකන්ති වුච්චති

අට්ඨඞ්ගුපෙතස්ස උපොසථස්ස -
කලම්පි තෙ නානුභවන්ති සොළසිං
චන්දප්පභා තාරගණා ච සබ්බෙ -
තස්මා හි නාරී ච නරො ච සීලවා
අට්ඨඞ්ගුපෙතං උපවස්සුපොසථං -
පුඤ්ඤානි කත්වාන සුඛුද්‍රයානි
අනින්දිතා සග්ගමුපෙන්ති ඨාන’න්ති.

පණ නොනසව. නොදුන් දෙය නොගනුව. බොරු නොකියව, මත්පැන් බොන්නෙක් නොවව. දෙදෙනෙකුගේ හැසිරීමවූ අබ්‍රහ්මචර්යාවෙන් වෙන් වුව. රැය නොකල්හි කෑම නොකව. මල්දම් නොදරව. සුවඳ නොගනුව. පොළොවේ මෙන් මැස්සෙහිද,

තෘෂ්ණා ඇතිරියේද නිදව. මෙය දුක් කෙළවරට ගිය බුදුන් පැවසූ අංග අටින් යුත් පෙහෙවසයයි කියත්.

ඉරද, සඳද දෙදෙනා මනාව පෙනෙමින් එළිය පතුරුවත්ද, අහසේ හැසිරෙන, අඳුරු දුරලන, දිගුන් බබුළුවන ඔවුහු වනාහි අහසේ දිලිසෙත්. මේ අතර මුතුය, මැණික්ය, උසස් වෛදූර්යයය, රත්‍රන්ද, එසේම රන්ද, යමක් ජාතරූපය හටකය කියාද, එයද සියලු චන්ද්‍ර ප්‍රභාවද, ඒ තාරකා සමූහයද, අංග අටින් යුත් පෙහෙවීමට දහසයින් අඩකුත් සමාන නොවේ. එබැවින් ස්ත්‍රීහුද, පුරුෂයෝද, සිල්වත්වූවාහු, අංග අටින් යුත් පෙහෙවීම සමාදන්ව වසත්වා. සැප විපාක ඇති, පින් කර නින්දාවට නොගියාහු ස්වර්ග භූමියට එළඹෙත්.

# සිත නිවන සමථ භාවනා

බුද්ධානුස්සති භාවනාව, මෛත්‍රී භාවනාව, අසුභ භාවනාව, මරණානුස්සති භාවනාව යන මේ සතර, සියලු අරිය ශ්‍රාවකයන් විසින් නො හළ යුතු භාවනා සතරකි. සාමාන්‍යයෙන් දිනකට වරක් දෙකක් වුව ද ඒ භාවනා සිහි කරන්නා හට, එයින් ශ්‍රද්ධාවත්, සමාධියත්, සසර නොඇල්මත්, මග වැඩීමෙහි උනන්දුවත් ඇති වේ. එසේම අප්‍රමාණ කුසලයක්ද වැඩේ. නීවරණ පහ වීමෙන් සිත පිරිසිදු වේ. නීවරණ පහ කර චිත්ත ඒකාග්‍රතාව, චිත්ත සමාධිය වඩවන නිසාම, මේවා සමථ භාවනා ලෙස හැඳින්වේ. මේ භාවනා සතර, රාග, ද්වේෂ, මෝහ නසමින් මඟ වඩන අරිය ශ්‍රාවකයා හට මහත් ආරක්ෂාවක් ද වේ. එබැවින් එයට "චතුරාරක්ෂක සමථ භාවනා" යයි කියනු ලැබේ. අතීතයේ සිට භාවිත වූ, චතුරාරක්ෂක භාවනාවක් මෙහි දැක්වේ.

## බුද්ධානුස්සති භාවනාව

1. සවාසනේ කිලේසේ සෝ ඒකෝ සබ්බේ නිඝාතිය
   අහූ සුසුද්ධසන්තානෝ පූජානඤ්ච සදාරහෝ

ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වාසනා සහිත සකල ක්ලේශයන්ම නැසූ අතිශයින් ශුද්ධ සන්තාන ඇත්තාහ. දෙව් මිනිසුන් විසින් කරනු ලබන අනේක ප්‍රකාර පූජාවන්ට ද සුදුසු වූ සේක.

2. සබ්බකාලගතේ ධම්මේ සබ්බේ සම්මා සයං මුණි
   සබ්බාකාරේන බුජ්ඣිත්වා ඒකෝ සබ්බඤ්ඤුතං ගතෝ

ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අතීතානාගත වර්තමාන යන සර්වකාලයන්ට අයත් සියලු ධර්මයන් තමන් වහන්සේ විසින් ම මනා කොට අවබෝධ කර, එකලාව සර්වඥත්වයට පැමිණි සේක.

3. විපස්සනාදි විජ්ජාහි සීලාදි චරණේහි ච
   සුසමිද්ධේහි සම්පන්නෝ ගගනාභේහි නායකෝ

ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අතිශයින් සමෘධ වූ ආකාශය බඳු වූ විදර්ශනා ඥානාදි විද්‍යාවන්ගෙන් ද ශීලාදි චරණ ධර්මයන්ගෙන් ද යුක්ත වන සේක.

4. සම්මාගතෝ සුභං ඨානං අමෝසවචනෝ ච සෝ
   තිවිධස්සා පි ලෝකස්ස ඥාතා නිරවසේසතෝ

ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ පරමසුන්දර නිර්වාණයට මනා කොට පැමිණි සේක. නො හිස් නො වරදින වචන ඇති සේක. ත්‍රිවිධ වූ ලෝකය නිරවශේෂයෙන් දැන වදාළ සේක.

5. අනේකේහි ගුණෝඝෙහි සබ්බසත්තුත්තමෝ අහූ
   අනේකේහි උපායේහි නරදම්මේ දමේසි ච

ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ශීලාදි අනේක ගුණෝඝයන් කරණ කොට සකල සත්වයන්ට උත්තම වූ සේක. අනේකෝපායයෙන් අදම්‍ය පුද්ගලයන් දමනය කළ සේක.

6. ඒකෝ සබ්බස්ස ලෝකස්ස සබ්බඅත්ථානුසාසකෝ
   භාග්‍ය ඉස්සරියාදීනං ගුණානං පරමෝ නිධි

ඒ භාග්‍යවතුන් වහන්සේ සකල ලෝකයාට අසහාය සකලාර්ථානුශාසකයන් වහන්සේ වූ සේක. භාග්‍ය ඓශ්වර්යාදී ගුණයන්ගේ පරම නිධානය වූ සේක.

7. පඤ්ඤාස්ස සබ්බධම්මේසු කරුණා සබ්බජන්තුසු
   අත්තත්ථානං පරත්ථානං සාධිකා ගුණජෙට්ඨිකා

ඒ භාග්‍යවතුන් වහන්සේගේ සකල ධර්මයන් කෙරෙහි පවත්නා ප්‍රඥාව ද සකල සත්වයන් කෙරෙහි පවත්නා මහා කරුණාව ද ස්වාර්ථ පරාර්ථ දෙක සිදු කරන ප්‍රධාන ගුණ දෙකෙකි.

8. දයාය පාරමී චිත්වා පඤ්ඤායත්තානමුද්ධරී
   උද්ධරී සබ්බධම්මේ ච දයායඤ්ඤේ ච උද්ධරී

ඒ භාග්‍යවතුන් වහන්සේ සකල සත්වයන් කෙරෙහි පවත්නා මහා කරුණාවෙන් සමතිස් පෙරුම් දහම් සපුරා ප්‍රඥාවෙන් තමන් සසර සයුරෙන් නඟා ගත් සේක. සකල ධර්ම සමූහය ද දැන වදාළ සේක. කරුණාවෙන් අන්‍ය සත්වයන් ද සසර සයුරෙන් ගොඩ නැඟූ සේක.

9. දිස්සමානෝ පි තාවස්ස රූපකායෝ අචින්තියෝ
   අසාධාරණඤාණඩ්ඪේ ධම්මකායේ කථාව කා

ඇසට පෙනෙන්නා වූ ද ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ රූපකාය ද අචින්ත්‍ය ය. අසාධාරණ ඥානයන්ගෙන් පොහොසත් වූ උන් වහන්සේගේ ධර්ම කායය ගැන කවර කථා ද? එය අචින්ත්‍යම ය.

## මෛත්‍රී භාවනාව

1. සුඛී භවෙය්‍යය නිද්දුක්ඛෝ අහං නිච්චං අහං විය
   හිතා ච මෙ සුඛී හොන්තු මජ්ඣත්තාථ ච වේරිනෝ

මම නිරන්තරයෙන් සැප ඇත්තේ වෙම්වා! දුක් නැත්තේ වෙම්වා! මා මෙන් මා හට හිතවත් සත්වයෝ ද මධ්‍යස්ථයෝ ද වෛරීහු ද සුවපත් වෙත්වා!

2. ඉමම්හි ගාමක්ඛෙත්තම්හි සත්තා හොන්තු සුඛී සදා
   තතෝ පරඤ්ච රජ්ජේසු චක්කවාළේසු ජන්තුනෝ

මේ ගමෙහි සකල සත්වයෝ සැම කල්හි සුවපත් වෙත්වා! එයින් ඔබ රාජ්‍යවල සක්වළවල සත්වයෝ ද සැම කල්හි සුවපත් වෙත්වා.

3. සමන්තා චක්කවාළේසු සත්තානන්තේසු පාණිනෝ
   සුඛිනෝ පුග්ගලා භූථා අත්තභාවගතා සියුං

මේ සක්වළ හාත්පස අනන්ත චක්‍රවාටයන්හි සියලු සත්වයෝ සකල ප්‍රාණීහු සකල සත්වයෝ සකල භූතයෝ සකල ආත්මභාව පර්යාපන්නයෝ සුවපත් වෙත්වා!

4. තථා ඉත්ථී පුමා චේව අරියා අනරියා පි ච
   දෙවා නරා අපායට්ඨා තථා දසදිසාසු ච

එසේ ම සියලු ස්ත්‍රීහු ද, පුරුෂයෝ ද, ආර්යයෝ ද, අනාර්යයෝ ද, දෙවියෝ ද, මනුෂ්‍යයෝ ද, අපායිකයෝ ද සුවපත් වෙත්වා! දශදිශාවෙහි සකල සත්වයෝ ද සුවපත් වෙත්වා!

## අසුභ භාවනාව

1. වණ්ණ සණ්ඨාන ගන්ධේහි ආසයෝ කාසතෝ තථා
   පටික්කූලානි කායේ මේ කුණපානි ද්වීසෝළස

මාගේ ශරීරයෙහි ඇතුළත් මේ කේශාදි කුණප දෙතිස, පැහැයෙන් ද සටහනින් ද ගන්ධයෙන් ද ආශ්‍රයස්ථානයෙන් ද පිහිටි අවකාශයෙන් ද පිළිකුල් කටයුතු ය.

2. පතිතම්හා පි කුණපා ජේගුච්ඡං කායනිස්සිතං
   ආධාරෝ හි සුචි තස්ස කාහේතු කුණපේ ඨිතෝ

ශරීරයෙන් වෙන් ව වැටුණා වූ කුණපයට ද වඩා කයෙහි පවත්නා කුණපය පිළිකුල් ය. කුමක් හෙයින් ද යත්? වැටුණා වූ කුණපයා ගේ ආධාරය (පවත්නා තැන) පිරිසිදු ය. කයෙහි සිටි කුණපය වනාහි කුණපයෙහි ම පිහිටියේ ය. එහෙයිනි.

3. මීල්හේ කිමිව කායෝ යං අසුචිම්හි සමුට්ඨිතෝ
අන්තෝ අසුචි සම්පුණ්ණෝ පුණ්ණවච්චකුටී විය

මේ කය අසූචියෙහි උපදනා පණුවකු මෙන් අසූචියෙහි ම හටගත් දෙයකි. පිරුණු වැසිකිළියක් සෙයින් ඇතුළ ද අසූචියෙන් පිරී ඇත්තේ ය.

4. අසුචි සන්දතේ නිච්චං යථා මේදකථාලිකා
නානා කිමිකුලාවාසෝ පක්කචන්දනිකා විය

සිදුරු ඇති අමුමස් සැළියකින් මෙන් මේ ශරීරයෙන් නිරන්තරයෙන් මළමුත්‍රාදි අසූචි ගලන්නේ ය. මේ ශරීරය පල් වූ ගවරවලක් සෙයින් නා නා කෘමීන්ගේ වාසස්ථානයකි.

5. ගණ්ඩභූතෝ රෝගභූතෝ වණභූතෝ සමුස්සයෝ
අතේකිච්ඡෝති ජේගුච්ඡෝ පභින්න කුණපූපමෝ

මේ ශරීරය ගෙඩියක් වැනි ය. රෝගයක් වැනි ය. වණයක් වැනි ය. පිළියම් කිරීමට දුෂ්කර වූවකි, ඉතා පිළිකුලෙක, තැනින් තැනින් බිඳුණු කුණපයක් වැනි ය.

## මරණානුස්මෘති භාවනාව

1. මහාසම්පත්ති සම්පත්තා යථා සත්තා මතා ඉධ
තථා අහං මරිස්සාමි මරණං මම හෙස්සති

මහාසම්පත්තියට පැමිණියා වූ සත්වයෝ යම් සේ මළාහු ද එපරිද්දෙන් මම ද මැරෙමි. මගේ මරණය වන්නේ ය.

2. උප්පත්තියා සහේ වේදං මරණං ආගතං සදා
   මරණත්ථාය ඕකාසං වධකෝ විය ඒසති

මේ මරණය උත්පත්තිය සමඟ ම ආ එකකි. මාරයා සැම කල්හි ම මැරීම පිණිස වධකයෙකුමෙන් අවකාශයක් සොයන්නේ ය.

3. ඊසකං අනිවත්තන්තං සතතං ගමනුස්සුකං
   ජීවිතං උදයා අත්ථං සුරියෝ විය ධාවති

සැම කල්හි ගමනට උත්සාහ කරන ඇසිල්ලකුදු නො නවතින ජීවිතය, උදා වීමෙහි සිට අන්තයට යන හිරු මෙන්, උපතේ දී පටන් මරණය කරා දුවන්නේ ය.

4. විජ්ජුබුබ්බුල උස්සාව ජලරාජි පරික්ඛයං
   ඝාතකෝව රිපූ තස්ස සබ්බත්තාපි අවාරියෝ

විදුලියක් මෙන් දිය බුබුළක් මෙන් පිනි බිඳක් මෙන් දියෙහි ඇඳි ඉරක් මෙන් මේ ජීවිතය වහා ක්ෂය වන්නේය. මේ මරණය කවරාකාරයකින්වත් වැළැක්විය නොහෙන, මරන්නටම එන සතුරකු වැනි ය.

5. සුයසත්ථාම පුඤ්ඤිද්ධි බුද්ධි වුද්ධි ජිනද්වයං
   ඝාතෙසි මරණං ඛිප්පං කාතු මාදිසකේ කථා

මහත් වූ යසසින් ද ඍර්ධි බලයෙන් ද පිනෙන් ද නුවණින් ද වැඩුණා වූ ලොවුතුරා බුදු පසේ බුදු දෙනම ද මේ මාරයා වහා නැසුවේය. මා වැනියන් මැරීම ගැන කවර කථා ද?

6. පච්චයානඤ්ච වේකල්යා බාහිරජ්ඣත්තුපද්දවා
මරාමෝරං නිමේසාපි මරමානෝ අනුක්ඛණං

ක්ෂණයක් පාසා සිදුවන නාම රූප බිඳීම නිසා ක්ෂණයක් පාසා මැරෙන්නා වූ මම, ජීවත් වීමට වුවමනා ප්‍රත්‍යයන් නො ලැබීයැමෙන් ද, බාහ්‍යභ්‍යන්තරික උපද්‍රවයකින් ද, ඇසිපිය හෙළීමකට ද කෙටි කලෙකදී මැරෙමි.

**කායෙන අමතං ධාතුං, ඵුසයිත්වා නිරූපධිං**
**උපධිප්පටිනිස්සග්ගං, සච්ඡිකත්වා අනාසවො**
**දෙසෙති සම්මාසම්බුද්ධො, අසොකං විරජං පද'න්ති**

(කාමාදි) ආශ්‍රවයන් නැත්තා වූ, මනාව සත්‍යය අවබෝධ කළා වූ සර්වඥයන් වහන්සේ, (නාම) කයින් (මාර්ගඵලයන් ගෙන්) අමෘත ධාතුවට පැමිණ, උපධීන් දුරලීමට කරුණු වූ නිර්වාණය ප්‍රත්‍යක්ෂ කොට, ශොක නැත්තා වූ, කෙළෙස් රජස් නැත්තා වූ, නිර්වාණය දෙසන සේක.

# බෞද්ධයා යනු කවරෙක්ද?

බෞද්ධ යනු අවබෝධයකි. බෞද්ධ යනුවෙන් සම්මත පවුලක උපන් පමණින්, කෙනෙකුට බෞද්ධකම උරුම නොවේ.

බෞද්ධයා යනු ලොව්තුරු තථාගත බුද්ධ භාෂිතය හෙවත් උතුම් වූ ශ්‍රී සද්ධර්මය අසා අවබෝධ කළ ශ්‍රේෂ්ඨ සුතවත් අරිය ශ්‍රාවකයා ය. බෞද්ධයා යනු අකුසලයෙන් වෙන්ව, කුසලය වඩමින් සිත දමනය කරන ධීරවන්තයා ය. බෞද්ධයා යනු උතුම් වූ චතුරාර්ය සත්‍යය අවබෝධ කිරීමෙන් නිවන් මඟට පැමිණි ඥානවන්ත සත්පුරුෂයා ය. බෞද්ධයා යනු ආස්වාදය, කාමය නම් මාර ධර්මයන්හී ආදීනව නුවණින් විමසමින් චිත්ත සන්තානයේ ඇති සියලු රාග, ද්වේෂ, මෝහ නසමින්, කෙළෙස් ප්‍රහාණය කරමින්, නිවන් මඟ වඩමින්, භවය (කර්ම භවය) සහමුලින්ම උදුරා දමන සීලවන්ත, වීර්යවන්තයා ය. භවය (කර්ම භවය) සහමුලින්ම බිඳ දමන අර්ථයෙන් "බෞද්ධ" යන නාමය බිහිවේ.

එබැවින් යමෙකු උතුම් වූ බෞද්ධයෙකු වීමට නම් ප්‍රථමයෙන් බණ අසා, කුසලය කුමක්දැයි අවබෝධ කළ යුතු ය. උතුම් වූ චතුරාර්ය සත්‍යය තත් පරිදි අවබෝධ කළ යුතු ය.

## පින සහ කුසලය

ඇතැමෙක් පින සහ කුසලය එකක්යැයි වරදවා සිතති. පින හා කුසලය එක්ව ගමන් කළත්, පින යනු අනෙකකි. කුසලය යනු අනෙකකි.

තමාටද අනුන්ටද යහපතක් වන, යහපත් වූ කටයුත්තෙහි නියැලීමෙන් සිතෙහි ඇතිවන සතුට, ප්‍රීතිය යනු පිනයි. එවන් යහපත් වූ කටයුත්තෙහි නියැලීමට ඇති හැකියාව, එවන් කටයුතු උදෙසා සිත මෙහෙයවීමට ඇති හැකියාව කුසලයයි.

තමාටද අනුන්ටද අයහපතක් වන, අයහපත් වූ කටයුත්තෙහි නියැළීමෙන් සිතෙහි ඇතිවන තැවීම, තාපය යනු පාපයයි. එවන් අයහපත් වූ කටයුත්තෙහි නියැළීම, එවන් අයහපත් වූ කටයුතුවලින් සිත වළක්වා ගැනීමට ඇති නොහැකියාව අකුසලයයි.

**ඉධ නන්දති පෙච්ච නන්දති - කතපුඤ්ඤො උභයත්ථ නන්දතී**
**පුඤ්ඤං මේ කතන්ති නන්දති - භියොා් නන්දති සුග්ගතිං ගතෝ**

පින් කරන තැනැත්තා මෙලොවත් සතුටු වෙයි. පරලොවත් සතුටු වෙයි. දෙලොවම සතුටු වෙයි. මවිසින් මෙවැනි පින් කරන ලදැයි දෙලොවදීම සතුටු වෙයි. බොහෝ සෙයින් සතුටු වෙමින් සුගතියෙන් සුගතියටම යයි.

**ඉධ තප්පති පෙච්ච තප්පති - පාපකාරි උභයත්ථ තප්පති**
**පාපං මෙ කතං'ති තප්පති - භියොා් තප්පති දුග්ගතිං ගතො**

පව් කරන තැනැත්තා මෙලොවත් තැවෙයි. පරලොවත් තැවෙයි. දෙලොවදීම තැවෙයි. මවිසින් මෙවැනි පව් කරන ලදැයි දෙලොවදීම තැවෙයි. බොහෝ සෙයින් තැවෙමින් දුගතියෙන් දුගතියටම යයි.

**කුසලානං භික්ඛවේ ධම්මානං සමාදානහේතු ඒවමිදං පුඤ්ඤං පවඩ්ඪති.** මහණෙනි, කුසල ධර්ම සමාදන් කොට ගෙන පවත්නා හෙයින් මෙසේ මේ පින් වැඩෙයි.

පින ද කොටස් දෙකකට බෙදේ.

1. ඥාන විප්‍රයුක්ත පින
2. ඥාන සම්ප්‍රයුක්ත පින

ඥාන විප්‍රයුක්ත පින යනු, සසරෙහි ආදීනව, සසර දුක නොදැන, සසර පිළිබඳ අනවබෝධයෙන් යුක්තව, නැවත නැවත මේ බියකරු සසර තුළ ඉපදීමට ආශාවෙන් සිදු කරන පුණ්‍ය ක්‍රියා ය. උතුම් වූ චතුරාර්ය සත්‍යය අවබෝධ නොකොට, මුළාවෙන් යුක්තව සිදු කරන පුණ්‍ය ක්‍රියා බැවින්, එයට ඥාන විප්‍රයුක්ත පින් යැයි කියනු ලැබේ. අවිජ්ජා පච්චයා සංඛාරා යනුවෙන් ගොඩ නැගෙන පුණ්‍යාභිසංඛාරය මීට ඇතුළත් වේ.

ඥාන සම්ප්‍රයුක්ත පින යනු, උතුම් වූ චතුරාර්ය සත්‍යය අවබෝධයෙන් යුක්තව, සසරෙහි යථාර්ථය දැන, සසරින් අත මිදීම පිණිස නැවත නූපදීම අරමුණු කරගනිමින් සිදු කරන පුණ්‍ය ක්‍රියා ය. ආස්වාදය - කාමය මුළාවක්, අසාර වූ මායාවක් බවත්, විපතක් බවත්, දුක්ඛස්කන්ධය උදා කරන්නට හේතුවන මාර ධර්මය බවත් නුවණින් වටහාගෙන, සියලු රාග, ද්වේෂ, මෝහ ක්ෂය කරමින්, කර්ම භවය සහමුලින්ම උදුරා දැමීම (කර්ම භව නිරෝධය) සඳහා සිදු කරන පුණ්‍ය ක්‍රියා බැවින්, එයට ඥාන සම්ප්‍රයුක්ත පින් යැයි කියනු ලැබේ.

මින් ඥාන විප්‍රයුක්ත පින සසර සුගතියට උපකාර වේ. ඥාන සම්ප්‍රයුක්ත පින නිර්වාණ අවබෝධයට සහ නිවන් මඟ වැඩීමට හේතු වේ.

කුසලය යනු හැකියාව යන්නට පර්යාය පදයකි. කුසලය යනු සිත දමනය කිරීමේ හැකියාවයි. රාගයෙන්, ද්වේෂයෙන්, මෝහයෙන් ක්‍රියාත්මක වන මාරයා නම් වූ සිත, පාලනය කිරීමේ, මෙල්ල කිරීමේ, දමනය කිරීමේ හැකියාව කුසලයයි. ධර්මය තුළ ආකාර 3 කින් කුසලය විග්‍රහ වේ.

1. චිත්තස්ස දමථො කුසලො - සිත දමනය කිරීම කුසලයයි.
2. චිත්තං සික්ඛති කුසලො - සිත ශික්ෂණය කිරීම (හික්මවීම) කුසලයයි.
3. චිත්තස්ස සංවරො කුසලො - සිත සංවර කිරීම (සංයමය) කුසලයයි.

**ඵන්දනං චපලං චිත්තං, දූරක්ඛං දුන්නිවාරයං**
**උජුං කරොති මෙධාවී, උසුකාරොව තෙජනං**

සැලෙන්නාවූ, එක් අරමුණක නොසිටින්නා (චපල) වූ, රැකීම දුෂ්කර වූ, (තුන්) දුසිරිතින් නොවැළකිය හැක්කාවූ සිත, ප්‍රාඥවූ පුරුෂතෙම හීදණ්ඩක් (ඇද මැඩ) සකසන්නා වූ හී වඩුවා මෙන්, සෘජු කරන්නේය.

**දුන්නිග්ගහස්ස ලහුනො, යත්ථකාමනිපාතිනො**
**චිත්තස්ස දමථො සාධු, චිත්තං දන්තං සුඛාවහං**

නිග්‍රහ (දඬුවම්) කරන්ට නොපිළිවන් වූ, ලඝු වූ, යම් කැමති අරමුණක වැටෙන සුළුවූ, චිත්තයාගේ දමනය කිරීම මැනවි, සිත දමනය කරන ලද්දේ සුව එළවන්නේ ය.

**සුදුද්දසං සුනිපුණං, යත්ථකාමනිපාතිනං**
**චිත්තං රක්ඛෙථ මෙධාවී, චිත්තං ගුත්තං සුඛාවහං**

දක්නට නොපිළිවන්වූ, ඉතා සියුම්වූ, යම් කැමති අරමුණක් ගන්නා සුළුවූ සිත, ප්‍රාඥතෙම රක්නේයි. සිත රක්නා ලද්දේ (ලොවී ලොවිතුරා) සැප එළවන්නේය.

**දූරංගමං එකචරං, අසරීරං ගුහාසයං**
**යෙ චිත්තං සංයමෙස්සන්ති, මොක්ඛන්ති මාරබන්ධනා**

දුර ගමන් ඇත්තා වූ, හුදෙකලාවම හැසිරෙන්නා වූ, ශරීරයක් නැත්තා වූ, (ශරීරය නැමැති) ගුහාවෙහි වසන්නා වූ සිත, යම්කෙනෙක් සංවරයෙහි පිහිටුවත්ද, ඔහු මාරබන්ධනයයි කියන ලද ත්‍රෛභූමක වෘත්තයෙන් (මර බැම්මෙන්) මිදෙන්නාහුය.

කුසලය නැවත කොටස් දෙකකට බෙදේ.

1. ලෞකික කුසලය
2. ලෝකෝත්තර කුසලය

## ලෞකික කුසලය

පරපණ නැසීම, සොරකම, කාමයන්හි වරදවා හැසිරීම, බොරුකීම, කේළාම් කීම, ඵරුෂ වචන කීම, හිස් නිසරු වචන කීම, අභිධ්‍යාව (මටම වේවා - අනුන්ට නොවේවා යන ඉරිසියා සහගත දැඩි ලෝභකම), ව්‍යාපාදය (අනුන් නසන නපුරු අදහස් සහිත දැඩි ද්වේෂ හා වෛර සහගතබව), මිච්ඡා දිට්ඨිය (කර්මය හා කර්මඵල විශ්වාස නොකරන දැඩි අන්තවාදී අඥාන බව). යන දස අකුසලයෙන් වෙන් වී කටයුතු කිරීම ලෞකික කුසලයයි. ලෞකික කුසලයෙන් සුගති සැපය උදා වේ.

## ලෝකෝත්තර කුසලය

ඉදං ලෝකුත්තරං පුඤ්ඤම්පි යාව ආසවක්ඛයා පවඩ්ඪති. ලෝකෝත්තර කුසලයෙන් ආශ්‍රව (කෙළෙස්) ක්ෂය වෙයි, දුරු වෙයි.

ලෝකෝත්තර කුසලය යනු උතුම් චතුරාර්ය සත්‍යය අවබෝධ කොට, අවිජ්ජාව හා තෘෂ්ණාව දුරු කිරීමයි. එනම්, රාග (ලෝභ), ද්වේෂ, මෝහ දුරු කිරීමයි. රාගය (ලෝභය), ද්වේෂය, මෝහය සහමුලින්ම දුරු කිරීම නිවනයි. එකී නිවන උදෙසා කළ යුතු යමක්

ඇද්ද, එය ලෝකෝත්තර කුසලයයි. ලෝකෝත්තර කුසලයෙන් පරම නිර්වාණ සැපත සැලසේ.

## කුසලය හා අකුසලය

### (අඞ්ගුත්තරනිකාය / තිකනිපාතපාළි / මහාවග්ගො / අකුසලමූලසුත්තං)

තීණිමානි, භික්ඛවෙ, අකුසලමූලානි. කතමානි තීණි? ලොභො අකුසලමූලං, දොසො අකුසලමූලං, මොහො අකුසලමූලං.

මහණෙනි, මේ අකුසල මූලයෝ තිදෙනෙකි. කවර තිදෙනෙක්ද, ලෝභය අකුසල් මුලකි. දෝෂය අකුසල් මුලකි. මෝහය අකුසල් මුලකි.

යදපි, භික්ඛවෙ, ලොභො තදපි අකුසලමූලං, යදපි ලුද්ධො අභිසංඛරොති කායෙන වාචාය මනසා තදපි අකුසලං, යදපි ලුද්ධො ලොභෙන අභිභූතො පරියාදින්න චිත්තො පරස්ස අසතා දුක්ඛං උප්පාදයති, වධෙන වා බන්ධනෙන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා බලවම්හි බලත්ථො ඉතිපි තදපි අකුසලං. ඉතිස්සමෙ ලොභජා ලොභනිදානා ලොභසමුදයා ලොභපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති.

මහණෙනි, යම් ලෝභයක් වේද, එය අකුසලයකි. ලෝභයෙන් ඇලුණාවූ පුද්ගල තෙමේ, කයින්, වචනයෙන්, සිතින් යමක් රැස්කරයිද, එයද අකුසල් වෙයි. ඇලුණාවූ ලෝභයෙන් මඩනා ලද්දාවූ, විනාශ කරන ලද සිත් ඇත්තාවූ පුද්ගල තෙමේ, 'මම බලවතෙක්මි. බලය ප්‍රයෝජන කොට ඇත්තෙක් වෙමි' යි වධ කිරීමෙන් හෝ, බන්ධනයෙන් හෝ, ධනය විනාශ කිරීමෙන් හෝ, ගර්හා කිරීමෙන් හෝ, රටින් නෙරපීමෙන් හෝ, අසත්‍යයෙන් අන්‍යයාට දුක් උපදවාද, එයද අකුසල් වන්නේය. මෙසේ ඔහුට

ලෝභයෙන් හට ගන්නාවූ, ලෝභය නිදාන කොට ඇත්තාවූ, ලෝභය නිසා පහළ වන්නාවූ, ලෝභය ප්‍රත්‍යය කොට ඇත්තාවූ නොයෙක් ලාමක අකුසල ධර්මයෝ හටගනිත්.

යදපි, භික්ඛවෙ, දොසො තදපි අකුසලමූලං, යදපි දුට්ඨො අභිසංඛරොති කායෙන වාචාය මනසා තදපි අකුසලං, යදපි දුට්ඨො දොසෙන අභිභූතො පරියාදින්නචිත්තො පරස්ස අසතා දුක්ඛං උප්පාදයති, වධෙන වා බන්ධනෙන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා බලවම්හි බලත්ථො ඉතිපි තදපි අකුසලං. ඉතිස්සමෙ දොසජා දොසනිදානා දොසසමුදයා දොසපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති..

මහණෙනි, යම් ද්වේෂයක් වේද, එය අකුසලයකි. ද්වේෂයෙන් ඇලුණාවූ පුද්ගල තෙමේ, කයින්, වචනයෙන්, සිතින් යමක් රැස්කරයිද, එයද අකුසල් වෙයි. ඇලුණාවූ ද්වේෂයෙන් මඩනා ලද්දාවූ, විනාශ කරන ලද සිත් ඇත්තාවූ පුද්ගල තෙමේ, 'මම බලවතෙක්මි. බලය ප්‍රයෝජන කොට ඇත්තෙක් වෙමි' යි වධ කිරීමෙන් හෝ, බන්ධනයෙන් හෝ, ධනය විනාශ කිරීමෙන් හෝ, ගර්හා කිරීමෙන් හෝ, රටින් නෙරපීමෙන් හෝ, අසත්‍යයෙන් අන්‍යයාට දුක් උපදවාද, එයද අකුසල් වන්නේය. මෙසේ ඔහුට ද්වේෂයෙන් හට ගන්නාවූ, ද්වේෂය නිදාන කොට ඇත්තාවූ, ද්වේෂය නිසා පහළ වන්නාවූ, ද්වේෂය ප්‍රත්‍යය කොට ඇත්තාවූ නොයෙක් ලාමක අකුසල ධර්මයෝ හටගනිත්.

යදපි, භික්ඛවෙ, මොහො තදපි අකුසලමූලං, යදපි මූළ්හො අභිසංඛරොති කායෙන වාචාය මනසා තදපි අකුසලං, යදපි මූළ්හො මොහෙන අභිභූතො පරියාදින්නචිත්තො පරස්ස අසතා දුක්ඛං උප්පාදයති වධෙන වා බන්ධනෙන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා බලවම්හි බලත්ථො ඉතිපි තදපි අකුසලං. ඉතිස්සමෙ මොහජා මොහනිදානා මොහසමුදයා මොහපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති.

මහණෙනි, යම් මෝහයක් වේද, එයද අකුසලයකි. මෝහයෙන් ඇලුණාවූ පුද්ගල තෙමේ, කයින්, වචනයෙන්, සිතින් යමක් රැස්කරයිද, එයද අකුසල් වෙයි. ඇලුණාවූ මෝහයෙන් මඩනා ලද්දාවූ, විනාශ කරන ලද සිත් ඇත්තාවූ පුද්ගල තෙමේ, 'මම බලවතෙක්මි. බලය ප්‍රයෝජන කොට ඇත්තෙක් වෙමි' යි වධ කිරීමෙන් හෝ, බන්ධනයෙන් හෝ, ධනය විනාශ කිරීමෙන් හෝ, ගර්හා කිරීමෙන් හෝ, රටින් නෙරපීමෙන් හෝ, අසත්‍යයෙන් අන්‍යයාට දුක් උපදවාද, එයද අකුසල් වන්නේය. මෙසේ ඔහුට මෝහයෙන් හට ගන්නාවූ, මෝහය නිදාන කොට ඇත්තාවූ, මෝහය නිසා පහළ වන්නාවූ, මෝහය ප්‍රත්‍යය කොට ඇත්තාවූ නොයෙක් ලාමක අකුසල ධර්මයෝ හටගනිත්.

කස්මා චායං, භික්ඛවෙ, එවරූපො පුග්ගලො වුච්චති අකාලවාදීතිපි, අභූතවාදීතිපි, අනත්ථවාදීතිපි, අධම්මවාදීතිපි, අවිනයවාදීතිපි? තථාහායං, භික්ඛවෙ, පුග්ගලො පරස්ස අසතා දුක්ඛං උප්පාදයති වධෙන වා බන්ධනෙන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා බලවම්හි බලත්ථො ඉතිපි. භූතෙන ඛො පන වුච්චමානො අවජානාති, නො පටිජානාති, අභූතෙන වුච්චමානො න ආතප්පං කරොති, තස්ස නිබ්බෙඨනාය ඉතිපෙතං අතච්ඡං ඉතිපෙතං අභූතන්ති. තස්මා එවරූපො පුග්ගලො වුච්චති අකාලවාදීතිපි, අභූතවාදීතිපි, අනත්ථවාදීතිපි, අධම්මවාදීතිපි, අවිනයවාදීතිපි.

මහණෙනි, මෙබඳු පුද්ගල තෙමේ අකාලවාදීයයිද, අභූතවාදීයයිද, අනර්ථවාදීයයිද, අධර්මවාදීයයිද, අවිනයවාදීයයිද කියනු ලැබේ. මහණෙනි, කුමක් හෙයින් මේ පුද්ගල තෙමේ අකාලවාදීයයිද, අභූතවාදීයයිද, අනර්ථවාදීයයිද, අධර්මවාදීයයිද, අවිනයවාදීයයිද කියනු ලැබේද, මහණෙනි, යම් සේ මේ පුද්ගල තෙමේ 'මම බලවත් වෙමි. බලයෙන් ප්‍රයෝජන ඇත්තේ වෙමි' යි වධ කිරීමෙන් හෝ, හිර කිරීමෙන් හෝ, ධනය විනාශ කිරීමෙන් හෝ, නෙරපීමෙන් හෝ, අසත්‍යයෙන් අන්‍යයාට දුක් උපදවයිද, සත්‍යවූ පරිදි කියනු ලැබූ කල්හි හෙතෙමේ අවමන් කරයි. නොපිළිගනියි. අසත්‍යයෙන්

කියනු ලබන කල්හි එය මෙසේත් අසත්‍යයි, මෙසේත් අභූතයයි, එය පැටලුම් හැරීම පිණිස උත්සාහ නොකරයි. එහෙයින් මෙබඳු පුද්ගල තෙමේ අකාලවාදීයයිද, අභූතවාදීයයිද, අනර්ථවාදීයයිද, අධර්මවාදීයයිද, අවිනයවාදීයයිද කියනු ලැබේ.

එවරූපො, භික්ඛවෙ, පුග්ගලො ලොභජෙහි, දොසජෙහි, මොහජෙහි පාපකෙහි අකුසලෙහි ධම්මෙහි අභිභූතො පරියාදින්නචිත්තො දිට්ඨෙ චෙව ධම්මෙ දුක්ඛං විහරති, සවිඝාතං සඋපායාසං සපරිළාහං. කායස්ස ච භෙදා පරං මරණා දුග්ගති පාටිකඞ්ඛා.

මහණෙනි, මෙබඳු පුද්ගල තෙමේ ලෝභයෙන්, ද්වේෂයෙන්, මෝහයෙන් හටගන්නාවූ අකුසල ධර්මයන්ගෙන් මඩනා ලද්දේ, විනාශ කරන ලද සිත් ඇත්තේ, මේ ආත්මයෙහිම දුක් සහිතවූ, ශෝකයෙන් හට ගන්නාවූ, වෙහෙස සහිතවූ, දාහ සහිතවූ දුක් විඳිමින් වාසය කරයි. කය බිඳීමෙන් මරණින් පසු දුගතිය කැමති විය යුත්තේ ය.

තීණිමානි, භික්ඛවෙ, කුසලමූලානි. කතමානි තීණි? අලොභො කුසලමූලං, අදොසො කුසලමූලං, අමොහො කුසලමූලං.

මහණෙනි, මේ කුසල මූලයෝ තුනක් වෙත්. කවර තුනක්ද? මහණෙනි, අලෝභය කුසල මූලයකි. අද්වේෂය කුසල මූලයකි. අමෝහය කුසල මූලයකි.

යදපි, භික්ඛවෙ, අලොභො තදපි කුසලමූලං, යදපි අලුද්ධො අභිසංඛරොති කායෙන වාචාය මනසා තදපි කුසලං, යදපි අලුද්ධො ලොභෙන අනභිභූතො අපරියාදින්නචිත්තො න පරස්ස අසතා දුක්ඛං උප්පාදයති වධෙන වා බන්ධනෙන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා බලවම්හි බලත්ථො ඉතිපි තදපි කුසලං. ඉතිස්සමෙ අලොභජා අලොභනිදානා අලොභසමුදයා අලොභපච්චයා අනෙකෙ කුසලා ධම්මා සම්භවන්ති.

මහණෙනි, යම් අලෝභය වෙයිද, එය කුසලයකි. අලෝභී පුද්ගල තෙමේ කයින්, වචනයෙන්, සිතින් යමක් රැස් කරයිද, එයද කුසලයකි. ලෝභී නොවූ, ලෝභයෙන් නොමඩනා ලද, විනාශ නොකරන ලද සිත් ඇත්තාවූ පුද්ගල තෙමේ, 'මම බලවත් වෙමි, බලයෙන් ප්‍රයෝජන ඇත්තෙමි' යි හිංසා කිරීමෙන් හෝ, බන්ධනයෙන් හෝ, ධනය විනාශ කිරීමෙන් හෝ, ගර්හා කිරීමෙන් හෝ, රටින් නෙරපීමෙන් හෝ, අසත්‍යයෙන් අන්‍යයාට දුක් නූපදවයිද, එයද කුසලයකි. මෙසේ ඔහුට අලෝභයෙන් උපන්, අලෝභය නිදානකොට ඇත්තාවූ, අලෝභය නිසා පහළ වන්නාවූ, අලෝභය ප්‍රත්‍යකොට ඇත්තාවූ නොයෙක් කුසල් ධර්මයෝ හටගනිත්.

යදපි, භික්ඛවෙ, අදොසො තදපි කුසලමූලං, යදපි අදුට්ඨො අභිසංඛරොති කායෙන වාචාය මනසා තදපි කුසලං, යදපි අදුට්ඨො දොසෙන අනභිභූතො අපරියාදින්නචිත්තො න පරස්ස අසතා දුක්ඛං උප්පාදයති, වධෙන වා බන්ධනෙන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා බලවම්හි බලත්ථො ඉතිපි තදපි කුසලං. ඉතිස්සමෙ අදොසජා අදොසනිදානා අදොසසමුදයා අදොසපච්චයා අනෙකෙ කුසලා ධම්මා සම්භවන්ති.

මහණෙනි, යම් අද්වේෂය වෙයිද, එය කුසලයකි. අද්වේෂී පුද්ගල තෙමේ කයින්, වචනයෙන්, සිතින් යමක් රැස් කරයිද, එයද කුසලයකි. ද්වේෂී නොවූ, ද්වේෂයෙන් නොමඩනා ලද, විනාශ නොකරන ලද සිත් ඇත්තාවූ පුද්ගල තෙමේ, 'මම බලවත් වෙමි, බලයෙන් ප්‍රයෝජන ඇත්තෙමි' යි හිංසා කිරීමෙන් හෝ, බන්ධනයෙන් හෝ, ධනය විනාශ කිරීමෙන් හෝ, ගර්හා කිරීමෙන් හෝ, රටින් නෙරපීමෙන් හෝ, අසත්‍යයෙන් අන්‍යයාට දුක් නූපදවයිද, එයද කුසලයකි. මෙසේ ඔහුට අද්වේෂයෙන් උපන්, අද්වේෂය නිදානකොට ඇත්තාවූ, අද්වේෂය නිසා පහළ වන්නාවූ, අද්වේෂය ප්‍රත්‍යකොට ඇත්තාවූ නොයෙක් කුසල් ධර්මයෝ හටගනිත්.

යදපි, භික්ඛවෙ, අමොහො තදපි කුසලමූලං, යදපි අමූල්හො අභිසංඛරොති කායෙන වාචාය මනසා තදපි කුසලං, යදපි අමූල්හො මොහෙන අනභිභූතො අපරියාදින්නචිත්තො න පරස්ස අසතා දුක්ඛං උප්පාදයති, වධෙන වා බන්ධනෙන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා බලවම්හි බලත්ථො ඉතිපි තදපි කුසලං. ඉතිස්සමෙ අමොහජා අමොහනිදානා අමොහසමුදයා අමොහපච්චයා අනෙකෙ කුසලා ධම්මා සම්භවන්ති.

මහණෙනි, යම් අමෝහය වෙයිද, එය කුසලයකි. අමෝහී පුද්ගල තෙමේ කයින්, වචනයෙන්, සිතින් යමක් රැස් කරයිද, එයද කුසලයකි. මෝහී නොවූ, මෝහයෙන් නොමඩනා ලද, විනාශ නොකරන ලද සිත් ඇත්තාවූ පුද්ගල තෙමේ, 'මම බලවත් වෙමි, බලයෙන් ප්‍රයෝජන ඇත්තෙමි' යි හිංසා කිරීමෙන් හෝ, බන්ධනයෙන් හෝ, ධනය විනාශ කිරීමෙන් හෝ, ගර්හා කිරීමෙන් හෝ, රටින් නෙරපීමෙන් හෝ, අසත්‍යයෙන් අන්‍යයාට දුක් නූපදවයිද, එයද කුසලයකි. මෙසේ ඔහුට අමෝහයෙන් උපන්, අමෝහය නිදානකොට ඇත්තාවූ, අමෝහය නිසා පහළ වන්නාවූ, අමෝහය ප්‍රත්‍යකොට ඇත්තාවූ නොයෙක් කුසල් ධර්මයෝ හටගනිත්.

කස්මා චායං, භික්ඛවෙ, එවරූපො පුග්ගලො වුච්චති කාලවාදීතිපි, භූතවාදීතිපි, අත්ථවාදීතිපි, ධම්මවාදීතිපි, විනයවාදීතිපි? තථාහායං, භික්ඛවෙ, පුග්ගලො න පරස්ස අසතා දුක්ඛං උප්පාදයති වධෙන වා බන්ධනෙන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා බලවම්හි බලත්ථො ඉතිපි. භූතෙන ඛො පන වුච්චමානො පටිජානාති නො අවජානාති; අභූතෙන වුච්චමානො ආතප්පං කරොති තස්ස නිබ්බෙඨනාය - 'ඉතිපෙතං අතච්ඡං, ඉතිපෙතං අභූත'න්ති. තස්මා එවරූපො පුග්ගලො වුච්චති කාලවාදීතිපි, අත්ථවාදීතිපි, ධම්මවාදීතිපි, විනයවාදීතිපි.

මහණෙනි, මෙබඳු පුද්ගල තෙමේ කාලවාදීයයිද, භූතවාදීයයිද, අර්ථවාදීයයිද, ධර්මවාදීයයිද, විනයවාදීයයිද කියනු ලැබේ. මහණෙනි, කුමක් හෙයින් මෙබඳු පුද්ගල තෙම කාලවාදීයයිද, භූතවාදීයයිද, අර්ථවාදීයයිද, ධර්මවාදීයයිද, විනයවාදීයයිද කියනු ලැබේද? මහණෙනි, යම්සේ වනාහි මේ පුද්ගල තෙම, 'මම බලවත් වෙමි, බලයෙන් ප්‍රයෝජන ඇත්තෙමි' යි හිංසා කිරීමෙන් හෝ, බන්ධනයෙන් හෝ, ධනය විනාශ කිරීමෙන් හෝ, ගර්හා කිරීමෙන් හෝ, රටින් නෙරපීමෙන් හෝ, අසත්‍යයෙන් අන්‍යයාට දුක් නූපදවයිද, සත්‍යයෙන් කියනු ලබන්නාවූ හෙතෙම පිළිග නියිද, අවමන් නොකරයිද, අසත්‍යයෙන් කියනු ලබන කල්හි මෙය මෙසේද අසත්‍යය, මෙය මෙසේද අභූතයයි, එය පැටලුම් හැරීම පිණිස උත්සාහ කරයිද, එහෙයින් මෙබඳු පුද්ගල තෙමේ කාලවාදීයයිද, භූතවාදීයයිද, අර්ථවාදීයයිද, ධර්මවාදීයයිද, විනයවාදීයයිද කියනු ලැබේ.

එවරූපස්ස, භික්ඛවෙ, පුග්ගලස්ස ලොභජා, දොසජා, මොහජා පාපකා අකුසලා ධම්මා පහීනා, උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවංකතා ආයතිං අනුප්පාදධම්මා. දිට්ඨෙව ධම්මෙ සුඛං විහරති අවිඝාතං අනුපායාසං අපරිළාහං. දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායති.

මහණෙනි, එසේම මෙබඳු පුද්ගලයාගේ ලෝභයෙන් හටගන්නා වූ, ද්වේෂයෙන් හටගන්නා වූ, මෝහයෙන් හටගන්නා වූ පාපයෝ, අකුසලයෝ ප්‍රහීණ වූහ. සිඳිනලද මුල් ඇත්තාහ. සිඳිනලද තල් ගසක් මෙන් කරණ ලද්දාහ. නොවැඩෙන බවට පමුණුවන ලද්දාහ. නැවත නූපදින ස්වභාවය ඇත්තාහ. මේ ආත්මයෙහිම පීඩා රහිතවූ, දැඩි වෙහෙස රහිතවූ, දාහ රහිතවූ සැපය විඳිමින් වාසය කරයි. මෙලොවදීම පිරිනිවෙයි.

**(අඞ්ගුත්තරනිකාය / දසකනිපාතො / සාධුවග්ගො / සාධුසුත්තං + කුසලසුත්තං + අත්ථසුත්තං + ධම්මසුත්තං + විපාකසුත්තං)**

සාධුඤ්ච වො, භික්ඛවෙ, දෙසෙස්සාමි අසාධුඤ්ච. කුසලඤ්ච වො, භික්ඛවෙ, දෙසෙස්සාමි අකුසලඤ්ච. අත්ථඤ්ච වො, භික්ඛවෙ, දෙසෙස්සාමි අනත්ථඤ්ච. ධම්මඤ්ච වො, භික්ඛවෙ, දෙසෙස්සාමි අධම්මඤ්ච. දුක්ඛවිපාකඤ්ච වො, භික්ඛවෙ, ධම්මං දෙසෙස්සාමි සුඛවිපාකඤ්ච. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති. එවං, භන්තෙ'ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච.

මහණෙනි, තොපට යහපතද, අයහපතද දෙසන්නෙමි. මහණෙනි, තොපට කුසලයද, අකුසලයද දෙසන්නෙමි. මහණෙනි, තොපට අර්ථයද, අනර්ථයද දෙසන්නෙමි. මහණෙනි, තොපට ධර්මයද, අධර්මයද දෙසන්නෙමි. මහණෙනි, තොපට දුක්ඛ විපාක ඇතිකරන ධර්ම හා සැප විපාක ඇතිකරන ධර්ම දෙසන්නෙමි. එය මනාව අසවු. මනාව මෙනෙහි කරවු. කියන්නෙමි. ස්වාමීනි, එසේය' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

කතමඤ්ච, භික්ඛවෙ, අසාධු? කතමඤ්ච, භික්ඛවෙ, අකුසලං? කතමො ච, භික්ඛවෙ, අනත්ථො? කතමො ච, භික්ඛවෙ, අධම්මො? කතමො ච, භික්ඛවෙ, දුක්ඛවිපාකො ධම්මො?

මහණෙනි, අයහපත කවරේද? මහණෙනි, අකුසලය කවරේද? මහණෙනි, අනර්ථය කවරේද? මහණෙනි, අධර්මය කවරේද? මහණෙනි, දුක්ඛ විපාක ඇතිකරන ධර්ම කවරේද?

පාණාතිපාතො, අදින්නාදානං, කාමෙසුමිච්ඡාචාරො, මුසාවාදො, පිසුණා වාචා, ඵරුසා වාචා, සම්ඵප්පලාපො, අභිජ්ඣා, ව්‍යාපාදො, මිච්ඡාදිට්ඨි - ඉදං වුච්චති, භික්ඛවෙ, අසාධු. ඉදං

වුච්චති, භික්ඛවෙ, අකුසලං. අයං වුච්චති, භික්ඛවෙ, අනත්ථො. අයං වුච්චති, භික්ඛවෙ, අධම්මො. අයං වුච්චති, භික්ඛවෙ, දුක්ඛවිපාකො ධම්මො.

පරපණ නැසීම, සොරකම, කාමයන්හි වරදවා හැසිරීම, බොරුකීම, කේළාම් කීම, ඵරුෂ වචන කීම, හිස් නිසරු වචන කීම, අභිධ්‍යාව (මටම වේවා - අනුන්ට නොවේවා යන ඉරිසියා සහගත දැඩි ලෝභකම), ව්‍යාපාදය (අනුන් නසන නපුරු අදහස් සහිත දැඩි ද්වේෂ හා වෛර සහගතබව), මිච්ඡා දිට්ඨිය (කර්මය හා කර්මඵල විශ්වාස නොකරන දැඩි අන්තවාදී අඥානබව). මහණෙනි, මෙය අයහපතයයි කියනු ලැබේ. මහණෙනි, මෙය අකුසලයයි කියනු ලැබේ. මහණෙනි, මෙය අනර්ථයයි කියනු ලැබේ. මහණෙනි, මෙය අධර්මයයි කියනු ලැබේ. මහණෙනි, මෙය දුක්ඛ විපාක ඇතිකරන ධර්මයෝ යයි කියනු ලැබේ.

කතමඤ්ච, භික්ඛවෙ, සාධු? කතමඤ්ච, භික්ඛවෙ, කුසලං? කතමො ච, භික්ඛවෙ, අත්ථො? කතමො ච, භික්ඛවෙ, ධම්මො? කතමො ච, භික්ඛවෙ, සුඛවිපාකො ධම්මො?

මහණෙනි, යහපත කවරේද? මහණෙනි, කුසලය කවරේද? මහණෙනි, අර්ථය කවරේද? මහණෙනි, ධර්මය කවරේද? මහණෙනි, සැප විපාක ඇතිකරන ධර්ම කවරේද?

පාණාතිපාතා වෙරමණී, අදින්නාදානා වෙරමණී, කාමෙසුමිච්ඡාචාරා වෙරමණී, මුසාවාදා වෙරමණී, පිසුණාය වාචාය වෙරමණී, ඵරුසාය වාචාය වෙරමණී, සම්ඵප්පලාපා වෙරමණී, අනභිජ්ඣා, අබ්‍යාපාදො, සම්මාදිට්ඨි - ඉදං වුච්චති, භික්ඛවෙ, සාධූ'ති. ඉදං වුච්චති, භික්ඛවෙ, කුසල'න්ති. අයං වුච්චති, භික්ඛවෙ, අත්ථො'ති. අයං වුච්චති, භික්ඛවෙ, ධම්මො'ති. අයං වුච්චති, භික්ඛවෙ, සුඛවිපාකො ධම්මො'ති.

පරපණ නැසීමෙන් වෙන්වීම, සොරකමින් වෙන්වීම, කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වීම, බොරුකීමෙන් වෙන්වීම, කේළාම් කීමෙන් වෙන්වීම, ඵරුෂ වචන කීමෙන් වෙන්වීම, හිස් නිසරු වචන කීමෙන් වෙන්වීම, අභිධ්‍යාවෙන් වෙන්වීම (ඉරිසියා සහගත දැඩි ලෝභයෙන් වෙන්වීම), ව්‍යාපාදයෙන් වෙන්වීම (අනුන් නසන නපුරු අදහස්වලින්, දැඩි ද්වේෂයෙන් හා වෛරයෙන් වෙන්වීම), සම්මා දිට්ඨිය (කර්මය හා කර්මඵල විශ්වාස කරන දහම් නුවණින් යුක්තවීම). මහණෙනි, මෙය යහපතයයි කියනු ලැබේ. මහණෙනි, මෙය කුසලයයි කියනු ලැබේ. මහණෙනි, මෙය අර්ථයයි කියනු ලැබේ. මහණෙනි, මෙය ධර්මයයි කියනු ලැබේ. මහණෙනි, මෙය සැප විපාක ඇතිකරන ධර්ම යයි කියනු ලැබේ.

# සියලු භය බාලයාට ය

**(අඞ්ගුත්තරනිකාය / තිකනිපාතපාළි / බාලවග්ගො / භයසුත්තං)**

යානි කානිචි, භික්ඛවෙ, භයානි උප්පජ්ජන්ති සබ්බානි තානි බාලතො උප්පජ්ජන්ති, නො පණ්ඩිතතො. යෙ කෙචි උපද්දවා උප්පජ්ජන්ති සබ්බෙ තෙ බාලතො උප්පජ්ජන්ති, නො පණ්ඩිතතො. යෙ කෙචි උපසග්ගා උප්පජ්ජන්ති සබ්බෙ තෙ බාලතො උප්පජ්ජන්ති, නො පණ්ඩිතතො.

මහණෙනි, යම්කිසි භය උපදිත්ද, ඒ සියලු භය බාලයා කෙරෙන් උපදිත්. පණ්ඩිතයා කෙරෙන් නූපදිත්. යම්කිසි විපත්තීහු උපදිත්ද, ඒ සියලු විපත්තීහු බාලයා කෙරෙන් උපදිත්. පණ්ඩිතයා කෙරෙන් නූපදිත්. යම්කිසි උවදුරු උපදිත්ද, ඒ සියලු උවදුරු බාලයා කෙරෙන් උපදිත්. පණ්ඩිතයා කෙරෙන් නූපදිත්.

**(අඞ්ගුත්තරනිකාය / තිකනිපාතපාළි / මංගලවග්ගො / අකුසලසුත්තං)**

තීහි , භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි තීහි? අකුසලෙන කායකම්මෙන, අකුසලෙන වචීකම්මෙන, අකුසලෙන මනොකම්මෙන - ඉමෙහි ඛො, භික්ඛවෙ, තීහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

මහණෙනි, ධර්ම තුනකින් යුත් පුද්ගල තෙමේ යම්සේ ගෙන එන ලද්දක් බිම හෙලන්නේද, එසේම නිරයෙහි උපදියි. කවර තුනකින්ද? අකුසලවූ කාය කර්මයෙන්ද, අකුසලවූ වාග් කර්මයෙන්ද, අකුසලවූ මනෝ කර්මයෙන්ද වෙයි. මහණෙනි, මේ ධර්ම තුනෙන් යුක්තවූ පුද්ගල තෙමේ යම්සේ ගෙන එන ලද්දක් බිම හෙලන්නේද, එපරිද්දෙන් නිරයෙහි වැටෙයි.

තීහි, භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි තීහි? කුසලෙන කායකම්මෙන, කුසලෙන වචීකම්මෙන, කුසලෙන මනොකම්මෙන - ඉමෙහි බො , භික්ඛවෙ, තීහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ'ති.

මහණෙනි, ධර්ම තුනකින් යුත් පුද්ගල තෙමේ යම්සේ ගෙන එන ලද්දක් හෙලන්නේද, එසේම ස්වර්ගයෙහි උපදියි. කවර තුනකින්ද යත්? කුසල කාය කර්මයෙන්ද, කුසල වාග් කර්මයෙන්ද, කුසල මනෝ කර්මයෙන්ද වෙයි. මහණෙනි, මේ ධර්ම තුනෙන් යුත් පුද්ගල තෙම ගෙන එන ලද්දක් බිම හෙලුවාක් මෙන් ස්වර්ග යෙහි උපදියි.

## බාලයා සහ පණ්ඩිතයා

**(අඞ්ගුත්තරනිකාය / තිකනිපාතපාළි / බාලවග්ගො / අකුසලසුත්තං)**

තීහි, භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො. කතමෙහි තීහි? අකුසලෙන කායකම්මෙන, අකුසලෙන වචීකම්මෙන, අකුසලෙන මනොකම්මෙන. ඉමෙහි බො, භික්ඛවෙ, තීහි ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො.

මහණෙනි, ධර්ම තුනකින් යුත් පුද්ගලයා බාලයායයි දත යුතුයි. කවර තුනකින්ද? අකුසල කාය කර්මයෙන්ද, අකුසල වාග් කර්මයෙන්ද, අකුසල මනෝ කර්මයෙන්ද වෙයි. මහණෙනි, මේ ධර්ම තුනෙන් යුත් පුද්ගලයා බාලයායයි දත යුතුයි.

තීහි, භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වෙදිතබ්බො. කතමෙහි තීහි? කුසලෙන කායකම්මෙන , කුසලෙන වචීකම්මෙන, කුසලෙන මනොකම්මෙන. ඉමෙහි බො, භික්ඛවෙ, තීහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වෙදිතබ්බො.

මහණෙනි, කරුණු තුනකින් යුත් පුද්ගලයා පණ්ඩිතයායයි දත යුතුයි. කවර තුනකින්ද ? කුසල කාය කර්මයෙන්ද, කුසල වාග් කර්මයෙන්ද, කුසල මනෝ කර්මයෙන්ද වෙයි. මහණෙනි, මේ ධර්ම තුනෙන් යුත් පුද්ගලයා පණ්ඩිතයායයි දත යුතු.

# ධර්මය හා අධර්මය

**(අඞ්ගුත්තරනිකාය / දසකනිපාතො / බාලවග්ගො / ජාණුස්සොණිවග්ගො / දුතියඅධම්මසුත්තං)**

කතමො ච අධම්මො, කතමො ච ධම්මො? කතමො ච අනත්ථො, කතමො ච අත්ථො?

> අධර්මය කවරේද? ධර්මය කවරේද? අනර්ථය කවරේද? අර්ථය කවරේද?

පාණාතිපාතො අධම්මො, පාණාතිපාතා වෙරමණී ධම්මො, යෙ ච පාණාතිපාතපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො, පාණාතිපාතා වෙරමණිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනාපාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

> පරපණ නැසීම අධර්මයයි. පරපණ නැසීමෙන් වෙන්වීම ධර්මයයි. පරපණ නැසීම නිසා නොයෙක් ලාමක අකුසල ධර්ම කෙනෙක් හටගනිත්ද, මේ අනර්ථයයි. පරපණ නැසීමෙන් වෙන්වීම නිසා නොයෙක් කුසල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණත්වයට යත්ද, මේ අර්ථයයි.

අදින්නාදානං අධම්මො, අදින්නාදානා වෙරමණී ධම්මො, යෙ ච අදින්නාදානපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො, අදින්නාදානා වෙරමණිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනාපාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

> නුදුන් දේ ගැනීම (සොරකම) අධර්මයයි. නුදුන් දේ ගැනීමෙන් වෙන්වීම ධර්මයයි. නුදුන් දේ ගැනීම නිසා යම් ඒ නොයෙක් ලාමක අකුසල ධර්ම කෙනෙක් හටගනිත්ද, මේ අනර්ථයයි. නුදුන් දේ ගැනීමෙන්

> වෙන්වීම නිසා නොයෙක් කුසල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණත්වයට යත්ද, මේ අර්ථයයි.

කාමෙසුමිච්ඡාචාරො අධම්මො, කාමෙසුමිච්ඡාචාරා වෙරමණී ධම්මො, යෙ ච කාමෙසුමිච්ඡාචාරපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො, කාමෙසුමිච්ඡාචාරා වෙරමණීපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනාපාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

> කාමයන්හි වරදවා හැසිරීම අධර්මයයි. කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වීම ධර්මයයි. කාමයන්හි වරදවා හැසිරීම නිසා යම් ඒ නොයෙක් ලාමක අකුසල ධර්ම කෙනෙක් හටගනිත්ද, මේ අනර්ථයයි. කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වීම නිසා නොයෙක් කුසල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණත්වයට යත්ද, මේ අර්ථයයි.

මුසාවාදො අධම්මො, මුසාවාදා වෙරමණී ධම්මො, යෙ ච මුසාවාදපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො, මුසාවාදා වෙරමණීපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනාපාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

> බොරු කීම අධර්මයයි. බොරු කීමෙන් වෙන්වීම ධර්මයයි. බොරු කීම නිසා යම් ඒ නොයෙක් ලාමක අකුසල ධර්ම කෙනෙක් හටගනිත්ද, මේ අනර්ථයයි. බොරු කීමෙන් වෙන්වීම නිසා නොයෙක් කුසල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණත්වයට යත්ද, මේ අර්ථයයි.

පිසුණා වාචා අධම්මො, පිසුණාය වාචාය වෙරමණී ධම්මො, යෙ ච පිසුණාවාචාපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා

සම්භවන්ති, අයං අනත්ථො, පිසුණාය වාචාය වෙරමණිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනාපාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

> කේළාම් කීම අධර්මයයි. කේළාම් කීමෙන් වෙන්වීම ධර්මයයි. කේළාම් කීම නිසා යම් ඒ නොයෙක් ලාමක අකුසල ධර්ම කෙනෙක් හටගනිත්ද, මේ අනර්ථයයි. කේළාම් කීමෙන් වෙන්වීම නිසා නොයෙක් කුසල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණත්වයට යත්ද, මේ අර්ථයයි.

ඵරුසා වාචා අධම්මො, ඵරුසාය වාචාය වෙරමණී ධම්මො, යෙ ච ඵරුසාවාචාපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො, ඵරුසාය වාචාය වෙරමණිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනාපාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

> ඵරුෂ වචන කීම අධර්මයයි. ඵරුෂ වචන කීමෙන් වෙන්වීම ධර්මයයි. ඵරුෂ වචන කීම නිසා යම් ඒ නොයෙක් ලාමක අකුසල ධර්ම කෙනෙක් හටගනිත්ද, මේ අනර්ථයයි. ඵරුෂ වචන කීමෙන් වෙන්වීම නිසා නොයෙක් කුසල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණත්වයට යත්ද, මේ අර්ථයයි.

සම්ඵප්පලාපො අධම්මො, සම්ඵප්පලාපා වෙරමණී ධම්මො, යෙ ච සම්ඵප්පලාපපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො, සම්ඵප්පලාපා වෙරමණිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනාපාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

> ප්‍රලාප (හිස් වචන/නිසරු වචන) දෙඩීම අධර්මයයි. ප්‍රලාප දෙඩීමෙන් වෙන්වීම ධර්මයයි. ප්‍රලාප දෙඩීම නිසා යම් ඒ නොයෙක් ලාමක අකුසල ධර්ම කෙනෙක් හටගනිත්ද, මේ අනර්ථයයි. ප්‍රලාප දෙඩීමෙන් වෙන්වීම නිසා නොයෙක් කුසල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණත්වයට යත්ද, මේ අර්ථයයි.

අභිජ්ඣා අධම්මො, අනභිජ්ඣා ධම්මො, යෙ ච අභිජ්ඣාපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො, අනභිජ්ඣාපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනාපාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

> අභිජ්ඣාව (දැඩි ලෝභය) අධර්මයයි. අභිජ්ඣාවෙන් වෙන්වීම ධර්මයයි. අභිජ්ඣාව නිසා යම් ඒ නොයෙක් ලාමක අකුසල ධර්ම කෙනෙක් හටගනිත්ද, මේ අනර්ථයයි. අභිජ්ඣාවෙන් වෙන්වීම නිසා නොයෙක් කුසල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණත්වයට යත්ද, මේ අර්ථයයි.

ව්‍යාපාදො අධම්මො, අව්‍යාපාදො ධම්මො, යෙ ච ව්‍යාපාදපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො, අව්‍යාපාදපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනාපාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

> ව්‍යාපාදය (දැඩි ද්වේෂය / වෛරීභාවය) අධර්මයයි. ව්‍යාපාදයෙන් වෙන්වීම ධර්මයයි. ව්‍යාපාදය නිසා යම් ඒ නොයෙක් ලාමක අකුසල ධර්ම කෙනෙක් හටගනිත්ද, මේ අනර්ථයයි. ව්‍යාපාදයෙන් වෙන්වීම නිසා නොයෙක් කුසල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණත්වයට යත්ද, මේ අර්ථයයි.

මිච්ඡාදිට්ඨි අධම්මො, සම්මාදිට්ඨි ධම්මො, යෙ ච මිච්ඡාදිට්ඨිපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො, සම්මාදිට්ඨිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනාපාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

> මිච්ඡාදිට්ඨිය අධර්මයයි. සම්මාදිට්ඨිය ධර්මයයි. මිච්ඡාදිට්ඨිය නිසා යම් ඒ නොයෙක් ලාමක අකුශල ධර්ම කෙනෙක් හටගනිත්ද, මේ අනර්ථයයි. සම්මාදිට්ඨිය නිසා නොයෙක් කුශල ධර්මයෝ වැඩීමෙන් සම්පූර්ණත්වයට යත්ද, මේ අර්ථයයි.

# සක්විති රජකමට වඩා ශ්‍රේෂ්ඨ සෝවාන් ඵලය

**පඨබ්‍යා එකරජ්ජෙන, සග්ගස්ස ගමනෙන වා**
**සබ්බ ලොකාධිපච්චෙන, සොතාපත්තිඵලං වරං**

අහස පොළොව මුළුල්ලේ සක්විති රජකමටද වඩා, ස්වර්ගයට යාමටද වඩා, සියලු ලෝකයෙහිද අධිපති භාවයටද වඩා සෝවාන් ඵලයම උතුම් ය.

## චක්කවත්තිරාජසුත්තං

**(සංයුක්තනිකාය / මහාවග්ගපාළි / සොතාපත්තිසංයුත්තං / වෙළුද්වාරවග්ගො)**

ඉධ, භික්ඛවෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති - 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති.

ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති - 'ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී'ති.

සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති - 'සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, යදිදං - චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා, එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා'ති.

අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති, අඛණ්ඩෙහි අච්ඡිද්දෙහි අසබලෙහි අකම්මාසෙහි භුජිස්සෙහි විඤ්ඤුප්පසත්ථෙහි අපරාමට්ඨෙහි සමාධිසංවත්තනිකෙහි. ඉමෙහි චතූහි ධම්මෙහි සමන්නාගතො හොති. යො ච, භික්ඛවෙ, චතුන්නං දීපානං පටිලාභො, යො චතුන්නං ධම්මානං පටිලාභො චතුන්නං දීපානං පටිලාභො චතුන්නං ධම්මානං පටිලාභස්ස කලං නාග්ඝති සොළසි'න්ති. ඉමෙහි ඛො, භික්ඛවෙ, චතූහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො'ති.

මහණෙනි, මේ ශාසනයෙහි ආර්ය ශ්‍රාවකතෙම, බුද්ධ රත්නය කෙරෙහි මෙසේ නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ වේ. ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේත් අර්හත් වන සේක, සම්‍යක් සම්බුද්ධ වන සේක, විජ්ජාචරණ සම්පන්න වන සේක. සුගත වන සේක, ලෝකවිදූ වන සේක. අනුත්තර පුරිසදම්මසාරථී වන සේක. දෙව් මිනිසුන්ගේ ශාස්තෘ වන සේක. චතුස්සත්‍යය අවබෝධ කළ සේක. භාග්‍යවත් වන සේක.

මහණෙනි, මේ ශාසනයෙහි ආර්ය ශ්‍රාවකතෙම, ධර්ම රත්නය කෙරෙහි මෙසේ නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ වේ. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ධර්මය මුල - මැද - අග යහපත්කොට දේශනා කරන ලද්දේය. මේ ධර්මය තමා තුළින්ම දැකිය යුත්තේ ය, කල් නොයවා විපාක දෙන්නේ ය, මේ ධර්මය එව බලව යි කීමට, අවබෝධයෙන් පරීක්ෂා කිරීමට සුදුසු ය, භාවනා වශයෙන් තම සිත්හි පැමිණවීමට - දරා ගැනීමට සුදුසු ය, නුවණැත්තන් විසින් තම තම නැණ පමණින් ප්‍රත්‍යක්ෂයෙන් දතයුත්තේ ය.

මහණෙනි, මේ ශාසනයෙහි ආර්ය ශ්‍රාවකතෙම, සංඝ රත්නය කෙරෙහි මෙසේ නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ වේ. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම සැපය උදා කරන

මනා පිළිවෙතෙහි පිළිපන්නේ ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ඍජු පිළිවෙතෙහි පිළිපන්නේ ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ඤාණ මාර්ගයෙහි පිළිපන්නේ ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ලෝකෝත්තර ආර්ය මාර්ගයෙහි පිළිපන්නේ ය. යම් මේ පුරිස යුගල සතරක් ඇද්ද, ආර්ය පුද්ගලයෝ අට දෙනෙක් ඇද්ද, භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවක සංඝයා, ආහුනෙය්‍යය - දුර සිට ගෙනෙන සිවුපසයෙන් පූජා ලැබීමට සුදුසු ය, පාහුනෙය්‍යය - ආගන්තුක සත්කාර පිළිගැන්වීමට සුදුසු ය, දක්ඛිණෙය්‍යය - විපාක අදහා දෙන දානය පිළිගැනීමට සුදුසු ය, අඤ්ජලිකරණීය - දෑත් එක්කර වන්දනා කිරීමට සුදුසු ය, සියලු ලෝකයාගේ අනුත්තර වූ පින් කෙත ය.
මහණෙනි, මේ ශාසනයෙහි ආර්ය ශ්‍රාවකතෙම, අරිය කාන්ත ශීලයෙන් යුක්තවූයේ වේ. නොකැඩුනාවූ, සිදුරු නොවූ, කබර නොවූ, කැළල් නොවූ, නිදහස්වූ, නුවණ ඇත්තන් විසින් ප්‍රසංසා කරන ලද්දාවූ, තෘෂ්ණා දෘෂ්ටීන් විසින් පරාමර්ශනය නොකරන ලද්දාවූ සමාධිය පිණිස පවතින්නාවූ ආර්යයන් කැමති ශීලයෙන් යුක්තවූයේ වෙයි.

මහණෙනි, යම් සතර මහා දිවයින් ලැබීමක් වේද (සක්විති රජකම), යම් මේ සතර ධර්මයන්ගේ ලැබීමක් වේද, ඒ සතර මහා දිවයින ලැබීම (සක්විති රජකම) මේ සතර ධර්මයන්ගේ ලැබීමෙන් සොළොස් කලාවෙන් කලාවකුදු නොවටී. මහණෙනි, මේ සතර ධර්මයන්ගෙන් යුක්තවූ ආර්යශ්‍රාවක තෙම අපායෙහි නොවැටෙන ස්වභාව ඇති, රහත් බව නියත වූ, රහත්බව පිහිටකොට ඇත්තාවූ සෝවාන් වූයේ වෙයි.

# සතර අපා දුකින් සදහටම මුදවා නිවන් මඟට පමුණුවන උතුම් වූ සෝතාපන්න ඵලය

**(සංයුක්තනිකාය / මහාවග්ගපාළි / සොතාපත්තිසංයුත්තං / වෙළුද්වාරවග්ගො / දුතියසාරිපුත්තසුත්තං)**

සොතාපත්තියඞ්ගං, සොතාපත්තියඞ්ග'න්ති හිදං, සාරිපුත්ත, වුච්චති. කතමං නු ඛො සාරිපුත්ත, සොතාපත්තියඞ්ග'න්ති?

සප්පුරිසසංසෙවො හි, භන්තෙ, සොතාපත්තියඞ්ගං,
සද්ධම්මස්සවනං සොතාපත්තියඞ්ගං,
යොනිසොමනසිකාරො සොතාපත්තියඞ්ගං,
ධම්මානුධම්මපටිපත්ති සොතාපත්තියඞ්ග'න්ති.

සාධු! සාධු!! සාරිපුත්ත! සප්පුරිසසංසෙවො හි, සාරිපුත්ත,
සොතාපත්තියඞ්ගං, සද්ධම්මස්සවනං සොතාපත්තියඞ්ගං,
යොනිසොමනසිකාරො සොතාපත්තියඞ්ගං,
ධම්මානුධම්මපටිපත්ති සොතාපත්තියඞ්ගං.

සාරිපුත්තය, සෝතාපත්ති අංග, සෝතාපත්ති අංග යයි කියනු ලැබේ. සාරිපුත්තය, සෝතාපත්ති අංග වනාහි කවරක්ද?

ස්වාමීනි, සත්පුරුෂයන් (කළණ මිතුරන්) සේවනය කිරීම වනාහි සෝතාපත්ති අංගයකි.
ධර්මශ්‍රවණය සෝතාපත්ති අංගයකි.
ඇසූ ධර්මය නුවණින් මෙනෙහි කිරීම සෝතාපත්ති අංගයකි.
එම ලෝකෝත්තර ධර්මයට අනුව පිළිපැදීම සෝතාපත්ති අංගයකි.

සාධු! සාධු !! සාරිපුත්ත, සාරිපුත්තය, සත්පුරුෂයන් (කළණ මිතුරන්) සේවනය කිරීම වනාහි සෝතාපත්ති අංගයකි. ධර්මශ්‍රවණය

සෝතාපත්ති අංගයකි. ඇසූ ධර්මය නුවණින් මෙනෙහි කිරීම සෝතාපත්ති අංගයකි. එම ලෝකෝත්තර ධර්මයට අනුව පිළිපැදීම සෝතාපත්ති අංගයකි.

සොතො, සොතො'ති හිදං, සාරිපුත්ත, වුච්චති. කතමො නු ඛො, සාරිපුත්ත, සොතො'ති?

අයමෙව හි, භන්තෙ, අරියො අට්ඨඞ්ගිකො මග්ගො සොතො, සෙය්‍යථීදං -

සම්මාදිට්ඨි
සම්මාසඞ්කප්පො
සම්මාවාචා
සම්මාකම්මන්තො
සම්මාආජීවො
සම්මාවායාමො
සම්මාසති
සම්මාසමාධී'ති.

සාධු සාධු, සාරිපුත්ත! අයමෙව හි, සාරිපුත්ත, අරියො අට්ඨඞ්ගිකො මග්ගො සොතො, සෙය්‍යථීදං - සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්පො, සම්මාවාචා, සම්මාකම්මන්තො, සම්මාආජීවො, සම්මාවායාමො, සම්මාසති, සම්මාසමාධී'ති.

සාරිපුත්තය, සෝතය - සෝතය යයි කියනු ලැබේ. සාරිපුත්තය, සෝතය නම් කවරේද?

ස්වාමීනි, මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයම සෝතය නමි. හේ කවරේද?

සම්‍යක් දෘෂ්ටිය
සම්‍යක් සංකල්පනාව
සම්‍යක් වචනය

සම්‍යක් කර්මාන්තය
සම්‍යක් ආජීවය
සම්‍යක් ව්‍යායාමය
සම්‍යක් සතිය
සම්‍යක් සමාධියයි.

සාධු! සාධූ!! සාරිපුත්තය සාරිපුත්තය, මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම සෝතය නම්. හේ කවරේද? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධියයි.

සොතාපන්නො, සොතාපන්නො'ති හිදං, සාරිපුත්ත, වුච්චති.
කතමො නු ඛො, සාරිපුත්ත, සොතාපන්නො'ති?
යො හි, භන්තෙ, ඉමිනා අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සමන්නාගතො අයං වුච්චති සොතාපන්නො, ස්වායං ආයස්මා එවංනාමො එවංගොත්තො'ති.
සාධු සාධු, සාරිපුත්ත! යො හි, සාරිපුත්ත, ඉමිනා අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සමන්නාගතො, අයං වුච්චති සොතාපන්නො, ස්වායං ආයස්මා එවංනාමො එවංගොත්තො'ති.

සාරිපුත්තය, සෝතාපන්නය, සෝතාපන්නයයි කියනු ලැබේ. සාරිපුත්තය සෝතාපන්න තෙම කවරේද?

ස්වාමීනි, යමෙක් මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් යුක්තවූයේද මේ තෙමේ සෝතාපන්නයයි කියනු ලැබේ. ඒ ආයුෂ්මත් තෙමේ මෙනම් ඇත්තේය. මෙනම් ගෝත්‍ර ඇත්තේය.

සාධූ! සාධූ!! සාරිපුත්තය, සාරිපුත්තය යමෙක් මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙන් යුක්තවූයේද, හෙතෙමේ සෝතාපන්නයයි කියනු ලැබේ. ඒ ආයුෂ්මත් තෙමේ මේ නම් ඇත්තේය. මේ ගෝත්‍ර ඇත්තේ ය.

# සතර අපා දුකෙන් සදහටම මුදවන නියත වූ නිවන් මඟට පමුණුවන උතුම් වූ සෝවාන් ඵලය උදෙසා

**ආර්ය විනය තුළ පෙන්වන දුක්ඛ ආර්ය සත්‍යය යනු කුමක්ද?**

ලෝකය තුළ දුක යනුවෙන් අර්ථකථනය වන ස්වභාවයක් ඇත. ලෝකය තුළ දුක යනු සත්වයා අත්විඳින්නකි. වේදනා චෛතසිකයෙන් (වේදනා හැඟීමෙන්) අත්දකින්නකි. එම ලෞකික අර්ථයෙන් යුත් දුක, සත්වයාට දෑසින් ද දැකිය හැක. එම ආදීනව දුක් සමුදාය ලෝකය තුළ පැහැදිලිව විද්‍යාමාන ය. ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ (කායික දුක්), දෝමනස්ස (මානසික දුක්), උපායාස යන දුක්ඛස්කන්ධය සියලු ලෝ සතුන්ට උරුම ධර්මතාවන් ය. සියලු සතුන්ට මෙම දුක් රැස පෙනේ. සත්වයාට මෙම දුක්ඛස්කන්ධය පෙන්වා දෙන්නට සම්මා සම්බුදුවරයාණන් වහන්සේ නමක් අවැසි නැත.

එසේ නම් සම්මා සම්බුදුරජුන් අපට පෙන්වා දෙන දුක්ඛ ආර්ය සත්‍යය කුමක්ද?

## ද්වයතානුපස්සනාසුත්තං

**(ඛුද්දකනිකාය / සුත්තනිපාතපාළි / මහාවග්ගො)**

**රූපා සද්දා රසා ගන්ධා, ඵස්සා ධම්මා ච කෙවලා**
**ඉට්ඨා කන්තා මනාපා ච, යාවත්ථීති වුච්චති**

ඉෂ්ට, කාන්ත, මනාප, මන වඩන රූප, ශබ්ද, රස, ගන්ධ, ස්පර්ශ, ධර්ම යන මේ අරමුණු සය කෙරෙහි සියලු සත්වයෝ නිරන්තරයෙන් යොමු වී සිටිති.

**සදෙවකස්ස ලොකස්ස, එතෙ වො සුඛසම්මතා**
**යත්ථ චෙතෙ නිරුජ්ඣන්ති, තං තේසං දුක්ඛසම්මතා**

දෙවියන් සහිත ලෝකයා විසින් එකී ප්‍රිය අරමුණු සහ එතුළින් උපදින ආස්වාදය ලෝකයේ සැපයයි සම්මතය. යම් තැනෙක්හි මොව්හු නැතිවෙත්ද, අභිමි වෙත්ද, වෙන් වී යත්ද, එය ලෝකයේ දුක යයි සම්මත ය.

**සුඛන්ති දිට්ඨමරියෙහි, සක්කායස්සුපරොධනං**
**පච්චනීකමිදං හොති, සබ්බලොකෙන පස්සතං**

පංච උපාදානස්කන්ධයේ සියල්ල නිරෝධය (මම මගේ යයි ආශාවෙන් අල්ලාගෙන සිටින අත් හැරීම) සැපය යයි ආර්යයන් විසින් දක්නා ලදී. ආර්යයන්ගේ එම දැක්ම සියලු ලෝකයන්හි දැක්මට ප්‍රතිගාමී ය.

**යං පරෙ සුඛතො ආහු, තදරියා ආහු දුක්ඛතො**
**යං පරෙ දුක්ඛතො ආහු, තදරියා සුඛතො විදූ**

**අනාර්‍යයෝ යමක් සැපයයි කීවාහුද, ආර්යයෝ එය දුක්යයි කීහු. අනාර්‍යයෝ යමක් දුක් යයි කීවාහුද, ආර්යයෝ එය සැපයයි කීවාහු ය. ලෝකයා ආස්වාදයට සැප යයි කීවාහු ය. ආස්වාදයෙන් වෙන්වීමට දුක යයි කීවාහු ය. ආර්යයෝ ආස්වාදයට දුක යයි කීවාහු ය. ආස්වාදයෙන් වෙන්වීමට සැප යයි කීවාහු ය.**

නිවන් අවබෝධය යනු ලෝකයේ දැක්මට - චින්තනයට ප්‍රතිගාමී අවබෝධයකි. ලෝකයේ දැක්ම වන්නේ රාගය, ද්වේෂය, මෝහය පවත්වාගෙන යාම සැපයකි යන්නයි. එම රාග, ද්වේෂ, මෝහ සිත තුළ ජනනය කිරීමට හේතු වන, ආස්වාදය සැපයකි යන්නයි.

නමුත් තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලොවට හෙළි කළ පටිච්ච සමුප්පාද ධර්මයට (හේතු ඵල ධර්මය) අනුව

නුවණින් දැකිය හැක්කේ, ආස්වාදය සැපයක් ලෙස සලකා ඒ පසුපස හඹා යාම හේතුවෙන්, සිත තුළ නැවත නැවත රාග, ද්වේෂ, මෝහ ජනනය වන ආකාරයයි. එම රාග, ද්වේෂ, මෝහ හේතුවෙන් නැවත නැවත කර්ම භවය සකස් වේ. කර්ම භවය හේතුවෙන් සත්වයාට මරණින් පසු නැවත උපතක් හිමි වේ. නැවත දුක්ඛස්කන්ධය උරුම වේ.

සත්වයාට මෙලොවත් පරලොවත්, දැවීම, අසහනය, පෙළීම, පීඩාව, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස දුක් රැස උරුම කර දෙන, රාග, ද්වේෂ, මෝහ හට ගැනීමට හේතුව වන්නේ ආස්වාදයයි. අනවරාග්‍ර අනාථ සසර ගමනක සියලු සතුන් මෙලොව පරලොව වශයෙන් අනන්ත අපරිමාණ දුකක් උරුම කරගන්නේ ආස්වාදය පසුපස සැපයකි යන මිථ්‍යාදෘෂ්ඨියෙන් යුක්තව හඹා යාම නිසා ය. යමකින් දුක උරුම වන්නේ නම් එය සැපයක් ලෙස සැලකිය නොහැක.

එහෙයින් ආස්වාදය දුක වශයෙන් නුවණින් දැකිය යුතු ය. එය සද්ධර්මය අසා හේතුඵල ධර්මය අවබෝධ කළ අරිය සාවකයන් පමණක් ප්‍රඥාවෙන් දකින්නා වූ සත්‍යයකි. **එබැවින් ආස්වාදය දුක ලෙස නුවණින් - ප්‍රඥාවෙන් දැකීම දුක්ඛ ආර්ය සත්‍යය නම් වෙයි. එය සංසාරයේ සැඟවී ඇති ඒකායන යථාර්ථය නුවණින් දැකීමයි.**

මෙම සාංසාරික යථාර්ථය නුවණින් නොදක්නාතුරු, ආස්වාදය සැපයකි යන චින්තන විපරීතය සත්වයා තුළ පවතී. අවිජ්ජාව යනු මෙම මුළා සහගත චින්තන විපරීතයයි. අවිජ්ජාව පවතිනතුරු පටිච්චසමුප්පාදය ක්‍රියාත්මක වන බැවින්, අවිපරිණාමීය ආත්මයකින් තොර වූ අසාර වූ හේතුඵල සත්වයෙකු, අප්‍රමාණ දුක් උසුලමින් උපත සහ මරණය අතර දෝලනය වෙමින් සසර තුළ සැරිසරයි.

ආස්වාදය පතා මම මගේ යනුවෙන් සත්වයා විසින් සිතින් අල්ලා ගනු ලබන සියල්ල, අනිච්ච, දුක්ඛ, අනත්ත, අසුභ ලක්ෂණයන්ගෙන් යුක්ත වෙයි. ඒ සියල්ල ඊට හිමි ධර්මතාවන්ට අනුව පවතිමින් විපරිණාමය කරා ගමන් කර අවසානයේ මරණයෙන් කෙළවර වෙයි. එබැවින් ආස්වාදය පතා සත්වයා විසින් ළං කරගත් අචේතනික සචේතනික ද්‍රව්‍ය - වස්තු / සත්ව පුද්ගල ප්‍රපංච සියල්ල නිසා, මොහොතක් පාසා, ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස දුක් රසට මුහුණ පෑමට සත්වයාට සිදුවෙයි. ආස්වාදය පතා තණ්හාවෙන් (ඇල්මෙන් - ආශාවෙන්) අල්ලා ගත් සියල්ල නිසා, සත්වයාට අප්‍රමාණ දුක්ඛස්කන්ධයක් උසුලන්නට සිදු වෙයි. තණ්හාවෙන් අල්ලා ගත් ද්‍රව්‍ය - වස්තු / සත්ව පුද්ගල ප්‍රපංචයන්ගේ ස්වභාවය අනුව, ප්‍රමාණය අනුව ඒ ඒ සත්වයා උසුලන දුක අඩු වැඩි වෙයි.

**මාළුවා රසබර ඇමට රැවටී මරණීය බිළී කටුවට ගොදුරුව වැනසී යන්නාක් මෙන්, සත්වයා ආස්වාදය සැපයකැයි රැවටී ඒ පසුපස හඹා යාම හේතුවෙන්, ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, රාග, ද්වේෂ, මෝහ යන එකොළොස් දුක්ඛයන්ගෙන් යුක්ත සංසාර බිළී කටුවට ගොදුරු වී වැනසී දුකට පත්වන බව නුවණින් - ප්‍රඥාවෙන් දැකීම, දුක්ඛ ආර්ය සත්‍යය අවබෝධ කිරීමයි.**

**ඇස - ප්‍රිය රූප / කන - ප්‍රිය ශබ්ද / නාසය - ප්‍රිය ගන්ධ / දිව - ප්‍රිය රස / කය - ප්‍රිය පහස / මනස - ප්‍රිය අදහස් යනුවෙන් ඒ ඒ තැන්හි යෙදෙන ආස්වාදය භුක්ති විඳීමට, නැවත නැවත භුක්ති විඳීමට ඇතිවන ඇල්ම - ආශාව නිසා, ඊට කටයුතු යෙදීමෙන්, රාග, ද්වේෂ, මෝහ (කර්ම) රැස්වී, පුනර්භවය සකස්වන බව නුවණින් - ප්‍රඥාවෙන් දැකීම, දුක්ඛ සමුදය ආර්ය සත්‍යය අවබෝධ කිරීමයි.**

**ආස්වාදය පිළිබඳ එම තණ්හාව - ඇල්ම - ආශාව, ශේෂ නොකොටම සහමුලින්ම ක්ෂය කර, බිඳ හැර, දුරු කොට සිත පිරිසිදු කර ගැනීම තුළින්, පුනර්භවයද ක්ෂය වී, මෙලොව**

**පරලොව සියලු දුකින් අත මිදෙන බව නුවණින් - ප්‍රඥාවෙන් දැකීම, දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය අවබෝධ කිරීමයි.**

**ආස්වාදය පිළිබඳ එම තණ්හාව - ඇල්ම - ආශාව, ශේෂ නොකොටම සහමුලින්ම දුරු කිරීම උදෙසා පළමුව ලෝකෝත්තර සම්මාදිට්ඨියට පත් විය යුතු බවත්, එම සම්මාදිට්ඨිය තුළින් ආස්වාදයේ ආදීනව නුවණින් දකිමින් ලෝකෝත්තර ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩිය යුතු බවත්, නුවණින් - ප්‍රඥාවෙන් දැකීම, දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය අවබෝධ කිරීමයි.**

මෙම ආර්ය සත්‍යය හතර අවබෝධ කිරීම යනු, ලෝකෝත්තර සම්මාදිට්ඨිය - විද්‍යාව පහළ කර ගැනීම හෙවත් නිවන් මඟට පැමිණීමයි. උතුම් වූ සෝවාන් ඵලයයි.

යං ඛො, භික්ඛු, දුක්ඛෙ ඤාණං, දුක්ඛසමුදයෙ ඤාණං, දුක්ඛනිරොධෙ ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං - අයං වුච්චති, භික්ඛු, සම්මාදිට්ඨි, අයං වුච්චති, භික්ඛු, විජ්ජා. එත්තාවතා ච සම්මාදිට්ඨිගතො හොති, විජ්ජාගතො හොතී'ති.

මහණ, දුකෙහි යම් දැනීමක් වෙයිද දුකට හේතුවෙහි යම් දැනීමක් වෙයිද දුක්ඛ නිරෝධයෙහි යම් දැනීමක් වෙයිද දුක්ඛ නිරෝධයට පැමිණෙන මාර්ගයෙහි යම් දැනීමක් වේද, මෙය සම්මාදිට්ඨියයි කියනු ලැබේ, මෙය විද්‍යාව යයි කියනු ලැබේ. මෙතෙකින් සම්මාදිට්ඨියට, විද්‍යාවට පැමිණියේ වෙයි.

## ධම්මචක්කප්පවත්තනසුත්තං

### (සංයුක්තනිකාය / මහාවග්ගපාළි / සච්චසංයුත්තං / ධම්මචක්කප්පවත්තනවග්ගො)

ඉදං ඛො පන, භික්ඛවෙ, දුක්ඛං අරියසච්චං - ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, ඛ්‍යාධිපි දුක්ඛො, මරණම්පි දුක්ඛං, අප්පියෙහි සම්පයොගො දුක්ඛො, පියෙහි විප්පයොගො දුක්ඛො, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං - සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා.

මහණෙනි, මේ වනාහි දුක්ඛාර්ය සත්‍යයයි. ජාතියද දුකය, ජරාවද දුකය, රෝගයද දුකය, මරණයද දුකය, අප්‍රියයන් හා එක්වීමද දුකය, ප්‍රියයන්ගෙන් වෙන්වීමද දුකය, කැමති යමක් නොලැබේද, එයද දුකය. එහෙයින් සැකෙවින් පඤ්ච උපාදානස්කන්ධයෝම (ආස්වාදය පතා තණ්හාවෙන් / ඇල්මෙන් / ආශාවෙන් ළං කරගත් සියල්ල) දුක් වන්නාහුය. (උප = ළංවීම / ආදාන = තදින් අල්ලා ගැනීම = උපාදාන) සැප යනුවෙන් සිතින් ළංවී තදින් අල්ලාගෙන සිටින සියල්ල දුක වශයෙන් ප්‍රඥාවෙන් - නුවණින් දැකිය යුත්තාහ. එය දුක්ඛ ආර්ය සත්‍යය අවබෝධ කිරීමයි.

ඉදං ඛො පන, භික්ඛවෙ, දුක්ඛසමුදයං අරියසච්චං -
යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා
තත්‍රතත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං -
කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා.

මහණෙනි, මේ වනාහි දුක්ඛ සමුදයාර්ය සත්‍යයයි. නැවත නැවත ඉපදීම ඇති කරන්නාවූ නන්දිරාගය හා එක්වූ ඒ ඒ ආත්මභාවයෙහි ඇලෙන්නාවූ යම් ඒ තෘෂ්ණාවක් වේද, ඒ කවරේද යත්. කාම තෘෂ්ණාවය, භව තෘෂ්ණාවය, විභව තෘෂ්ණාවයි යන මොව්හුයි.

ඉදං ඛො පන, භික්ඛවෙ, දුක්ඛනිරොධං අරියසච්චං - යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො.

මහණෙනි, මේ වනාහි දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය වේ. යම් ඒ තෘෂ්ණාවගේ ඉතිරි නොකොට නිරුද්ධ කිරීමක් වේද, දුරු කිරීමක් වේද, නැති කිරීමක් වේද, මිදීමක් වේද, ආලය අත්හැරීමක් වේද එයයි.

ඉදං ඛො පන, භික්ඛවෙ, දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං - අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං - සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි.

මහණෙනි, මේ වනාහි දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය වේ. එනම් ආර්ය අෂ්ඨාංගික මාර්ගය මැයි. හේ කවරේද යත්? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මොහුයි.

# චතුරාර්ය සත්‍යය පිළිබඳ දොළොස් ආකාර ඤාණ සහිත තිපරිවට්ටය

## දුක්ඛ ආර්ය සත්‍යය

**දුක්ඛ ආර්ය සත්‍යය පිළිබඳ සත්‍ය ඤාණය**

ඉදං දුක්ඛං අරියසච්ච'න්ති මෙ, භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මයන්හි මේ දුක්ඛ ආර්ය සත්‍යයයි, මට දහම් ඇස පහළ විය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

**දුක්ඛ ආර්ය සත්‍යය පිළිබඳ කෘත්‍ය ඤාණය**

තං ඛො පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤෙය්‍යය'න්ති මෙ,
භික්ඛවෙ, පුබ්බෙ...පෙ.... උදපාදි.

මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මයන්හි මේ දුක්ඛාර්ය සත්‍යය පිරිසිඳ දත යුතුයයි මට දහම් ඇස පහළ විය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

**දුක්ඛ ආර්ය සත්‍යය පිළිබඳ කෘත ඤාණය**

තං ඛො පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤාත'න්ති මෙ, භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

මහණෙනි, පෙර නොඇසූ විරූ ධර්මයන්හි මේ දුක්ඛ ආර්ය සත්‍යය පිරිසිඳ දැන ගන්නා ලදැයි මට දහම් ඇස පහළ විය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

## දුක්ඛ සමුදය ආර්ය සත්‍යය

### දුක්ඛ සමුදය ආර්ය සත්‍යය පිළිබඳ සත්‍ය ඤාණය

ඉදං දුක්ඛසමුදයං අරියසච්ච'න්ති මෙ, භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මයන්හි මේ දුක්ඛ සමුදය ආර්ය සත්‍යයයි මට දහම් ඇස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

### දුක්ඛ සමුදය ආර්ය සත්‍යය පිළිබඳ කෘත්‍ය ඤාණය

තං ඛො පනිදං දුක්ඛසමුදයං අරියසච්චං පහාතබ්බ'න්ති මෙ, භික්ඛවෙ, පුබ්බෙ... පෙ.... උදපාදි.

මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මයන්හි මේ දුක්ඛ සමුදයාර්ය සත්‍යය ප්‍රහීණ කළ යුතුයයි මට දහම් ඇස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

### දුක්ඛ සමුදය ආර්ය සත්‍යය පිළිබඳ කෘත ඤාණය

තං ඛො පනිදං දුක්ඛසමුදයං අරියසච්චං පහීන'න්ති මෙ, භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මයන් හී මේ දුක්ඛ සමුදය ආර්ය සත්‍යය ප්‍රහීණ කරන ලදැයි මට දහම් ඇස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

## දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය

### දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය පිළිබඳ සත්‍ය ඤාණය

ඉදං දුක්ඛනිරොධං අරියසච්ච'න්ති මෙ, භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මයන් හී මේ දුක්ඛ නිරෝධාර්ය සත්‍යයයි මට දහම් ඇස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

### දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය පිළිබඳ කෘත්‍ය ඤාණය

තං ඛො පනිදං දුක්ඛනිරොධං අරියසච්චං සච්ඡිකාතබ්බ'න්ති මෙ, භික්ඛවෙ, පුබ්බෙ...පෙ.... උදපාදි.

මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මයන්හි මේ දුක්ඛ නිරෝධාර්ය සත්‍යය ප්‍රත්‍යක්ෂ කළයුතු යයි මට දහම් ඇස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

### දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය පිළිබඳ කෘත ඤාණය

තං ඛො පනිදං දුක්ඛනිරොධං අරියසච්චං සච්ඡිකත'න්ති මෙ, භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මයන් හී මේ දුක්ඛ නිරෝධාර්ය සත්‍යය ප්‍රත්‍යක්ෂ කරන ලදැයි මට දහම් ඇස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

## දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය

### දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය පිළිබඳ සත්‍ය ඤාණය

ඉදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්ච'න්ති මෙ, භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මයන් හී මේ දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදා ආර්ය සත්‍යයයි. මට දහම් ඇස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

### දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය පිළිබඳ කෘත්‍ය ඤාණය

තං බො පනිදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං භාවෙතබ්බ'න්ති මෙ, භික්ඛවෙ, පුබ්බෙ... පෙ.... උදපාදි.

මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මයන් හී මේ දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදා ආර්ය සත්‍යය වැඩිය යුතු යයි මට දහම් ඇස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

### දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය පිළිබඳ කෘත ඤාණය

තං බො පනිදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං භාවිත'න්ති මෙ, භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු

චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

මහණෙනි, පෙර නොඅසන ලද ධර්මයන්හි මේ දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය වඩන ලදැයි මට දහම් ඇස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

යතො ච ඛො මෙ, භික්ඛවෙ, ඉමෙසු චතූසු අරියසච්චෙසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහොසි, අථාහං, භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො'ති පච්චඤ්ඤාසිං. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි - අකුප්පා මෙ විමුත්ති, අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවො'ති.

මහණෙනි, මට වනාහි යම් අවස්ථාවක මෙසේ වට තුනක් ඇති, දොළොස් ආකාරයක් ඇති, මේ චතුරාර්ය සත්‍යයන්හි යථාභූතඥාන දර්ශනය මනාව අවබෝධ වූයේද, මහණෙනි, මම එකල්හි දෙවියන් සහිත බඹුන් සහිත ලෝකයෙහිද මහණ බමුණන් ඇතුළු දෙව් මිනිසුන් සහිතවූ ප්‍රජාවෙහිද අනුත්තරවූ සම්‍යක් සම්බෝධිය අවබෝධ කෙළෙමියි, ප්‍රතිඥා කෙළෙමි. මට වනාහි ඥාන දර්ශනය පහළවිය. මාගේ අර්හත් ඵල විමුක්තිය වෙනස් කළ නොහැකිය. මේ අන්තිම ජාතිය වන්නීය. දැන් මට නැවත ඉපදීමක් නැත.

**ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි - යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරොධධම්ම'න්ති.**

මේ දහම් ව්‍යාකරණය අසා ආයුෂ්මත් අඤ්ඤා කොණ්ඩඤ්ඤයන් වහන්සේට කෙළෙස් රජස්වලින් වෙන් කරන ධර්මචක්ෂුස

හෙවත් සෝතාපත්ති මාර්ග ඥානය පහළවූයේය (කෙසේද යත්?) යම් ධර්මයක් හේතුවකින් හට ගන්නේද, ඒ සියල්ල හේතු නිරෝධයෙන් නිරෝධ වන්නේ ය කියායි.

ඉතිහ තෙන ඛණෙන තෙන මුහුත්තෙන යාව බ්‍රහ්මලොකා සද්දො අබ්භුග්ගච්ඡි. අයඤ්ච දසසහස්සිලොකධාතු සඞ්කම්පි සම්පකම්පි සම්පවෙධි, අප්පමාණො ච උළාරො ඔභාසො ලොකෙ පාතුරහොසි අතික්කම්ම දෙවානං දෙවානුභාවන්ති.

මෙසේ ඒ ක්ෂණයකින් ඒ මොහොතින් බඹලොව දක්වා සාධුකාර ශබ්දය පැන නැංගේය. මේ දස සහස්‍ර ලෝක ධාතුව කම්පා විය. අතිශයින් කම්පා විය. මහත්සේ වෙව්ලා ගියේය. දෙවියන්ගේ දේවානුභාවය ඉක්මවා අප්‍රමාණවූ මහත් වූ ආලෝකයක් ලොවෙහි පහළ වූයේය.

# නිවන් අවබෝධය පිණිස ත්‍රිලක්ෂණය

**නහී සීල වතං හොතු - උප්පජ්ජන්ති තථාගතා**
**අට්ඨක්කරා තීනි පදා - සම්බුද්ධෙන පකාසිතා**

**ලොව්තුරු තථාගතයන් වහන්සේ ලොව පහළ වන්නේ,**
**සිල් වතක් දේශනා කිරීම පිණිස නොවේ.**
**සම්මා සම්බුදු රජාණන් වහන්සේ උතුම් වූ නිර්වාණය පිණිස**
**ලොවට දේශනා කරන්නේ, අක්ෂර අටකින් යුත් පද තුනකි.**

## අනිච්ච - දුක්ඛ - අනත්ත

**(සංයුක්තනිකාය / සළායතනවග්ගපාළි / සළායතනසංයුත්තං / සබ්බවග්ගො / සබ්බසුත්තං)**

සබ්බං වො, භික්ඛවෙ, දෙසෙස්සාමි, තං සුණාථ, කිඤ්ච, භික්ඛවෙ, සබ්බං? චක්ඛුඤ්චෙව රූපා ච, සොතඤ්ච සද්දා ච, ඝානඤ්ච ගන්ධා ච, ජිව්හා ච රසා ච, කායො ච ඵොට්ඨබ්බා ච, මනො ච ධම්මා ච - ඉදං වුච්චති, භික්ඛවෙ, සබ්බං.

ඇසද රූපයෝද, කනද ශබ්දයෝද, නාසයද ගන්ධයෝද, දිවද රසයෝද, කයද ස්පර්ශයෝද, මනසද ධර්මයෝද, මහණෙනි, මේ සියල්ල යයි කියනු ලැබේ.

**සබ්බං භික්ඛවෙ, අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා.**

මහණෙනි, සියල්ල නිශ්චිත පැවැත්මකින් තොර විපරිණාමීය ස්වභාවයෙන් යුක්ත වූ ද, හේතු ප්‍රත්‍යයන් (සංයෝජන) විසින් සකස් කරන ලද්දා වූද. හේතුඵල වශයෙන් තාවකාලිකව හටගෙන සකස් වී විද්‍යමාන වන්නා වූද, ක්‍ෂයවන විනාශකාරී ස්වභාව ඇත්තාවූද, දුක්ඛස්කන්ධය උදා කරන්නා වූද, අවසන් වන - අවසන් කළ යුතු (වය කළ යුතු) ස්වභාව ඇත්තාවූද, ගිලිහී යන වෙන් වී යන

- නොඇලිය යුතු අත්හළ යුතු ස්වභාව ඇත්තාවූද, නියාම ධර්ම හේතුවෙන් ඒ ඒ මොහොතේදී තාවකාලිකව නිරෝධ වන - එසේද වුව ප්‍රඥාවෙන් අනුප්පාද වශයෙන් සදාතනික වශයෙන්ම නිරෝධ කළයුතු නැවත නූපදවිය යුතු ස්වභාව ඇත්තාවූද ධර්මයෝ වෙත්.

**සබ්බං භික්ඛවෙ, අනිච්චං. යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා,ති, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.**

මහණෙනි, සියල්ල අනිච්චයි. යමක් අනිච්ච නම් එය දුකයි. යමක් දුක නම් එය අනත්තයි (අසාරයි). යමක් අනත්ත නම් (අසාර නම්) එය මාගේ නොවේ, ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේ යැයි, එහි යථාර්ථය නුවණින් දැකිය යුතුයි.

**ඛයට්ඨේන අනිච්චං**

නිරන්තරයෙන් ක්ෂය වන්නා වූද / විපරිණාමය වන්නා වූද / විනාශ වන්නා වූද / එබැවින් විනාශයක්ම අත් කර දෙන්නා වූද අර්ථයෙන් "අනිච්ච" නම් වේ.

**භයට්ඨේන දුක්ඛං**

ඒ විපරිණාමීය ලක්ෂණය / විනාශකාරි ලක්ෂණය හේතුවෙන් නිරන්තරයෙන් පැවැත්ම ගැන භය උපදවන / භයක්ම අත් කර දෙන්නා වූ අර්ථයෙන් "දුක්ඛ" නම් වේ.

**අසාරකට්ඨේන අනත්තා**

යමක් අනිච්ච නම්, දුක නම්, විපරිණාමීය - විනාශකාරි ස්වභාවයෙන් යුක්ත නම්, එහි මම - මගේ යනුවෙන් ගත යුතු - ගත හැකි ආත්මීය සාරයෙන් යුත් කිසිවක් නොමැත යන ශූන්‍ය අර්ථයෙන් "අනත්ත" නම් වේ.

යං කිඤ්චි දුක්ඛං සම්භොති, සබ්බං සඞ්ඛාරපච්චයා (ඛය ධම්ම)
සඞ්ඛාරානං නිරොධෙන, නත්ථි දුක්ඛස්ස සම්භවො (වය ධම්ම)

යම්කිසි දුකක් පහළවේද, සියල්ල සංස්කාර ප්‍රත්‍යය කොටගෙනය. සංස්කාර නිරෝධ කල්හි දුක් පහළවීමක් නැත්තේය.

යං කිඤ්චි දුක්ඛං සම්භොති, සබ්බං ආහාරපච්චයා (ඛය ධම්ම)
ආහාරානං නිරොධෙන, නත්ථි දුක්ඛස්ස සම්භවො (වය ධම්ම)

යම්කිසි දුකක් පහළවේද, සියල්ල ආහාරය හේතු කොටගෙනය. ආහාරය නිරෝධ කල්හි දුක් පහළවීමක් නැත්තේය.

යං කිඤ්චි දුක්ඛං සම්භොති, සබ්බං ඉඤ්ජිතපච්චයා (ඛය ධම්ම)
ඉඤ්ජිතානං නිරොධෙන, නත්ථි දුක්ඛස්ස සම්භවො (වය ධම්ම)

යම් කිසි දුකක් පහළවේද, සියල්ල තෘෂ්ණාදී හැඟීම් හේතු කොටගෙනය. තෘෂ්ණාදී හැඟීම් නිරෝධ කල්හි දුක් පහළවීමක් නැත්තේය.

## උප්පාදවයට්ඨෙන අනිච්චා
## පංචස්කන්ධය උදවීම සහ වයවීම
## සසර උදව සහ සසර අවසානය

කිං අනිච්චං? පඤ්චක්ඛන්ධා අනිච්චා. කෙනට්ඨෙන අනිච්චා? උප්පාදවයට්ඨෙන අනිච්චා. පඤ්චන්නං ඛන්ධානං උදයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති, උදයබ්බයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති? පඤ්චන්නං ඛන්ධානං උදයං පස්සන්තො පඤ්චවීසති ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො පඤ්චවීසති ලක්ඛණානි පස්සති. පඤ්චන්නං ඛන්ධානං උදයබ්බයං පස්සන්තො ඉමානි පඤ්ඤාස ලක්ඛණානි පස්සති.

අනිච්ච ය යන මෙහි කුමක් අනිච්ච ද ? පඤ්චස්කන්ධයෝ අනිච්ච යහ. කිනම් අර්ථයකින් අනිච්ච වෙත්ද?උප්පාද සහ නිරෝධ අර්ථයෙන් අනිච්ච යහ. පඤ්චස්කන්ධයන්ගේ උදය (ඉපදීම) දක්නේ කෙතෙක් ලක්ෂණයන් දකියිද? වය (නිරෝධය) දක්නේ කෙතෙක් ලක්ෂණ දකියිද? උදය වය දෙක දක්නේ කෙතෙක් ලක්ෂණ දකියිද? පඤ්චස්කන්ධයන්ගේ උදය දක්නේ පස් විස්සක් ලක්ෂණ දකියි. වය දක්නේ පස් විස්සක් ලක්ෂණ දකියි. උදය වය දෙක දක්නේ මේ පනසක් ලක්ෂණ දකියි.

**උප්පාද / උදය (සමුදය)**

රූපක්ඛන්ධස්ස උදයං පස්සන්තො පඤ්ච ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො පඤ්ච ලක්ඛණානි පස්සති; උදයබ්බයං පස්සන්තො දස ලක්ඛණානි පස්සති. පෙ..

රූපස්කන්ධයාගේ උදය දක්නේ ලක්ෂණ පහක් දකී. වය දක්නේ ලක්ෂණ පහක් දකී. උදය (රූපයේ උදව) හා වය (රූපයේ අවසානය) දක්නේ ලක්ෂණ දසයක් දකී. පෙ...

රූපක්ඛන්ධස්ස උදයං පස්සන්තො කතමානි පඤ්ච ලක්ඛණානි පස්සති? අවිජ්ජාසමුදයා රූපසමුදයොති පච්චයසමුදයට්ඨෙන රූපක්ඛන්ධස්ස උදයං පස්සති. තණ්හාසමුදයා රූපසමුදයොති පච්චයසමුදයට්ඨෙන රූපක්ඛන්ධස්ස උදයං පස්සති. කම්මසමුදයා රූපසමුදයොති පච්චයසමුදයට්ඨෙන රූපක්ඛන්ධස්ස උදයං පස්සති. ආහාරසමුදයා රූපසමුදයොති පච්චයසමුදයට්ඨෙන රූපක්ඛන්ධස්ස උදයං පස්සති. නිබ්බත්තිලක්ඛණං පස්සන්තොපි රූපක්ඛන්ධස්ස පස්සති. රූපක්ඛන්ධස්ස උදයං පස්සන්තො ඉමානි පඤ්ච ලක්ඛණානි පස්සති.

රූප ස්කන්ධයාගේ උදවීම දක්නේ කවර නම් ලක්ෂණ පසක් දක්නේ ද? අවිද්‍යාව උදවීම හේතුකොටගෙන රූපයාගේ උදව වේයයි ප්‍රත්‍යයාගේ උදවීම අර්ථයෙන් රූපස්කන්ධයාගේ හටගැනීම දකී. තෘෂ්ණාව උදවීම හේතුකොටගෙන රූපයාගේ උදව වේයයි ප්‍රත්‍යාගේ උදවීම අර්ථයෙන් රූප ස්කන්ධයාගේ හටගැනීම දකී.

කර්මයාගේ උදවීම හේතුකොටගෙන රූපයාගේ උදව වේයයි ප්‍රත්‍යයාගේ උදවීම අර්ථයෙන් රූප ස්කන්ධයාගේ හටගැනීම දකී. ආහාරයාගේ උදවීම හෙතුකොටගෙන රූපයාගේ උදව වේයයි ප්‍රත්‍යයාගේ උදවීම අර්ථයෙන් රූප ස්කන්ධයාගේ හටගැනීම දකී. නිබ්බත්ති (වැඩීම) ලක්ෂණය දක්නේ ද රූපස්කන්ධයාගේ හටගැනීම දකී. රූපස්කන්ධයාගේ උදවීම දක්නේ මේ ලක්ෂණ පස දකී.

වේදනාක්ඛන්ධස්ස...පෙ..., සඤ්ඤාක්ඛන්ධස්ස...පෙ..., සඞ්ඛාරක්ඛන්ධස්ස...පෙ..., විඤ්ඤාණක්ඛන්ධස්ස...පෙ

### වය / අත්තංගම (නිරෝධය)

වයං පස්සන්තො කතමානි පඤ්ච ලක්ඛණානි පස්සති? අවිජ්ජානිරොධා රූපනිරොධොති පච්චයනිරොධට්ඨෙන රූපක්ඛන්ධස්ස වයං පස්සති. තණ්හානිරොධා රූපනිරොධොති පච්චයනිරොධට්ඨෙන රූපක්ඛන්ධස්ස වයං පස්සති. කම්මනිරොධා රූපනිරොධොති පච්චයනිරොධට්ඨෙන රූපක්ඛන්ධස්ස වයං පස්සති. ආහාර නිරොධා රූපනිරොධොති පච්චයනිරොධට්ඨෙන රූපක්ඛන්ධස්ස වයං පස්සති. විපරිණාමලක්ඛණං පස්සන්තොපි රූපක්ඛන්ධස්ස වයං පස්සති. රූපක්ඛන්ධස්ස වයං පස්සන්තො ඉමානි පඤ්ච ලක්ඛණානි පස්සති. උදයබ්බයං පස්සන්තො ඉමානි දස ලක්ඛණානි පස්සති.

නිරෝධය දක්නේ කිනම් ලක්ෂණ පහක් දකීද? අවිද්‍යාව නිරෝධවීමෙන් රූපයාගේ නිරෝධය වේයයි ප්‍රත්‍යය නිරෝධ අර්ථයෙන් රූපස්කන්ධයාගේ අවසානය දකී. තෘෂ්ණාව නිරෝධවීමෙන් රූපයාගේ නිරෝධය වේයයි ප්‍රත්‍යය නිරෝධ අර්ථයෙන් රූපස්කන්ධයාගේ අවසානය දකී. කර්මය නිරෝධ වීමෙන් රූපයාගේ නිරෝධය වේයයි ප්‍රත්‍යය නිරෝධ අර්ථයෙන් රූපස්කන්ධයාගේ අවසානය දකී. ආහාරයාගේ නිරෝධවීමෙන් රූපයාගේ නිරෝධය වේයයි ප්‍රත්‍යයයාගේ නිරෝධ අර්ථයෙන් රූපස්කන්ධයාගේ අවසානය දකී. විපරිණාම ලක්ෂණය දක්නේද

රූපස්කන්ධයාගේ අවසානය දකී. රූපස්කන්ධයාගේ අවසානය දක්නේ මේ ලක්ෂණ පස දකී. උදවීම් හා වයවීම දක්නේ මේ ලක්ෂණ දසය දකී.

වේදනාක්ඛන්ධස්ස...පෙ..., සඤ්ඤාක්ඛන්ධස්ස...පෙ..., සඞ්ඛාරක්ඛන්ධස්ස...පෙ..., විඤ්ඤාණක්ඛන්ධස්ස....පෙ

## ඒකායන නිර්වාණ මාර්ගය වන

# තිලකුණු අනුපස්සනා

| | |
|---|---|
| 1. සබ්බේ සංඛාරා අනිච්චාති | (සියලු සංස්කාර අනිච්ච ය) |
| යදා පඤ්ඤාය පස්සති | (එය ප්‍රඥාවෙන් දැකිය යුතුය) |
| අථ නිබ්බින්දති දුක්ඛේ | (එවිට සියලු දුකින් අත මිදෙයි) |
| ඒස මග්ගෝ විසුද්ධියා | (එය විසුද්ධියේ (විමුක්තියේ) මාර්ගයයි) |
| 2. සබ්බේ සංඛාරා දුක්ඛාති | (සියලු සංස්කාර දුක ය) |
| යදා පඤ්ඤාය පස්සති | (එය ප්‍රඥාවෙන් දැකිය යුතුය) |
| අථ නිබ්බින්දති දුක්ඛේ | (එවිට සියලු දුකින් අත මිදෙයි) |
| ඒස මග්ගෝ විසුද්ධියා | (එය විසුද්ධියේ (විමුක්තියේ) මාර්ගයයි) |
| 3. සබ්බේ ධම්මා අනත්තාති | (සියලු ධර්ම අසාර ය) |
| යදා පඤ්ඤාය පස්සති | (එය ප්‍රඥාවෙන් දැකිය යුතුය) |
| අථ නිබ්බින්දති දුක්ඛේ | (එවිට සියලු දුකින් අත මිදෙයි) |
| ඒස මග්ගෝ විසුද්ධියා | (එය විසුද්ධියේ (විමුක්තියේ) මාර්ගයයි) |
| 4. අනිච්චාවත සංඛාරා | (සියලු සංස්කාර ඒකාන්තයෙන් |
| උප්පාද වය ධම්මිනෝ | දුක ගෙන දෙන්නේ ය) |
| උප්පජ්ජිත්වා නිරුජ්ජන්ති | (සංස්කාර යනු හටගැනීම |
| තේසං වූපසමෝ සුඛෝ | අවසන් කළයුතු ධර්මයකි) |
| | (හටගත් සියලු සංස්කාර |
| | නිරුද්ධ වී යයි) |
| | (එහි සංසිඳීමක් - නූපදීමක් |
| | ඇද්ද එය පරම සැපයයි) |
| 5. ඒතං සන්තං ඒතං පණීතං | (එයම ශාන්ත වේ.. |
| යදිදං සබ්බ සංඛාර සමථෝ | එයම ප්‍රණීත වේ..... ) |

| | |
|---|---|
| සබ්බූපධි පටිනිස්සග්ගෝ | (එය සියලු සංස්කාරයන්ගේ |
| තණ්හාක්ඛයෝ | සමථයයි) |
| විරාගෝ | (එය සියලු අල්ලාගැනීම් - |
| නිරොධො | උපද්‍රවයන් අත්හැරීමයි) |
| නිබ්බානන්ති | (එය ඇල්ම හෙවත් |
| | තණ්හාවේ අවසානයයි) |
| | (එය සියලු අරමුණු ඇසුරු |
| | කිරීමෙන් වෙන්වීමයි) |
| | (එය රාග, ද්වේෂ, මෝහ |
| | නිරෝධය හෙවත් නූපදීමයි) |
| | (එය පරම සුවය වන |
| | නිර්වාණයයි ....) |
| 6. යං කිඤ්චි දුක්ඛං සම්භෝති | (යම්කිසි දුකක් උපදින්නේද ....) |
| සබ්බං සංඛාර පච්චයා | (ඒ සියල්ලට හේතුව |
| සංඛාරානං නිරෝධෙන | සංස්කාර හටගැනීමයි) |
| නත්ථි දුක්ඛස්ස සම්භවෝ | (සංස්කාරයන්ගේ |
| | හටනොගැනීමක් - |
| | නිරෝධයක් ඇද්ද) |
| | (එවිට දුක නූපදී. |
| | දුක හට නොගනී.) |
| 7. වය ධම්මා සංඛාරා | (සංස්කාර අවසන් කළයුතු - |
| අප්පමාදෙන සම්පාදේත | නිමා කළයුතු ධර්මයකි) |
| | (අප්‍රමාදීව එය සිදු කරව්!) |

## පරම ශාන්ත නිවන

සියලු රාග, ද්වේෂ, මෝහ ක්ෂය කර, උතුම් නිවනට පත්ව සියලු සංසාර දුකින් අත මිදීමට නම්, පංච උපාදානස්කන්ධයේ (මම මගේ යනුවෙන් ප්‍රිය භාවයෙන් අල්ලාගෙන ඇති සියල්ලෙහි) යථාර්ථය ත්‍රිලක්ෂණයට අනුව ප්‍රඥාවෙන් විමසා බැලිය යුතු ය. එයට විදර්ශනාව යයි කියනු ලැබේ. විදර්ශනා නුවණ වඩවන අරිය ශ්‍රාවකයාගේ චිත්ත සන්තානයේ සියලු සංඛාර (රාග, ද්වේෂ, මෝහ සංචේතනා) ක්‍රමානුකූලව සහමුලින් දුරු වී යයි, සංසිඳී යයි, නිරෝධයට (නැවත නූපදින තත්වයට) පත් වෙයි. එකී නිරෝධය වූ කලී සදාතනික විමුක්තිය වන පරම ශාන්ත නිවනයි.

## සම සතළිස් විදර්ශනා කර්මස්ථාන

(ඛුද්දකනිකාය / පටිසම්භිදාමග්ගපාළි / පඤ්ඤාවග්ගො / විපස්සනා කථා)

මූලික ත්‍රිලක්ෂණය අනු ලක්ෂණ 40 ක් වශයෙන් විස්තාරණ ක්‍රමයට නුවණින් දැකීම සම සතළිස් විදර්ශනා කර්මස්ථාන නම් වේ. ආස්වාදය සහ ආස්වාදයට ප්‍රත්‍ය වන සියල්ල මෙම ලක්ෂණ 40 ට අනුකූලව නුවණින් විමසා බැලීම තුළින් සියල්ල කෙරෙහි ඇති ඡන්දරාගය දුරු වී යයි. සිත නිස්සරණයට පත් වෙයි. නිවන පූර්ණ වෙයි.

**සියල්ල සියලු ආකාරයෙන් (තිස්පොළ විදර්ශනා කිරීම)**

ඇස (චක්ඛු) - රූපය - චක්ඛු විඤ්ඤාණය - චක්ඛු සම්ඵස්සය - චක්ඛු සම්ඵස්සජා වේදනා (ඇසෙහි ආස්වාදය)

කණ (සෝත) - ශබ්දය - සෝත විඤ්ඤාණය - සෝත සම්ඵස්සය - සෝත සම්ඵස්සජා වේදනා (කණෙහි ආස්වාදය)

නාසය (ඝාන) - ගන්ධය - ඝාන විඤ්ඤාණය - ඝාන සම්ඵස්සය - ඝාන සම්ඵස්සජා වේදනා (නාසයෙහි ආස්වාදය)

දිව (ජිව්හා) - රසය - ජිව්හා විඤ්ඤාණය - ජිව්හා සම්ඵස්සය - ජිව්හා සම්ඵස්සජා වේදනා (දිවෙහි ආස්වාදය)

කය (කාය) - ඵොට්ඨබ්බය - කාය විඤ්ඤාණය - කාය සම්ඵස්සය - කාය සම්ඵස්සජා වේදනා (කයෙහි ආස්වාදය)

## අනිච්චානුපස්සනා

අනිච්චතොති - නිශ්චිත පැවැත්මක් - පැනවීමක් නොමැති ස්වභාවය / හේතූන් නිසා හට ගෙන හේතු නිරෝධයෙන් පැවැත්ම අවසන් වන ලක්ෂණය

පලොකතොති - පළුදු වන / විනාශවන / විනාශකාරි ලක්ෂණය

චලතොති - සැලෙන / චංචල වන / කම්පාවන / කම්පා කරවන ලක්ෂණය

පභංගුතොති - බිඳෙනසුලු / කැඩී බිඳී යන / කඩා බිඳ දමන ලක්ෂණය

අද්ධුවතොති - ස්ථිර වශයෙන් - නිත්‍ය වශයෙන් නොපවතින ලක්ෂණය

විපරිණාමධම්මතොති - වෙනස්වෙමින් අන්‍යභාවයන්ට පත්ව විනාශය කරා ගමන් කරන ලක්ෂණය

විභවතොති - අභාවයට පත්වන / අභාවයට පත් කරන ලක්ෂණය

සඞ්ඛතතොති - පෙර නොතිබීම, සංයෝජන හේතුවෙන් සකස් වූ / සකස්වන / සකස් කරන ලක්ෂණය

මරණධම්මතොති - මරණයෙන් කෙළවර වන / කෙළවර කරන ලක්ෂණය

## දුක්ඛානුපස්සනා

දුක්ඛතොති - සිත දූෂ්‍ය කරන අසහනකාරි ලක්ෂණය

රොගතොති - රෝගයක් බඳු නිරන්තර පීඩාවන් ඇති කරන ලක්ෂණය

ගණ්ඩතොති - ගෙඩියක් /පිළිකාවක් බඳු පෙළීම් ඇති කරන ලක්ෂණය

අඝතොති - පාපයක් / විපතක් බඳු අවැඩක්ම සලසන ලක්ෂණය

සල්ලතොති - ආයුධයක් / හුලක් බඳු තියුණු දුක් වේදනා ගෙන දෙන ලක්ෂණය

අතාණතොති - ආරක්ෂාව අහිමි වී යාම බඳු ලක්ෂණය

අලෙණතොති - අනාරක්ෂිත ස්ථානයක වාසය කිරීම බඳු ලක්ෂණය

අසරණතොති - පිහිට / පිළිසරණ අහිමි කරන ලක්ෂණය

ආබාධතොති - ආබාධයක් බඳු අපහසුතා ඇති කරන ලක්ෂණය

ඊතිතොති - දුක් විපත්ති උරුම කරදෙන ලක්ෂණය

අඝමූලතොති - පාපයට / විපතට / දුකට / ගැටුමට හේතු සකස් කරන ලක්ෂණය

වධකතොති - වධ / හිරිහැර ගෙනදෙන ලක්ෂණය

මාරාමිසතොති - මාරයාටම ගොදුරු වන / මාරයාගේ ආහාරය බඳු ලක්ෂණය

ජාතිධම්මතොති - නැවත නැවත උපත සකස් කරන ලක්ෂණය

සාසවතොති - ආශ්‍රව / ආශාවන් / කෙළෙස් වඩවන ලක්ෂණය

ආදීනවතොති - දෝෂ / විපත් / ප්‍රශ්න / කරදර උරුම කරදෙන ලක්ෂණය

ජරාධම්මතොති - ජරාව / දිරා යාම / දුර්වලභාවය හිමි කරදෙන ලක්ෂණය

බ්‍යාධිධම්මතොති - ව්‍යාධියට / වැනසීමට නැඹුරු වී සිටින ලක්ෂණය

උපද්දවතොති - උවදුරු / උපද්‍රව උරුම කර දෙන ලක්ෂණය

භයතොති - භය ගෙන දෙන / භය ඇති කරන ලක්ෂණය

උපසග්ගතොති - බාධා / අවහිරතා ඇති කරන ලක්ෂණය

සොකධම්මතොති - ශෝකය ගෙන දෙන ලක්ෂණය

පරිදෙවධම්මතොති - හැඬීම / වැළපීම උරුම කර දෙන ලක්ෂණය

උපායාසධම්මතොති - බලවත් සිත් තැවුල් / බලවත් වෙහෙස ඇති කරන ලක්ෂණය

සංකිලෙසිකධම්මතොති - සිත කිළුටු කරන / සිත අපවිත්‍ර කරන ලක්ෂණය

## අනත්තානුපස්සනා

පරතොති - ස්වකීය නොවූ / තමන්ට අයත් නොවූවක් බඳු (මාරයාට අයිති) ලක්ෂණය

රිත්තතොති - ගතයුත්තක් නැති / හිස් වූ ලක්ෂණය

තුච්ඡතොති - නිෂ්ඵල වූ / හරයක් නොමැති / පහත් ලාමක වූ ලක්ෂණය

සුඤ්ඤතොති - ඒකීය අවිපරිණාමීය ආත්මයෙන් ශූන්‍ය වූ ලක්ෂණය

අසාරකතොති - ආත්මීය වශයෙන් අත්පත් කර ගැනීමට සුදුසු කිසිවක් නොමැති නිසරු ලක්ෂණය

අනත්තතොති - ආත්මීය වශයෙන් කිසිවක් අත්පත් කර ගත නොහැකි ලක්ෂණය

## අනිච්චසඤ්ඤාසුත්තං

**(සංයුත්තනිකාය / ඛන්ධවග්ගපාළි / ඛන්ධසංයුත්තං / පුප්ඵවග්ගො)**

අනිච්චසඤ්ඤා, භික්ඛවෙ, භාවිතා බහුලීකතා සබ්බං කාමරාගං පරියාදියති, සබ්බං රූපරාගං පරියාදියති, සබ්බං භවරාගං පරියාදියති, සබ්බං අවිජ්ජං පරියාදියති, සබ්බං අස්මිමානං සමූහනති.

**මහණෙනි, වඩන ලද, පුරුදු කරන ලද අනිච්ච සංඥාව සියලු කාමරාගය ක්ෂය කරයි. සියලු රූපරාගය ක්ෂය කරයි. සියලු භවරාගය ක්ෂය කරයි. සියලු අවිද්‍යාව ක්ෂය කරයි. සියලු අස්මිමානය සහමුලින්ම විනාස කෙරෙයි.**

සෙය්‍යථාපි, භික්ඛවෙ, කූටාගාරස්ස යා කාචි ගොපානසියො සබ්බා තා කූටඞ්ගමා කූටනින්නා කූටසමොසරණා, කූටං තාසං අග්ගමක්ඛායති; එවමෙව ඛො, භික්ඛවෙ, අනිච්චසඤ්ඤා භාවිතා...පෙ.... සබ්බං අස්මිමානං සමූහනති.

**මහණෙනි, යම්සේ වනාහි මුදුන් ගෙයක යම්කිසි පරාල වෙද්ද, ඒ සියලු පරාල මුදුණකරා යෙද්ද, මුදුණට වදින බැවින් එයට නැඹුරු වෙද්ද, මුදුණට මනාව රැස්ව සිටිද්ද, මුදුණ ඒ ගොණැසි අතුරෙන් අග්‍රයයි කියනු ලැබේ. මහණෙනි, එපරිද්දෙන්ම වඩනා ලද, පුරුදු කරන ලද අනිච්ච සංඥාව සියලු කාමරාගය ක්ෂය කෙරෙයි, සියලු රූපරාගය ක්ෂය කෙරෙයි, සියලු භවරාගය ක්ෂය කෙරෙයි, සියලු අවිද්‍යාව ක්ෂය කෙරෙයි. සියලු අස්මිමානය සහමුලින් විනාස කෙරෙයි.**

සෙය්‍යථාපි, භික්ඛවෙ, යෙ කෙචි පුප්ඵගන්ධා, වස්සිකං තෙසං අග්ගමක්ඛායති; එවමෙව ඛො, භික්ඛවෙ, අනිච්චසඤ්ඤා... පෙ.... සබ්බං අස්මිමානං සමූහනති.

මහණෙනි, යම්සේ වනාහි යම්කිසි මල් සුවඳ වෙද්ද, ඔවුන් අතුරෙන් සමන්මල් (සුවඳ) අග්‍රයයි කියනු ලැබේද, මහණෙනි, එපරිද්දෙන්ම වඩන ලද, පුරුදු කරන ලද අනිච්ච සංඥාව සියලු කාමරාගය ක්ෂය කෙරෙයි, සියලු රූපරාගය ක්ෂය කෙරෙයි, සියලු භවරාගය ක්ෂය කෙරෙයි, සියලු අවිද්‍යාව ක්ෂය කෙරෙයි, සියලු අස්මිමානය සහමුලින් විනාස කෙරෙයි.

## ගිරිමානන්දසුත්තං

(අඞ්ගුත්තරනිකාය / දසකනිපාතො / සචිත්තවග්ගො)

කතමාචානන්ද, අනිච්චසඤ්ඤා? ඉධානන්ද, භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසඤ්චික්ඛති - 'රූපං අනිච්චං, වෙදනා අනිච්චා, සඤ්ඤා අනිච්චා, සඞ්ඛාරා අනිච්චා, විඤ්ඤාණං අනිච්ච'න්ති. ඉති ඉමෙසු පඤ්චසු උපාදානක්ඛන්ධෙසු අනිච්චානුපස්සී විහරති. අයං වුච්චතානන්ද, අනිච්චසඤ්ඤා.

ආනන්දය, අනිච්ච සංඥාව කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම වනයකට ගියේ හෝ, රුකක් මුලකට ගියේ හෝ, හිස් ගේකට ගියේ හෝ රූපය අනිච්ච ය, වේදනාව අනිච්ච ය, සංඥාව අනිච්ච ය, සංස්කාරය අනිච්ච ය, විඤ්ඤාණය අනිච්ච යයි, මෙසේ ප්‍රත්‍යවෙක්ෂා (නුවණින් බැලීම) කරයි.

- රූප උපාදානස්කන්ධය
- වේදනා උපාදානස්කන්ධය
- සංඥා උපාදානස්කන්ධය
- සංඛාර උපාදානස්කන්ධය
- විඤ්ඤාණ උපාදානස්කන්ධය

**'මෙසේ මේ මාගේය' යි ඇලීම ඇතිකර ගත් ධර්ම පසා කෙරෙහි අනිච්ච ලක්ෂණයට අනුව බලමින් වාසය කරයි. ආනන්දය, මේ අනිච්ච සංඥාවය.**

කතමාචානන්ද, සබ්බසඞ්ඛාරෙසු අනිච්චසඤ්ඤා?

ඉධානන්ද, භික්ඛු සබ්බසඞ්ඛාරෙසු අට්ටීයති හරායති ජිගුච්ඡති. අයං වුච්චතානන්ද, සබ්බසඞ්ඛාරෙසු අනිච්චසඤ්ඤා.

**ආනන්දය, සියලු සංස්කාරයන්හි අනිච්ච සංඥාව කවරී ද?**

**ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම සියලු සංස්කාරයන් පෙළීමක් ලෙසද, හරයෙන් ශූන්‍ය වූවක් ලෙසද, පිළිකුල් වූවක් (පිළිකුලින් බැහැර කළ යුත්තක්) ලෙසද නුවණින් දැක දුරු කෙරෙයි. ආනන්දය, මේ සියලු සංස්කාරයන් අනිච්ච සංඥාව යැයි කියනු ලැබේ.**

## සාමණ්ඩකසුත්තං

**(සංයුත්තනිකාය / සළායතනවග්ගපාළි / සාමණ්ඩකසංයුත්තං)**

නිබ්බානං, නිබ්බාන'න්ති, ආවුසො සාරිපුත්ත, වුච්චති. කතමං නු ඛො, ආවුසො, නිබ්බාන'න්ති?

යො ඛො, ආවුසො, රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො - ඉදං වුච්චති නිබ්බාන'න්ති.

**ඇවැත්නි, ශාරීපුත්‍රය, නිර්වාණය නිර්වාණයයි කියනු ලැබේ. ඇවැත්නි, නිර්වාණය යනු කුමක්ද?**

**ඇවැත්නි, රාගය ක්ෂය කිරීමක් ඇද්ද, ද්වේෂය ක්ෂය කිරීමක් ඇද්ද, මෝහය ක්ෂය කිරීමක් ඇද්ද, මේ නිර්වාණය යැයි කියනු ලැබේ.**

## අනවත්ථිතසුත්තං

**(අඞ්ගුත්තරනිකාය / ඡක්කනිපාතපාළි / ආනිසංසවග්ගො)**

ඡ, භික්ඛවෙ, ආනිසංසෙ සම්පස්සමානෙන අලමෙව භික්ඛුනා සබ්බසඞ්ඛාරෙසු අනොධිං කරිත්වා අනිච්චසඤ්ඤං උපට්ඨාපෙතුං. කතමෙ ච 'සබ්බසඞ්ඛාරා ච මෙ අනවත්ථිතා ඛායිස්සන්ති, සබ්බලොකෙ ච මෙ මනො නාභිරමිස්සති, සබ්බලොකා ච මෙ මනො වුට්ඨහිස්සති, නිබ්බානපොණඤ්ච මෙ මානසං භවිස්සති, සංයොජනා ච මෙ පහානං ගච්ඡිස්සන්ති, පරමෙන ච සාමඤ්ඤෙන සමන්නාගතො භවිස්සාමී'ති.

මහණෙනි, අනුසස් සයක් බලන්නාවූ භික්ෂුව විසින් සියලු සංස්කාරයන්හි සීමා රහිතව 'අනිච්ච' යන හැඟීම වැඩීමට සෑහේමය. කවර සයක්ද යත්?

**මගේ සියලු සංස්කාරයෝ අස්ථිර බැවින්**
**ක්ෂය වී යන්නේ ය.**
**මගේ සිත මුළු ලොවෙහි නොඇලෙන්නේ ය.**
**මගේ සිත සියලු ලෝකයෙන් නැඟී සිටින්නේ ය.**
**මගේ සිත නිවනට නැමුණේ වන්නේ ය.**
**මගේ (කාමඡන්දාදී) සංයෝජන පහ වී යන්නේ ය.**
**උතුම් වූ මහණකමින් යුක්ත වූයේ වන්නේ ය.**

## නිරොධො නිබ්බානං

### සංඛාර - සංඛාරයට හේතුව - සංඛාර නිරෝධය - සංඛාර නිරෝධ මාර්ග ප්‍රතිපදාව

සංස්කාර (සංඛාර) යනු රාග, ද්වේෂ, මෝහ, මනෝ සංචේතනා (මනෝ සංඛාර), වචී සංචේතනා (වචී සංඛාර), කාය සංචේතනා (කාය සංඛාර) ක්‍රියාවලියයි. සංඛාර (අභිසංඛාර) යනු සිත, කය, වචනය යන තුන් දොරින් ක්‍රියාත්මක රාග, ද්වේෂ, මෝහ සහිත සචේතනික ක්‍රියාවලියයි.

මනෝ සංඛාර නොහොත් මනෝ සංචේතනා යනු රාගයෙන් ද්වේෂයෙන් මෝහයෙන් යුක්තව සිත ක්‍රියාත්මක වීමයි.

වචී සංඛාර නොහොත් වචී සංචේතනා යනු රාගයෙන් ද්වේෂයෙන් මෝහයෙන් යුක්තව වචන ක්‍රියාත්මක වීමයි.

කාය සංඛාර නොහොත් කාය සංචේතනා යනු රාගයෙන් ද්වේෂයෙන් මෝහයෙන් යුක්තව කය ක්‍රියාත්මක වීමයි.

තත්ථ කතමෙ අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, පුඤ්ඤාභිසඞ්ඛාරො, අපුඤ්ඤාභිසඞ්ඛාරො, ආනෙඤ්ජාභිසඞ්ඛාරො, කායසඞ්ඛාරො, වචීසඞ්ඛාරො, චිත්තසඞ්ඛාරො.

එහි අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ කවරහ යත්, පුණ්‍යාභිසංස්කාරය, අපුණ්‍යාභිසංස්කාරය, ආනඤ්ජාභිසංසස්කාර ය, කායසංස්කාර ය, වාග්සංස්කාරය, චිත්තසංස්කාර යි.

තත්ථ කතමො පුඤ්ඤාභිසඞ්ඛාරො, කුසලාචෙතනා කාමාවචරා, රූපාවචරා දානමයා, සීලමයා, භාවනාමයා, අයං වුච්චති පුඤ්ඤාභිසඞ්ඛාරො.

එහි පුණ්‍යාභිසංස්කාර කවරෙද යත්, දානමය වූ ද ශීලමය වූ ද භාවනාමය වූ ද කාමාවචර වූ රූපාවචර වූ කුසල චේතනා යි. මේ පුණ්‍යාභිසංස්කාර යි කියනු ලැබේ.

තත්ථ කතමො අපුඤ්ඤාභිසඞ්ඛාරො, අකුසලා චෙතනා කාමාවචරා, අයං වුච්චති අපුඤ්ඤාභිසඞ්ඛාරො.

එහි අපුණ්‍යාභිසංස්කාර කවරෙ යත් කාමාවචර අකුසල චේතනා යි. මේ අපුණ්‍යාභිසංස්කාර යි කියනු ලැබේ.

තත්ථ කතමො ආනෙඤ්ජාභිසඞ්ඛාරො, කුසලා චෙතනා අරූපාවචරා, අයං වුච්චති ආනෙඤ්ජාභිසඞ්ඛාරො.

එහි ආනෙඤ්ජාභිසංස්කාර කවරෙ යත් අරූපාවචර කුසල චේතනා යි. මේ ආනෙඤ්ජාභිසංස්කාර යි කියනු ලැබේ.

තත්ථ කතමො කායසඞ්ඛාරො, කායසඤ්චෙතනා කායසඞ්ඛාරො, වචීසඤ්චෙතනා වචීසඞ්ඛාරො, මනොසඤ්චෙතනා චිත්තසඞ්ඛාරො. ඉමෙ වුච්චන්ති අවිජ්ජාපච්චයා සඞ්ඛාරා.

එහි කායසංස්කාර කවරෙ යත් කායසඤ්චේතනාව කායසංස්කාර ය, වචීසඤ්චේතනාව වාග්සංස්කාර ය, මනෝසඤ්චේතනාව චිත්තසංස්කාර යි. මොහු අවිද්‍යා ප්‍රත්‍යයෙන් උපදනා සංස්කාරහ යි කියනු ලැබෙත්.

අවිජ්ජාවෙන් යුක්ත සිත විසින්ම, කර්ම භවය සකස් කරගැනීම උදෙසා, සංයෝජන සහිතව සිත, කය, වචනය ක්‍රියාත්මක කරවනු ලබයි. එසේ සිත, කය, වචන ක්‍රියාත්මක කිරීමට නම්, සිත තුළ යම් ශක්තියක් ජනනය විය යුතු ය. එම ශක්තිය ජනනය කරන ක්‍රියාව සංඛාර නම් වේ. එම සංඛාරය සකස් කරන ප්‍රධාන

චෛතසිකය චේතනා නම් වේ. අවිජ්ජාව මුළුමනින් අවසන් නොවූ සිතක, මෙම චේතනාව සකස් වන්නේ රාග, ද්වේෂ, මෝහ හෙවත් සංයෝජනද සහිතව ය. එබැවින් එය සංචේතනා නම් වෙයි. අභිසංඛාර යනු මෙම සංචේතනාවටම නමකි. මතු භවයක් නිර්මාණය කරන කර්ම ශක්තිය ජනිත වන්නේ, මෙම සංචේතනා හෙවත් අභිසංඛාර තුළිනි.

මෙලොවද පරලොවද සත්වයා දුකට පත් වන්නේ, මෙම සංඛාර නිසා ය. සංඛාර සත්වයාගේ අනුදැනුමකින් තොරව හේතුඵල වශයෙන් සිතෙහි හට ගනියි. සම්මා සතියෙන් තොරව සිටින සත්වයාව, සංඛාර මඟින් සිතට අවශ්‍ය අන්දමින් හසුරුවනු ලබයි.

සංඛාර නිසා සත්වයා මෙලොවද රාග, ද්වේෂ, මෝහ ගින්නෙන් දැවෙයි. රාග, ද්වේෂ, මෝහ හේතුවෙන් අලුතෙන් සිතේ ඇතිවන කර්ම ශක්තිය මඟින් සත්වයාට මරණින් පසු, පුනර්භවයක්ද සකසා දෙයි. ඒ හේතුවෙන් සත්වයාට පරලොවද දුක උරුම වෙයි. රාග, ද්වේෂ, මෝහ සංඛාරයන්ගේ ස්වභාවය අනුව පරලොව දුක කෙබඳුදැයි තීරණය වෙයි. සංඛාර හේතුවෙන් සත්වයා මෙලොවද පරලොවද අනන්ත දුක් ගින්නෙන් දැවෙයි.

සංඛාර හේතුවක් නිසා හට ගනියි. සිතේ සංඛාර හට ගැනීමට හේතුව අවිජ්ජාවයි. එනම් උතුම් වූ චතුරාර්ය සත්‍යය අවබෝධ කර නොගැනීමයි. ආස්වාදය දුක වශයෙන් නුවණින් නොදැකීමයි. ආස්වාදය (ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස පිනවීම) සැප වශයෙන් සැලකීම හේතුවෙන් නැවත නැවත සිතේ කර්ම ශක්තිය සකස් වී, නැවත නැවත සසර නමැති භයානක ඝෝර කටුක දුක්ඛස්කන්ධය තමන් හට උරුම වන බව නුවණින් නොදැකීමයි. එම අවිජ්ජාව හේතුවෙන් සත්වයාගේ සිතෙහි නිරන්තරයෙන් රාග, ද්වේෂ, මෝහ සංඛාර හට ගනියි. එය හේතුඵල ක්‍රියාදාමයකි. අවිජ්ජාව නමැති හේතුව පවතිනතුරු සංඛාර හට ගනියි.

සංඛාර හේතුවක ඵලයක් වන නිසාම, හේතුව දුරු කිරීමෙන් අවසන් කළහැකි, නිමා කළහැකි ධර්මතාවකි. ගින්දර හට ගන්නේ - පවතින්නේ දර නමැති හේතුව නිසා නම්, දර අවසන් කිරීමෙන් ගින්දර නිවා දැමිය හැකිය, නිමා කළ හැකි ය.

එසේම අවිජ්ජාව දුරු කිරීමෙන් සංඛාර අවසන් කළ හැකි ය. එනම් මෙතෙක් කල් සැපයැයි සිතා සිටි ආස්වාදය, සත්වයා දුකට ඇද හෙළන මර උගුල බව නුවණින් දැකීමෙන්, ආස්වාදය පසුපස හඹා යාම නිසා මෙලොවත් පරලොවත් සියලු දුක් උරුම වන බව නුවණින් දැකීමෙන්, එහෙයින් ආස්වාදය දුක බව නුවණින් දැකීමෙන් අවිජ්ජාව ක්‍රම ක්‍රමයෙන් දුරු කළ හැකි ය. එවිට සංඛාර ක්‍රම ක්‍රමයෙන් නිවී යාම ඇරඹෙයි. සංඛාර ක්‍රම ක්‍රමයෙන් නූපදින තත්ත්වයට (නිරෝධයට) පත් වෙයි. ආස්වාදය සැප යැයි ගත් මුළා අදහස හෙවත් අවිජ්ජාව දුරු වී යන තරමට, ඊට සමානුපාතිකව සංඛාර දුරු වී යයි.

සංඛාර නිරෝධ වන විට (නූපදින විට) සිත නිවීමට පත් වෙයි. සංසිඳීමට පත්වෙයි. සංඛාර නූපදින නිසා සිතෙහි නැවත නැවත කර්ම ශක්තිය (කර්ම භවය) ගොඩනැගෙන ක්‍රියාවලිය ද අවසන් වී යයි. එවිට මරණින් පසු නැවත උපතක් ඇති කරන හේතු ද අවසන් වී යයි. සිතෙහි සියලු සංඛාර නූපදින තත්වයට (අරිහත් පදවියට) පත් වුවහොත් මෙලොවද පරලොවද දුක සහමුලින් අවසන් වී, සියලු සංසාර දුකෙන් අත මිදෙයි.

දුකෙන් මිදීමට කළ යුත්තේ සියලු සංඛාර හේතුවක් නිසා උපදින බව දැක, එම හේතුව නිරෝධ කිරීමෙන් අප්‍රමාදීව නිරෝධ කිරීමට වෑයම් කිරීමයි. සියලු සංඛාර තමාට මෙලොවද පරලොවද දුකක්ම උරුම කර දෙන බව නුවණින් දැක එය නිරෝධ කිරීමට වෑයම් කිරීමයි. සියලු සංඛාර හරයෙන් ශූන්‍ය බව දැක එය නිරෝධ කිරීමට වෑයම් කිරීමයි. සියලු සංඛාර සාරයෙන් හිස් වූ, අනේක දුක්ඛයන්ගෙන් පිරුණා වූ, අවිනිශ්චිත වූ, භයංකාර වූ, අර්ථයෙන් ශූන්‍ය වූ, නිසරු දුක්ඛිත සසර ගමනකට හේතුවන බව නුවණින්

දැක, සියලු සංඛාර නිරෝධ කිරීමට වෑයම් කිරීමයි. එවිට එම අරිය ශ්‍රාවකයා සියලු සසර දුකින් අත මිදෙයි. ඒ අජරාමර නිවනටම පත්වෙයි. සදාතනික පරම විමුක්ති සුවය උදා කරගනියි.

යං කිඤ්චි දුක්ඛං සම්භොති, සබ්බං සඞ්ඛාරපච්චයා (ඛය ධම්ම)
සඞ්ඛාරානං නිරොධෙන, නත්ථි දුක්ඛස්ස සම්භවො (වය ධම්ම)

**යම්කිසි දුකක් පහළවේද, ඒ සියල්ල සංස්කාර ප්‍රත්‍යය**
**කොටගෙන ය. සංස්කාර නිරෝධ වූ විට**
**දුක් පහළවීමක් නැත්තේය.**

# සංඛාරයන්හි අනිච්චතාව යනු...

- සංඛාර තමා විසින්ද ක්‍රියාත්මක නොකරන්නක් බවයි
- සංඛාර අනුන් විසින්ද ක්‍රියාත්මක නොකරන්නක් බවයි
- සංඛාර ඉබේ පහළ වන්නක්ද නොවන බවයි
- සංඛාර දෙවියන් වහන්සේගේ කැමැත්ත මත හට ගන්නක්ද නොවන බවයි
- සංඛාර සත්වයාගේ අවිජ්ජාව අනුව හේතුඵල වශයෙන් ඒ ඒ මොහොතේදි උදාවන හේතුඵල ධර්මයක් බවයි
- සංඛාර නිශ්චිත වූ අවිපරිණාමීය වූ ධර්මයක් නොවන බවයි
- සංඛාර විපරිණාමයෙන් යුක්ත ධර්මයක් බවයි
- සංඛාර අවිනිශ්චිත ධර්මයක් බවයි
- සංඛාර අස්ථිර ධර්මයක් බවයි
- සංඛාර විනාශය ගෙන දෙන්නා වූ ධර්මයක් බවයි
- සංඛාර පටිච්ච සමුප්පන්න බවයි
- සංඛාර නිශ්චිත අවසානයකට නොපැමිණෙන බවයි
- සංඛාර සීමාවක් නොමැති ධර්මයක් බවයි
- සංඛාර ස්ථිර නොවූ ධර්මයක් බවයි
- සංඛාර සංතෘප්ත නොවන ධර්මයක් බවයි
- සංඛාර කැමැති අයුරින් පැවැත්විය නොහැකි ධර්මයක් බවයි
- සංඛාර කැමැති අන්දමින් හැසිරවිය හැකි ධර්මයක් නොවන බවයි
- සංඛාර තුළින් අපේක්ෂිත සැපය උදා නොවන බවයි
- සංඛාර හරයෙන් ශූන්‍ය බවයි

- සංඛාර හිස්බවින් යුක්ත බවයි
- සංඛාර මායාවක් පමණක් බවයි
- සංඛාර සිතේ පෙළීමක් ඇති කරන බවයි
- සංඛාර සිතේ තාපයක් ඇති කරන බවයි
- සංඛාර සිතේ දාහයක් ඇති කරන බවයි
- සංඛාර ගින්නක් බවයි
- සංඛාර නොනවතින භයංකාර ගංගාවක් වැනි බවයි
- සංඛාර ගිනි ගන්නා වියළි කාන්තාරයක් වැනි බවයි
- සංඛාර අරටුවක් නැති කෙසෙල් කඳක් වැනි බවයි
- සංඛාර මස් කටුවක් ලෙව කෑමක් වැනි බවයි
- සංඛාර නිසරුවූවක් බවයි
- සංඛාර තමාට අයත් නොවන්නක් බවයි
- සංඛාර වසඟයේ පැවැත්වීමට නොහැකි ධර්මයක් බවයි
- සංඛාර ගැන නිශ්චිත නිගමනයකට එළැඹිය නොහැකි බවයි
- සංඛාර භයානක බවයි
- සංඛාර (අභිසංඛාර) ආස්වාද මායාව නිර්මාණය කරන බවයි
- සංඛාර විකෘතියක්ම පෙන්වන බවයි
- සංඛාර සියලු සසර දුක් නිර්මාණය කරන බවයි
- සංඛාර සියලු භය උපදවන බවයි
- සංඛාර ඝෝර කටුක සසර උදා කරන බවයි
- සංඛාර මුළාවක් පමණක් බවයි
- සංඛාර වෙහෙසක් පමණක් වන බවයි
- සංඛාර පීඩාවක් පමණක් වන බවයි

- සංඛාර විඥානයේ (මාරයාගේ) ආහාරය බවයි
- සංඛාර මාරයාගේ පණ නල බවයි
- සංඛාර සිත කෙළෙසන බවයි
- සංඛාර සිත අපවිත්‍ර කරන බවයි
- සංඛාර අසුචියක් වැනි බවයි
- සංඛාර සිත අන්ධ කරන බවයි
- සංඛාර සිත අඳුරු කරන බවයි
- සංඛාර පිළිකුල් කළ යුතු බවයි
- සංඛාර ප්‍රතික්ෂේප කළ යුතු බවයි
- සංඛාර දුරු කළ යුතු බවයි
- සංඛාර අවසානයට පැමිණවිය යුතු බවයි
- සංඛාර ගැන ලැජ්ජා විය යුතු බවයි
- සංඛාර සංසිඳවිය යුතු බවයි
- සංඛාර කෙරෙහි කලකිරිය යුතු බවයි
- සංඛාර කෙරෙහි නොඇලිය යුතු බවයි
- සංඛාර මඟ හැරිය යුතු බවයි
- සංඛාර සහමුලින් පහ කළ යුතු බවයි
- සංඛාර අප්‍රමාදීව ක්ෂය කළ යුතු බවයි
- සංඛාර අප්‍රමාදීව විනාශ කළ යුතු බවයි
- සංඛාර උදාව දුක්ඛ අර්ය සත්‍යය සහ දුක්ඛ සමුදය ආර්ය සත්‍යයන්ට අයත් බව ප්‍රඥාවෙන් දැකිය යුතු බවයි
- සංඛාර නිරෝධය දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය සහ දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යයන්ට අයත් බව ප්‍රඥාවෙන් දැකිය යුතු බවයි

- හටගත් සියලු සංඛාර ගෙවී අවසන් වන බවයි
- සංඛාර හේතු නිරෝධයෙන් අප්‍රමාදිව නිරෝධ කළ හැකි බවයි
- සංඛාර අප්‍රමාදිව නිරෝධ කළ යුතු බවයි
- සංඛාර උපදින්නා වූ සිත, කය, වචනය අප්‍රමාදිව සංවර කළ යුතු බවයි
- සංඛාර යළි නූපදින තත්වයට සිත පිරිසිදු කළ යුතු බවයි
- සංඛාර යළි නූපදින ලෙස සිතේ ඡන්දරාගය පහ කළ යුතු බවයි
- සංඛාර දුරු කිරීම, ක්ෂය කිරීම, සංසිඳීම පරම සැපය වන නිර්වාණය බවයි.

**යාවඤ්චිදං, භික්ඛවෙ, අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං අලං විරජ්ජිතුං අලං විමුච්චිතු'න්ති.**

මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුම ය. නො ඇලීමට සුදුසුමය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය.

**වය ධම්මා සංඛාරා**
**අප්පමාදෙන සම්පාදෙත**

**සංඛාර අවසන් කළයුතු**
**නිමා කළයුතු**
**දුරු කළයුතු ධර්මයකි.**
**අප්‍රමාදීව එය සිදු කරව්!**

යො ච බුද්ධඤ්ච ධම්මඤ්ච, සඞ්ඝඤ්ච සරණං ගතො
චත්තාරි අරියසච්චානි, සම්මප්පඤ්ඤාය පස්සති

දුක්ඛං දුක්ඛසමුප්පාදං, දුක්ඛස්ස ච අතික්කමං
අරියං අට්ඨඞ්ගිකං මග්ගං, දුක්ඛූපසමගාමිනං

එතං ඛො සරණං ඛෙමං, එතං සරණමුත්තමං
එතං සරණමාගම්ම, සබ්බදුක්ඛා පමුච්චති

යමෙක් බුද්ධ, ධම්ම, සංඝ තෙරුවන් සරණ ගියේද, චතුරාර්ය සත්‍යයන් මනාකොට ප්‍රඥාවෙන් දක්නේ වේද,

දුක්ඛ ආර්ය සත්‍යයද, සමුදය ආර්ය සත්‍යයද, ඒ දුක්ඛයාගේ හික්මීමට කාරණ වූ නිරෝධ ආර්ය සත්‍යයද, දුක්ඛ නිරෝධයට පමුණුවන්නාවූ ආර්ය අෂ්ඨාංගික සංඛ්‍යාත නිරෝධ මාර්ග ආර්ය සත්‍යයද මනාකොට නුවණැසින් දක්නේවේද,

මේ සරණය ක්ෂෙමය. මේ සරණය උතුම්ය.
මේ සරණයට පැමිණ සියලු සංසාර දුක්ඛයෙන්
සත්ව තෙම මිදෙන්නේ ය.

## චිරං තිට්ඨතු ලොකස්මිං
## සම්මා සම්බුද්ධ සාසනං!

## උතුම් වූ සම්මා සම්බුද්ධ සාසනය
## චිරාත් කාලයක් ලොව පවතීවා!

**සාධු! සාධු! සාධු!**